මා පිය ගුණ සමර

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

වුද්ධිකාරෝ අලිංගිත්වා - චුම්බිත්වා පිය පුත්තකං
රාජ මජ්ඣං සුපතිට්ඨං - පීතු පාදං නමා මහං

✸ ✸ ✸

I worship the feet of my father - who kissed & cuddled me

and placed me among kings - with my welfare at heart.

✸ ✸ ✸

මාගේ යහපතම හදේ රුවාගෙන,
මා පෝෂණය කරමින් පිය සෙනෙහසින් සිප
වැළඳගනිමින් මා ඇති දැඩි කර,
ශ්‍රේෂ්ඨ පුද්ගලයින් අතර මා තැබුවා වූ
පියාණෙනි !
මම ඔබගේ දෙපා නමදිමි.

✸

"රූපං ජීරති මච්චානං .. .. නාම ගොත්තන් නජීරතී."

(මරණයෙන් පසු රූව දිරා ගියද, ශ්‍රී නාමය සමාජයේ සදාකාලිකව පවතී.)

(මෙම පොත නොමිලයේ බෙදා දීම පිණිසයි.)

පිදුම

මා, ගුරු මාතාවක් ලෙසින් තිස් හතර වසරක් සේවය කරමින් සිටියදී, සමාජය තුලින් සාරධර්ම පිරිහී යන ආකාරය පිළිබඳව සෑහෙන අත් දැකීම් ලැබුවෙමි. බොහෝ ගැටළු වලට මූලික වී ඇත්තේ පංච ශීලයෙන් ඈත් වූ ජීවන රටාවක්ම බව බොහෝ විට පැහැදිලිය.

එක් සිල් පදයක් හෝ ප්‍රතිපත්ති ගරුකව අඛණ්ඩව රැක ගැනීමට හැකි පුද්ගලයෝ අද සමාජයේ ඉතා විරලය. එබැවින් පංච ශීල ප්‍රතිපත්තීන්, තම ජීවිතයට ආරෝපණය කරගනිමින් සාර්ථක දිවි මගක පිය නැගූ මාගේ දයාබර පියාණන්ගේ අභාවයෙන් පසු , එතුමාගේ ශ්‍රේෂ්ඨ පැවැත්ම අඳුරේ තිබෙන්නට හැරීම යුතු නැතැයි මට හැඟිණි.

අද එම චරිතාපදානය තුලින් ඵල ලැබීමට බැරි තරමට සමාජය දූෂිත වී ඇති නමුත් ආදරණීය පියවරුනට සහ යහගුණ කැමති සැමට මෙම ග්‍රන්ථය තිළිණ කිරීම කාලෝචිත උත්සාහයක් සේ මම දකිමි.

අපගේ සත්ගුණවත් ආදරණීය පියාණන්ට
මාගේ මෙම වෑයම
පුෂ්පෝපහාරයක්ම වේවා !!!

(කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක)

පෙරවදන

සමාජගත පුද්ගලයා මනුෂ්‍යත්වය අපරාජිතව පවත්වාගැනීම සඳහා බුද්ධිමත් වුත්, ඍජු වුත් ප්‍රතිපත්තීන් හමුවේ නොසැළී සිටිය යුතුයි. ඒ බව ජීවිත කාලය පුරාම ක්‍රියාවෙන් ඔප්පු කර පෙන්වූ ශ්‍රේෂ්ඨ ගුරු පියෙකුගේ චරිතාපදානය එළි දැක්වීම, මුළු මහත් සමාජයටම ආදර්ශයකි. සාධුකාරක චර්යාවෙහි නිරත ශ්‍රේෂ්ඨ පුද්ගලයින්ගේ ආදර්ශමත් ජීවිත හඳුනාගැනීම සහ හඳුන්වා දීම මාහැඟි සමාජ සංග්‍රහයකි.

කෙනෙකුගේ පිරිසිදු කම හා අපිරිසිදු කම රඳා පවත්නේ තමා තුළමය. අයෙකුට තවත් අයෙක් පිරිසිදු හෝ අපිරිසිදු කළ නොහැක (ධම්ම පදය 165). පුද්ගල හෝ කණ්ඩායම් බලපෑමට යටත් වන්නේ නැතිව තම තමන්ගේ මනස මෙහෙයවා හොඳ නරක බලා ඒ අනුව තීරණ ගෙන හැසිරිය යුතුයි. එලෙසින් සෑම කෙනෙක්ම තම අභ්‍යන්තර මනස පිරිසිදු කරගනිමින් යහපත් ආකල්ප හා ක්‍රියාවන් හැඩගස්වා ගැනීම එම පුද්ගලයාට මෙන්ම සිය පවුල් ඒකකයටත්, පොදු මහත් සමාජයටත් ඉතා වැදගත් වන්නේමය.

එය ප්‍රායෝගික බවත්, සාර ධර්ම වලින් පිරිහී ගිය සමාජයක ජීවත් වන තනි පුද්ගලයෙකුට වුවද, යහපත් සමාජයක් බිහි කිරීමට මාහැඟි දායකත්වයක් ලබා දිය හැකි බවත්, මෙම පොත පරිශීලනය කරන සැමට අවබෝධ වනු ඇත. ලබන්නා වූ යථාවබෝධය සමාජගත සියළුම පියවරුන්ට, ගුරු දෙගුරුන්ට සහ හැදෙන වැඩෙන දරු දැරියන්ට ආදර්ශයක්ම වේවා!

මේ කෙරෙන් උපදින හැම කුසල් සිතුවිලි
ඔබ අප සියළු දෙනාටම
දිවි මගෙහි යහගුණ පිණිස හේතු වේවා ! වාසනා වේවා !

හැඳින්වීම

ගුණබර පියාණන් වහන්සේ නමක් පිළිබඳව, දයාබර දියණියක් විසින් කරන 'ගුණානුස්මරණයක්' ලෙස සීතා නන්දනී ගුණතිලක මහත්මිය විසින් රචිත " මා පිය ගුණ සමර" නම් වූ ; විශ්‍රාමලත් විදුහල්පති අභාවප්‍රාප්ත කිරිවත්තුඩුවගේ විජයසේන මැතිතුමාගේ, චරිතාපදානය නම් කල හැකිය. මෙම කෘතිය මගින් විදහා දැක්වෙන්නේ පියාණන් කෙනෙකුගේ පීතෘත්වයේ ශ්‍රේෂ්ඨ ගුණයන්ය. ගුණබර ස්වාමි පුත්‍රයෙකුගේ සෙනෙහෙබර ලක්ෂණයන්ය. ප්‍රවීණ විදුහල්පතිවරයෙකුගේ දක්ෂතා හා නායකත්වයේ ගති ලක්ෂණයන්ය. උතුම් මනුෂ්‍යයෙකුගේ ශ්‍රේෂ්ඨ මානුෂික ගුණාංගයේය.

කරුණාබර අම්මා කෙනෙකු මෙන්ම, ගුණබර පියාණන් කෙනෙකුගේ ද හදවතෙහි ඇති දාරක ප්‍රේමය අති මහත්ය. සුදොවුන් මහ රජතුමා තම පුතණුවන් වූ සිදුහත් කුමරුන්ට මහත් සේ ඇළුම් කළේය. සිදුහත් කුමරු ගිහිගෙය අතහැර ගොස් පැවිදි විය. සාඅවුරුද්දක කාලයකින් පසු බුද්ධත්වයට පත්විය. පළමුවන වරට තම උපන් නගරය වූ කිඹුල්වත් පුරයට වැඩි ගමනේදී, සිදුහත් කුමරුගේ පුත් රාහුල කුමරුද පැවිදි විය. සුදොවුන් රජතුමාට තම මුණුබුරා ද අහිමි වීමෙන් සෝකය දරාගත නොහැකිව බුදුරදුන් හමුවට ගොස් මෙසේ පැවසීය.

" පුත්ත පේමං භන්තෙ ඡවිං ඡින්දති, ඡවිං ඡෙත්වා චම්මං ඡින්දති, චම්මං ඡෙත්වා මංසං ඡින්දති, මංසං ඡෙත්වා නහරුං ඡින්දති, නහරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති, අට්ඨිං ඡෙත්වා අට්ඨි මිඤ්ජං ඡින්දති, (මහාවග්ග)" 'ස්වාමිනි, දාරක ප්‍රේමය වනාහි සිවියත්, සමත්, මසත්, නහරත්, ඇටත් සිදුරු කරගෙන ගොස්, එයින් නොනැවතී ඇට මිදුළු වල හැපී පවතින්නකි." ගුණබර පියාණන් කෙනෙකුගේ ඇති දරු සෙනෙහස මෙයින් මනාව ප්‍රකටය.

සීතා නන්දනී ගුණතිලක මහත්මිය දයාබර දියණියක් ලෙස තම පියාණන් කෙරේ ද පැවති එම හැබෑ දාරක ප්‍රේමය මැනවින් හඳුනාගෙන ඇත. පාඨකයින්ගේ සිත්හි ද එම මව් පිය - දරු සෙනෙහස වඩ වඩාත් ප්‍රගුණ වීමට මෙම කෘතිය හේතු වනු ඇත. ඔවුනොවුන්ගේ හැබෑ ගුණ හඳුණා ගන්නේ දෙමාපියෝ හා දරුවෝමය. කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මහත්මිය විසින් කුඩා කළ පටන් තම දෙනෙතින් පමණක් නොව සිතින් හා හදවතින් හඳුනාගත් දයාබර පියාණන්ගේ අපරිමිත ගුණ මැනවින් පෙළ ගස්වන්නේ මව්-පිය උපස්ථානය හැබෑවටම අත්දැකීමෙන් ම හඳුනාගෙනය.

" සුඛා මත්තෙය්‍යතා ලෝකේ - අථෝ පෙත්තෙය්‍යතා සුඛා" (ධම්මපදය)
(මව්ට හා පියාට කරන උපස්ථානය වනාහි ලොව ඇති උතුම්ම සුවයකි)

බත්තරමුල්ල, පන්නිපිටිය පාරේ, සිරි සුදස්සනාරාමාධිපති
පූජණීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ විසිනි.

මේ පොත ගැන මගේ අදහස් .. .. ..

"දරුවා පියාගේ සෙවනැල්ල ය" යනුවෙන් ඇරිස්ටෝටල් පඬිවරයා ප්‍රකාශ කර ඇත.

අද බොහෝ දරුවනට තම පියා ගැන සාඩම්බරයෙන් කථා කල හැකි සාරධර්ම ඔවුන් සතුව නැත. ජීවිතය තුල සදාචාරමය චර්යාවක් සදාතනිකවම පවත්වාගත් ශ්‍රේෂ්ඨ චරිත සොයාගැනීම ඉතා අසීරුය. එහෙත් එවන් ශ්‍රේෂ්ඨ පියෙකු ගේ අවවාද සහ ආදර්ශ, එදිනෙදා ජීවිතයට බලපෑ ආකාරය, උදාහරණ සමගින් ඉදිරිපත් කරමින් යහපත් සමාජයක් සඳහා පුද්ගල දායකත්වය සාර්ථක ලෙස බල පා ඇති ආකාරය.. .. "මා පිය ගුණ සමර" තුළින් එළි දැක්වේ. මෙය අර්ථවත් ජීවිතයක් ගත කරනු කැමති සැමට ආලෝක ධාරවක් වනු නොඅනුමානය.

ප්‍රතිපත්ති ගරුක බව, නිහතමානීත්වය, මිත්‍රශීලිත්වය සහ පරෝපකාරය යන උත්තරීතර මානුෂික ගුණාංග ගැබ්ව තිබූ දුර්ලභ ගණයේ චරිතයන් ලියා තැබිය යුතුය. එම වැදගත් කර්තව්‍යය සඳහා දාරක මව් - පිය ස්නේහය ලැබූ දියණියක් තම ආදරණීය පියාණන්ගේ ජීවිත වෘතාන්තය තුළ ගැබ්ව තිබූ, සමාජ ප්‍රගමනයට මහත් සේ ඉවහල් වන සත්‍ය කරුණු රැසක් එළි දැක්වීමට ගත්තා වූ ප්‍රයත්නය ඉතා ශ්‍රේෂ්ඨ වෑයමකි.

ජීවිතකාලය පුරාම විසිරී යමින්, දසත ජීවන සුවඳ හැමුවා වූ එම මල් කැකුළු සියල්ල ඒකරාශී කොට මල් දමක් ගොතමින්, වත්මන් සමාජයට ඉතා වැදගත් වූ ආදර්ශ හුවා දක්වමින්, **විජයසේන කිරිවත්තුඩුව** චරිතාපදානය මෙසේ එළි දැක්වීම ඉතා කාලෝචිත වූ ශ්‍රේෂ්ඨ ධර්ම දානයකි.

එස්.එම්.ඒ.ජේ.ඒ .මායාදුන්නේ
විශ්‍රාමලත් විදුහල්පති,
ඩී.එස්.සේනානායක විද්‍යාලය,
කොළඹ - 7

කර්තෘගෙන්

අප ආදරණීය පියාණන්ට උපහාරයක්ම පිණිස රචිත "මා පිය ගුණ සමර" දිගු කලක සිට මාගේ සිත තුළ වූ අදහසක් මල් එල ගැන්වීමකි. කොළඹ ඩී.එස්. සේනානායක විදුහලේ අප හා එකම ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් සිටි අති පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික හිමිපාණන්, මීට වසර ගණනාවකට පෙර පියවරුන් පිළිබඳව පොත් රචනා කිරීම කාලෝචිත බව පෙන්වා දුනි. ඒ සඳහා මා විසින් උත්සාහයක් ගන්නේ නම් ඉතා අගනා බව ප්‍රකාශ කල දින පටන් ඒ අදහස මසිත තුල තදින්ම බලපාන්නට විය.

එහෙත් එදා මෙදා සමාජයේ, පොදුවේ සමස්ථයක් වශයෙන් පියවරු දෙස බලද්දී, කරුණු සත්‍ය වශයෙන් එළිදැක්විය හැකි ආකාරයේ ආදර්ශමත් පීතෘ චරිතයක් දක්නට නොලැබිණි. පංචශීල ප්‍රතිපත්තීන්ට අනුකූලව දිවි මග ගෙන යන්නකු සොය ගැනීම ඉතා අසීරු කරුණක් විය.එහෙත් කවදා හෝ දුර්ලභ ගණයේ එවන් චරිතයක් වටා ගෙතුණ සත්‍ය කරුණු එක් රැස් කොට ග්‍රන්ථයක් රචනා කොට එළි දැක්වීමට මා අදිටන් කර ගතිමි.

පවත්නා සමාජ ක්‍රමය තුල ඇති කාර්ය බහුලත්වයත් ,විශ්‍රාම ගැනීමෙන් අනතුරුව උරදෙමින් සිටින ජාත්‍යන්තර සමාජ මෙහෙවරත් හමුවේ ,'කාලය' අභියෝගයක් වුයෙන්, මගේ අදහස ක්‍රියාවට නැංවීම දිනෙන් දින ප්‍රමාද වන්නට විය.කෙසේ වුවද දෛවය විසින් 2005 වසර අවසානයේදී මට මෙම සත් කාර්යය සඳහා අවස්ථාව ලබා දුණි. නිවස තුළදීම හදිසියේ ලිස්සා වැටීමක් නිසා පාදයක සිදු වූ සුළු ආබාධිත තත්වයක් මත,වෛද්‍ය උපදෙස් අනුව මාස දෙකක් එක් තැන්ව සිටීමට සිදුවු අවස්ථාවේදී , මා ඉතා අධිෂ්ඨාන පූර්වකව පන්හිඳ අතට ගතිමි.

පැවතුනා වු අභියෝගය ජය ගත් මා, මීට වසරකට පෙර අභාවප්‍රාප්ත වූ මාගේ පියාණන්ගේ ශ්‍රේෂ්ඨ චරිතය ග්‍රන්ථාරූඪ කර යහගුණ කැමති සමාජයකට තිළිණ කිරීමට ඉටා ගතිමි. එය කාලෝචිත බව පෙනී ගියෙන්, මාගේ එම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මම මූලික පියවර තැබුවෙමි.

අද මෙම ග්‍රන්ථය ඔබ අතට පත් වනු යේ එහි සාර්ථක ප්‍රථිඵලයක් ලෙසිනි.

- කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක -

කෘතඥතාවය

වත්මන් සමාජයේ පියවරුන් පිළිබඳව ලියැවෙන පොත් ඉතා විරල බව පෙන්වා දෙමින් කලක සිට මෙවැනි කෘතියක් එළි දැක්වීමට මා පෙළඹු වූ බත්තරමුල්ල සිරි සුදස්සනාරාමාධිපති, කැනඩාවේ වැංකුවර්හි බෞද්ධ විහාරවාසීව සිටි, ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමේ ගෞරවණීය අනුශාසක අති පූජණීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන්ද්‍රයාණන් වහන්සේට ප්‍රථමයෙන්ම මාගේ නමස්කාර පූර්වක කෘතඥතාවය පුදකරමි.

මෙම චරිතාපදානය එළි දැක්වීමට අදහස් කළ බව දැනගත් මොහොතේ, ඒ පිළිබඳව සතුට ළල කරමින්, මෙවැනි පොතක වැදගත් කම පිළිබඳව තම අදහස් අවංකවම ප්‍රකාශ කළ සමකාලීන විදුහල්පතිවරයෙකු වූ, කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ හිටපු විදුහල්පති එස්.එම්.ඒ.ජේ.ඒ මායාදුන්නේ මැතිතුමාට සහ මෙම ග්‍රන්ථයේ පසු පිට සකස් කරමින් විද්‍යුත් තාක්ෂණය ඔස්සේ ක්ෂණිකව මා වෙත එය ලබා දීමට කටයුතු කල ආගමික කටයුතු අමාත්‍යංශයේ ලේකම් බී. එන්. ජිනසේන මැතිතුමාට ද මගේ ගෞරවණීය ස්තූතිය පිරි නමමි.

මෙම ග්‍රන්ථයේ පිට කවරය ඉතා තාත්වික මෙන්ම අලංකර ලෙස සකස් කර දුන් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පී ප්‍රියන්ත මිරිහගල්ල මහතාට ත්, අප පියාණන්ගේ අභාවයෙන් පසු වසරක් ගතවන මේ මොහොතේ මෙම ග්‍රන්ථය ඉතා අලංකාර අන්දමින් මුද්‍රණය කරවා ඔබ අතට පත් කිරීමට මා ගත් උත්සහයේ නියම ඵල ලබා දීමට මහත් වෙහෙසක් ගත් හර්ෂණ ප්‍රින්ටර්ස්හි අධිපති සුදත් වීරසිංහ මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මගේ කෘතවේදී තාවය ඉතසිතින් පුද කරමි.

මෙම චරිතාපදානය ග්‍රන්ථාරූඪ කිරීමේදී, අවශ්‍ය වූ ඡායාරූප සොයාගැනීමටත්, ඇතැම් කරුණු පැහැදිලි කර ගැනීමටත් සහාය දුන් හේමාංගනී, නිර්මලී සහ එස්.ජයකොඩි ඇතුළු සදාති සහෝදර සහෝදරියන්ටත් මාගේ ස්තූතිය පිරි නැමෙන අතර, අපගේ ජීවිත හා සම්බන්ධ වූ අද ජීවතුන් අතර ඇති නැති සියළු සදාති මිත්‍රාදීන් සහ මගේ දයාබර ගුරු දෙගුරුන්ද ස්තූති පූර්වකව සිහිපත් කරමි.

මෙම පොත රචනා කිරීමට ආරම්භ කල මොහොතේ සිට,ඒ සඳහා ප්‍රමාණවත් නිදහසක් මා වෙත ලබා දෙමින් දෛනික ගෘහමය කටයුතු මනාසේ කළමනාකරණය කර මින්, මෙම ග්‍රන්ථය පාඨක ඔබ අතට පත් කරන තුරුම මා වෙත අනුපමේය සහායක් දැක්වූ මගේ ආදරණීය ස්වාමිපුරුෂයා වූ නිමල් ගුණතිලක මහතාටත්, අප පුතණුවන් දෙදෙනාටත් මගේ හෘදයාංගම ස්තූතිය පිරි නමමි.

යහගුණ කැමති පාඨක ඔබ සැමට ද මගේ අවංක ස්තූතිය පිරි නමනු කැමැත්තෙමි.

මෙයට,
දහම් ලැදි,
කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක
දුර කථන අංකය-2877950

පටුන

		පිටුව
1	මෙළොව එළිය දකිමින්	01
2	අධ්‍යාපනයට නැඹුරුව	03
3	ජීවිතයේ නව පරිච්ඡේදයක් කරා..	06
4	උත්තරීතර පීතෘත්වය	09
5	ආදර්ශමත් ගුරු පියෙකු ලෙසින්	14
6	ආධ්‍යාත්මික ජීවිතයකට බරව	25
7	ධර්මානුකූල දිවි පෙවතක්	35
8	පවුලේ කදාතීන් මෙලොවින් සමුගනිද්දී..	46
9	දෛනික ගෘහමය ජීවිතය	51
10	ජීවිතයේ සැඳෑසමය	58



දිවංගත විශ්‍රාමලත් විදුහල්පති සාමවිනිසුරු විජේසේන කිරිවත්තුඩුව මැතිතුමා

1

මෙලොව එළිය දකිමින්

එදා ඉතාමත් නොදියුණු ගම්මානයක් වූ කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ පළන්නොරුව නමැති ග්‍රාමයේ දී 1898 උපත ලැබූ දෝන මේරි එලිසබත් කල්‍යාණවතී ලියනගේ යන ගුරු මැණියන්ගේත්, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටිකෝරළයේ උඩුගහ පත්තුවේ කිරිවත්තුඩුව නමැති ග්‍රාමයේදී 1892 දී උපත ලද, වෘත්තියෙන් කොළඹ විදුලි බල මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු වූ කිරිවත්තුඩුවගේ දොන් එළාරිස් අප්පුහාමි යන අයගේත් වැඩිමහල් පුතු ලෙස 1919 වප් මස 13 දින පළන්නොරුවේදී අප ආදරණීය පියාණෝ විජයසේන කිරිවත්තුඩුව නමින් මෙලොව එළිය දක්නා ලදී.

පිය මැණියන් තම කුළුදුල් දරුවා සමගින් නෙබෝ දිනකින් පදිංචිය සඳහා කිරිවත්තුඩුවේ කිතුලවිල පාරේ පිහිටි "විජය නිවස" බලා පැමිණ ඇති අතර එතැන් සිට ළදරු බාල සහ තරුණ අවධියන් ඉතා සතුටින් එහි ගතකර ඇත. ගැමි පරිසරයක ඖෂධීය සහ එළදායී තුරු ලතාවන්ගෙන් සමන්විත වූ සුන්දර කඳුගැටයක් මත දිගු කාලීන පැවත්මකට ඔරොත්තු දෙන පරිදි ගෙඩනගා තිබූ එම "විජය නිවස" මුළු ප්‍රදේශයටම මහත් අලෝකයක් ගෙන දුනි. කඳු ගැටය පාමුල ගෙය ඉදිරිපසින් ම කරත්ත ගමනා ගමනය සඳහා වූ මාවත අද ද කිතුලවිල පාර යනුවෙන් තරමක් නවීකරණය වී පවතිනු දැකිය හැකිය. එම පාරෙන් මඳක් ඔබ්බෙහි පිහිටි රමණීය වෙල්යාය නිවසේ සුන්දරත්වය දෙගුණ තෙගුණ කිරීමට සමත් වී ඇත. වෙල් යාය දෙසින් හමන්නා වූ සිසිල් සුළඟ එහි නිවැසියන් ගේ හදවත් වලටද මහත් සිසිලක් වී ඇති බව ඉඳුරාම කිව හැකිය. පාරේ සිට නිවස දක්වා ශක්තිමත් ලෙස ගෙඩනගන ලද මනහර පියගැට පෙළක් ද විය.කාලය සමග සුළු සුළු වෙනස් වීම්

වලට භාජනය වී ඇති නමුත්, වර්තමානයේ පවා මෙම නිවස තුල සිය මයිලණුවන්ගේ පවුලේ සාමාජිකයින් ජීවත් වනු දැකිය හැකියි..

පළතුරු ගස් වලට නගිමින් නැවුම් පළතුරු වල රස විඳිමින්, විටෙක රණ්ඩු දබර කරගනිමින් සිය නැගණියන් දෙදෙන සහ මල්ලී සමග කෙළි දෙළෙන් ගත කළ ජීවිතයේ සුන්දරත්වය අප සමග පවසා ඇත්තේ ඇතැම් අවස්ථා වලදී සිය පියාගෙන් ලැබුණා වූ දඬුවම් ද සිහිපත් කරමිනි. දිනක් සිය වැඩිමහල් නැගණිය සමග ගස් ලබු කැබැල්ලකට රණ්ඩු වීමෙන් අනතුරුව, නැගණිය ගස් ලබු ගහකට නගිනවා දුටු සිය පියාණෝ, කෝටුවක් ගෙන දෙදෙනාටම දඬුවම් කොට, නැවත කිසි දිනක එවැනි රණ්ඩු දබර ඇති කර නොගන්නා ලෙස අවවාද කරමින් හොඳට පැහී ඉදී තිබුණු විශාල ගස් ලබු ගෙඩි 2 ක් ගෙන ඒ මොහොතේම පියාණන් ඉදිරියේම, ගෙඩිය බැගින් දෙදෙනාටම කෑමට සැලැස් වූ බවත්, ඉන් අනතුරුව කිසි දිනක නැගණියන් සමග එලෙසින් රණ්ඩු නොවූ බවත් අප සමග පවසා ඇත්තේ සිය ජීවිතය තුළින් ලද අත් දැකීම් රස විඳිමින් විනා දඬුවම් කල පියාණන් කෙරෙහි සුළු හෝ වෛරයකින් නම් නොවේ.

විජයසේන කිරිවත්තුඩුව මහතා සිය ජීවිතයේ ළමා අදියර ගත කළ කිරිවත්තුඩුවේ කිතුලවිල පාරේ පිහිටි 'විජය නිවස'

2

අධ්‍යාපනයට නැඹුරුව .. ..

දයා,අමරා සහ ජයතිස්ස නමැති බාල සහෝදර සහෝදරියන් සමඟින් කෙළිදෙළින් ළදරු විය ගත කළ ඔහු සිය මෑණියන් සමඟින් පාසල් යාම අරඹා ඇත්තේ නිසි වයස එළඹීමටත් පෙරය. මුල සිටම පොත් පත් කෙරෙහි විශාල රුචිකත්වයක් සහ ගෞරවයක් දක්වමින් පාඩම් පොතක් අතට ගැනීමේ දී සහ එය නැවත තැබීමේ දී පොතට වැඳීමේ සිරිතක්ද ඔහු සතුව තිබී ඇත.එදා, කිරිවත්තුඩුව කණිටු විදුහල යනුවෙන් හැඳින් වු එම පාසැලේ විදුහල්පතිනිය ලෙස කටයුතු කළ සිය මෑණියන් සමඟින්, එවකට තිබු අග්‍ර ගණයේ වාහනය වු බක්කි කරත්තයෙන් පාසැල වෙත ගමන් කළ ආකාරය ඔහු අප සමඟ ප්‍රකාශ කළේ සිය ලා බාල අවධිය ඉතා සතුටින් සිහිපත් කරමිනි.

නිවසේ සිට සැතපුම් හතරක් පමණ ඔබ්බෙහි පිහිටි එම පාසල වෙත සිය මෑණියන් සමඟ බක්කි කරත්තයේ ගමන් කරන විට, කරත්තයේ බැඳි ගවයාගේ ගෙජ්ජි හඬ ඇසෙන විටම පාර දෙපස සිටින ගැමි ජනතාව හිස බැඳි ජටාව (විශාල ලේන්සුව) ගලවා අතට ගනිමින්, සරමේ කැසපට ගලවා පහතට දමමින් ආචාරශීලී ලෙස හිස පහත් කරමින් ගුරු දේවයාණන්ට ගෞරව දැක්වු ආකාරය අප සමඟ ප්‍රකාශ කළේ ගුරුවරයාට එදා සමාජයේ තිබු පිළිගැනීම විදහා දක්වමිනි. එකල විදුහල්පතිනිය 'ගුරුන්නාන්සේ' යන නමින් අමතනු ලැබු බවත් තමා ගුරුන්නාන්සේගේ පුත්‍ර රත්නය වීම නිසා පාසැල තුළදී සැමගේ විශේෂ අවධානය යොමු වු බවත්, කාගේත් ආදරය නොඅඩුව ලද බවත්, ඒ නිසාම පාසැල් අධ්‍යාපනය ට විශේෂ රුචිකත්වයක් ඇති වු බවත් අප සමඟ පවසා ඇත්තේ, එම අඩිතාලම දැමු සිය ආදරණීය මෑණියන්ද කෘතවේදීව සිහිපත් කරමිනි.

අනතුරුව ද්විතික අධ්‍යාපනය සඳහා කිරිවත්තුඩුව විජයවර්ධන මහ විදුහලට ඇතුළු වූ අප පියාණන්ගේ ප්‍රියතම විෂය බවට පත්ව ඇත්තේ ගණිතයයි. අධ්‍යාපන ක්ෂේත්‍රය තුල දීප්තිමත් ශිෂ්‍යයෙකු ලෙස කැපී පෙණුන ඔහු එවකට තිබූ "Junior School Certificate Examination" සහ "Senior School Certificate Examination" යන විභාගයන්ගෙන් පාසලේ උසස්ම ප්‍රතිඵල ලබා ගත්තේය. උපතින්ම ගෙන ආ සිය චතුර කථිකත්වයත්, අදහස් පැහැදිලි ලෙස වාචිකව මෙන්ම ලිඛිතව ඉදිරිපත් කිරීමට ඇති හැකියාවත්, කිසි වෙකුටත් නොදෙවනි වන සේ ශෝභමාන ලෙසට සිංහල සහ ඉංග්‍රීසි අත් අකුරු ලිවීමේ නිපුණත්වයත්, කාර්ය ශුරත්වයත්, ඔහු විසින් ලබාගත්තා වූ විභාග ප්‍රථිඵල වඩාත් ඔප් නැංවීමට හේතු වුයෙන්, එම පාසැලේම මොනිටර් තනතුරකින් ඔහු පිදුම් ලැබුවේය.

එදා මොනිටර් තනතුරට විශේෂ ගෞරවයක් හිමිවූ අතර, දක්ෂතාවයන් මත ප්‍රදානය කරණු ලබන එකී තනතුර තාවකාලික ගුරු පත්වීමක් විනා, වර්තමාන පාසැල් වල පන්ති නායකයන්ගේ කාර්යභාරය වැනි වැඩ කොටසකට උර දීමක් නොවිණි. ඉතා අවංකව නීති ගරුකව පාසැල් පාලනය ගෙනගිය, ජෝන් මහත්මයා යනුවෙන් විරුදාවලි ලත් එහි විදුහල්පතිතුමාගේ සිත් දිනා ගැනීමෙන් අනතුරුව, පාසැලේ ලිපි ලේඛණ කටයුතු පවත්වාගෙන යාමේදී, ඒ සියල්ලක් සිංහල ඉංග්‍රීසි ද්වි භාෂා වන්ගෙන් ක්‍රමානුකූලව සකස් කර දීම සඳහා, අප පියාණන් වෙත පැකිලීමකින් තොරව ඔහු භාර දී ඇත. පාසලේ කාල සටහන් දැන්වීම් ආදිය පමණක් නොව පාසලේ නාම පුවරුව පවා එදා සකස් වුයේ අප පියාණන් අතිනි. සෘජුව වාඩි වී සෘජුව පෑන අල්ලන ඔහු මේසය මත තබා ගත් කඩදාසියක ඔනෑම ප්‍රමාණයක අත් අකුරු, එදා වෙළඳ පොළේ තිබූ ඉන්දියන් තීන්තෙන් (Indian Ink) ලියූ කළ, එවා මුද්‍රිත අකුරු නොවේ යැ යි කිසිවකුටත් කිව නොහැකි තරමට ක්‍රමවත් බවකින් යුක්ත විය. ලැබුණා වූ මොනිටර් තනතුරේ ගෞරවය ද ආරක්ෂා කර ගනිමින් එතුලින් ලැබුවා වූ පන්නරය තම ගුරු ජීවිතයට මහත් සේ ඉවහල් වූ බව, ඔහු අප සමග පැවසුවේ අත්දැකීම් හමුවේ ලබන්නා වූ දැනුම කොතරම් එලදායී ද යන්න එත්තු ගන්වමිනි.

එම වකවානුව තුලදීම, ගම් ප්‍රදේශයේ පිහිටි නොතාරිස් කර්යාලයේ ලිපිලේඛණ කටයුතු සඳහා ද නොතාරිස් රාළහාමිගෙන් ලද ආරාධනයක් මත එහි ද සේවය කරමින් අවසානයේදී, රජයෙන් පවත්වනු ලබන නොතාරිස් විභාගයට පෙනී සිට එයද සමත් වී ඇති නමුත් ගුරු වෘත්තිය තුලින් දහස් සංඛ්‍යාත සිසු පිරිසකගේ නෙත් පෑදීමට ඇති අවස්ථාව අගය කරමින් තමා ගුරු වෘත්තියට පිවිසීමට තීරණය කල බව අපට හෙළි කලේ තීරණයක් ගත යුත්තේ වැඩි ඵලදායී තාවයක් ලැබිය හැකි ආකාරයකට බව විදහා දක්වමිනි.

තමා රජයේ ගුරු සේවයට ඉල්ලුම් කළ අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණයේදී, ද

... . “ආ.. ... .. මේ ... .. ජෝන් මහතාගේ ගෝලයෙක්නෙ ! තව මොනවා බලන්නද? .. අපි විජයසේන මහත්මයා ගැන අහලා තියෙනවා”.. ... ..

... . කියමින් අධ්‍යක්ෂ වරුන් තමා වෙත රජයේ ගුරු පත්වීම ලබා දුන් බව අප සමඟ පැවසුවේ හුදෙක් සිය ආත්ම වර්ණනාවකට නොවන අතර ,තමා වෙත පැවරුණු කාර්යයක් කැපවීමකින් යුතුව, ක්‍රමානුකූලව, කලට වේලාවට ඉටු කල යුත්තේ කෙසේද යන්න අපටද අවබෝධ කරවමිනි. තමාට ලැබුණා වූ කීර්තියේ ගෞරවය මූලික වශයෙන් හිමිවිය යුත්තේ ආදර්ශමත් විදුහල්පතිවරයෙකු වූ විගොඩගේ ජෝන් පෙරේරා මහතාට බවද, ඔහු ඉතා කෘතවේදීව ප්‍රකාශ කළේය.



මොනිටර් තනතුරකට පත් වූ විජයසේන කිරිවත්තුඩුව මහතා (පසු පෙළ දකුණේ සිට තුන් වැන්නා), විදුහල්පති වී.ජෝන් පෙරේරා මහතා සහ කිරිවත්තුඩුව මහ විදුහලේ ආචාර්ය මණ්ඩලය සමඟ 1938 දී ... ..

3

ජීවිතයේ නව පරිච්ඡේදයක් කරා .. ..

තරුණ වයසට එළඹි ඔහු, 1944 පොසොන් මස 01 දින, එනම් වයස අවුරුදු විසි හතරේදී, සිය පළමු වන රජයේ ගුරු පත්වීම ලැබීමට භාග්‍යවන්ත වූහ. රාජකාරි කටයුතු භාර ගැනීම පිණිස කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගෝනිගොඩ විදුහලට යාමට සිදු වී ඇත. සුපුරුදු සුන්දර ගම් ප්‍රදේශයෙන් ඉවත් වීමටත්, සහෝදර සහෝදරියන්ගෙන්, කදාතීන්ගෙන් සහ ඇසුරු කළ හිතවතුන්ගෙන් වෙන්වීමටත් සිදු වී ඇත්තේ මේ අවධියේදීය. විශේෂයෙන්ම තමාට ශ්‍රේෂ්ඨ ගුරුවරයෙකු වශයෙන් ගුරු වෘත්තියට පිවිසීමට නිවැරදි ආභාෂයක් හා ආත්ම ශක්තියක් ඇතිකර ගැනීමට මඟ පෙන්වූ ආදර්ශමත් විදුහල්පති ගුරුපියාණන්ගේ ඇසුරෙන් වෙන්වීම ඔහුට දරා ගැනීමට අපහසු වී ඇත.

මානසික වශයෙන් බලපෑ හුදෙකළා භාවය ජීවිතයේ නව පිටුවකට හේතු වූවා විය හැකියි. වෘත්තීමය වශයෙන් ඉතා සතුටින් කාලය ගෙවී ගිය ද මව් පියන්ගෙන්, සහෝදර සහෝදරියන්ගෙන් හා සුපුරුදු පරිසරයෙන් ඈත්වීම, තම කායික සෞඛ්‍යමය තත්වයේ අසමතුලිත භාවයකට හේතු වූයෙන්, උදා වූ රෝගී තත්වයක් හමුවේ කුරුණෑගල රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගැනීමට ද සිදු වූ බව අප සමඟ පවසා ඇත. කෙසේ වුවද දෛවය විසින් එම අවස්ථාව ජීවිතයේ නව පරිච්ඡේදයකට යොමු කර ඇත. එම ආරෝග්‍ය ශාලාවේ කාරුණික සෞඛ්‍ය සේවිකාවක ලෙසින් ඒ වනවිට රජයේ සේවයට පිවිස සිටි අප මෑණියන් එහිදී මුණගැසී ඇති අතර, තොරතුරු කතා බහ කිරීමේදී දෙදෙනාම කොළඹ දිස්ත්‍රික්කයේ අසල්වැසි ගම් ප්‍රදේශ වල උපන් අය බවත්, අදහස් අන්‍යොන්‍ය වශයෙන් ගැලපෙන බවත් හැඟී ගියෙන්, දෙමාපියන් වෙත සිය අදහස් ප්‍රකාශ කල බවත්, ඔවුන්ගේ කැමත්ත ලැබීමෙන්

අනතුරුව චාරිත්‍රානුකූල විවාහයකට සූදානම් වූ බවත් අප සමඟ ප්‍රකාශ කලේ ජීවිතයේ සෑම අදියරකදීම දෙමාපිය ආශීර්වාදය ලැබීම අත්‍යාවශ්‍යම දෙයක් බව තහවුරු කරවමිනි.

කටයුතු සූදානම් කරගත් පරිදි, හෝමාගම, දීපංගොඩ පදිංචිව සිටි වෙළඳ ව්‍යාපාරිකයෙකු වූ හෙට්ටිආරච්චිගේ විලියම් පෙරේරා සහ ඒදිරිසිංහ ආරච්චිගේ පොඩිනෝනා යන අයගේ ලා බාලම දියණිය වූ ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි (අප ආදරණීය මෑණියන්) සමඟින් 1946 දී මත් වතුරෙන් තොර විවාහ මංගල්‍ය උත්සවයක් පවත්වා විවාහ ගිවිසගත් බව ඔහු අප සමඟ ප්‍රකාශ කොට ඇත. තම විවාහ මංගල්‍ය උත්සවයට මත් වතුර අනවශ්‍ය බව තදින් කියා සිටියදීත්, ඒ සඳහා ගිජු වූ ඇතැම් මාමා වරු විසින් ගෙනවිත් ඇඳක් යට ගෝනියක දමා සඟවා තිබූ බෝතල් සියල්ල හොර රහසේම නිවස ඉදිරිපිට වෙල් යායට වීසි කර, ගෝනිය තිබූ ආකාරයටම පුම්බා ගැටගසා තැබූ ආකාරයත්, මාමාවරු - “කෝ ? ගෝනියේ මුකුත් නැනේ” කියමින් සොයද්දී තමා නිහඬව ආධ්‍යාත්මික සතුටක් ලැබූ බවත්, කීප අවස්ථාවකදීම අප සමඟ ප්‍රකාශ කළේ අනවශ්‍ය දේ කුමන අවස්ථාවකට වුවද අවශ්‍ය නැතිම බව කියා පාමිනි.

විවාහයෙන් පසු ගාල්ල දිස්ත්‍රික්කයට ස්ථාන මාරුවීමක් ලබා බටපොල දෙල්ගහබැද්ද විදුහලට රජය විසින් මාරුකර යවා ඇත්තේ විදුහල්පති තනතුරක්ද ප්‍රදානය කරමිනි. එවකට සෑම වාර අවසානයකදීම පාඨශාල පරීක්ෂක වරුන් පාසැල් වල කාර්ය භාරයන් පරීක්ෂාකිරීම සඳහා පාසැල් වලට පැමිණෙන බවත් එහිදී එක් එක් ගුරුවරයා පිළිබඳව වෙන වෙනම පරීක්ෂණ පවත්වා වාර්ථා තබන බවත්, අනතුරුව ඒ එක් එක් ගුරුවරයාගේ වෘත්තීමය සතුටුදායකත්වය පිළිබඳව තොරතුරු අධ්‍යාපන අමාත්‍යංශය වෙත යැවෙන බවත්, උසස් වීම් දීමේදී එම වාර්ථා සැලකිල්ලට ගනු ලබන බවත්, තමාට විදුහල්පති පදවිය ඉතා ඉක්මනින්ම ලැබුණේ ඉතා සතුටුදායක වූ එම වාර්ථා සහ සිය සුදුසුකම් මතම බවත් අප සමඟ පැවසූ ඔහු, එදා සමාජයේ අල්ලස්, දූෂණ වංචා රජයේ සේවය තුල විරල වූ බවත් අපට පැහැදිලි කර දුන්නේ සත්‍යය සෑම ස්ථානයකම ජයගන්නා බව උදාහරණ සමඟින් එළිදක්වමිනි.

කල්යාමේදී තම බිරිඳගේ ද අධ්‍යාපන සුදුසුකම්, හැකියාවන්, දක්ෂතාවයන් සහ රුචිකත්වයන් පිළිබඳව යථාවබෝධයක් ඇතිකර ගත් ඔහු රජයේ ගුරු තනතුරක් සඳහා ඉල්ලුම් කිරීමට ඇයට ද අවශ්‍ය කටයුතු සකස් කර දී අප මෑණියන්ද රජයේ ගුරු සේවයටම යොමු කරවා ඇත. එකම දෙපාර්තමේන්තුවක් යටතේ සේවය කිරීම රාජකාරි කටයුතු හමුවේ මෙන්ම පෞද්ගලික කටයුතු හමුවේ වුවද වඩාත් පහසුදායක වූ බව ද ස්ථාන මාරුවීම් වලදී එය ඉතා සහනදායී වූ බවද ඔහුගේ අදහස විය.

විජයසේන කිරිවත්තුඩුව මහතා - ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි මහත්මිය සමඟ
1946 දී අතිනත ගත් දා .. .. ..

4

උත්තරීතර පීතෘත්වය .. ..

අවංක, නීති ගරුක රජයේ සේවකයකු ලෙසින් සිය රාජකාරි කටයුතු නොපිරිහෙළා ඉටු කරන්නාසේම ඔහු දයාබර ස්වාමියෙකු හා සෙනෙහෙබර පියකු ලෙසින් තම විවාහ ජීවිතයේ යුතුකම් හමුවේ ද අප්‍රමාදව කටයුතු කරමින් 1948 අග භාගය වන විට ආදරණීය දියණියකගේ ගෞරවණීය පීතෘත්වයට පාත්‍ර වූ හ. 1950 මැද භාගය වනවිට තවත් පුත්‍ර රත්නයක් ලද අතර, අනතුරුව දේශපාලන බලපෑම් මත අනුරාධපුර දිස්ත්‍රික්කයට ස්ථාන මාරුවීමක් ලැබ ඇත. එවකට අති දුෂ්කර ප්‍රදේශයක් වූ, වව්නියාවේ සිට මැදවච්චිය දක්වා වැටී ඇති මාර්ගයේ 104 වන සැතපුම් කණුව ළඟ පෙරියකුලම්හි, එනම් නුගගහවාඩිය නමැති ස්ථානයේ පිහිටි පහළ ගල්කන්දේගම පාසැලේ නියම දින ගොස් වැඩ භාරගත් බවත්, ස්ථාන මාරුවීම් වෙනස් කරවා ගැනීම සඳහා කිසිම නිලධාරියෙකු පසු පස නොගිය බවත් ඔහු අප සමඟ පැවිසුවේ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක ප්‍රදේශවාසීන්ගේ සිත් දිනා ගනිමින් එම ප්‍රදේශයට අවංක සේවයක් කිරීමට තමා සතු හැකියාවන් අත්මාභිමානයෙන් යුතුව සිහිපත් කරමිනි. ධර්මානුකූල ව ජීවත් වන්නන් කොහේ ගියද, පුද ලබන බව ධම්ම පදයේ ප්‍රකීර්ණක වග්ගයේ පෙන්වා දී ඇති බවද සිය මතක ශක්තියෙන් ප්‍රකාශ කළේය.

වර්තමානයේද අති දුෂ්කර ප්‍රදේශයක් ලෙසට හඳුන්වනු ලබන එම පෙදෙසෙහි, එදා බහුල ලෙස පැතිරී ගිය මැලේරියා උණ රෝගයෙන් වරක් දෙකක් විඳිනු ලැබූ පීඩාවන් හැර, වෙනත් කිසිම ගැටළුවක් තමා කරා නොපැමිණි බව ප්‍රකාශ කළ ඔහු, ප්‍රදේශයේ දුෂ්කර භාවය නිසා මුහුණ දීමට සිදු වූ අභියෝග සියල්ල වෙස් වළාගෙන පැමිණි ආශිර්වාද

සේ සලකමින් සාර්ථක ලෙස ජයග්‍රහණය කළ බවත්, 1951 අග භාගය වන විට තවත් වාසනාවන්ත දියණියකගේ සාඩම්බර පීතෘත්වය තමාට උරුම වූ බවත් සිනහමුසු මුහුණින් ප්‍රකාශ කළේය. කුමන අභියෝගයක් ඉදිරියේ වුවද ධර්මයේ හැසිරෙන්නා නිරතුරුවම ධර්මය විසින් ආරක්ෂා කරනු ලබන බව ද, අවංක චේතනාවෙන් කරනු ලබන සියළුම යහපත් ක්‍රියාවන්ගේ නිසි ඵල 'දිට්ඨ ධම්ම වේදනීය' වශයෙන් තමා කරා පැමිණ ඇති බව ද, තවදුරටත් ඔහු ආත්ම විශ්වාසයකින් යුතුව ප්‍රකාශ කළේය.

අනතුරුව රංජනී, සරත් සහ සීතා යන අප තිදෙනාගේ අධ්‍යාපන කටයුතු වලට මුල් තැන දීමේ අරමුණෙන් කොළඹ දිස්ත්‍රික්කයට ස්ථාන මාරුවීමක් ඉල්ලුම් කළ බවත්, වසර ගණනාවක් දුෂ්කර ප්‍රදේශයන්හි අවංකව සේවය කර තිබීම ස්ථාන මාරුවීම සඳහා සැලකිය යුතු සුදුසුකමක් වූ බවත් ප්‍රකාශ කරමින්, යහපත් වූ අරමුණකින් යුතුව යන්නා වූ දුෂ්කර ගමනක අවසානය සතුටුදායක වන බව ද අපට පහදා දුනි.

බලාපෙරෙත්තු වූ පරිද්දෙන්ම, නුගේගොඩ අනුලා විද්‍යාලයේත්, නුගේගොඩ ශාන්ත ජෝන් පිරිමි පාසලේත්, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේත් තම දරු තිදෙනාට අධ්‍යාපන පසුබිම සකස් කර දුන් ඔහු, අධ්‍යාපනයේ සාර්ථකත්වය පිණිස විෂය මාලාවට අමතරව, පාසැලක පවත්නා ක්‍රියාකරකම් වල යෙදීමට ද අපට ප්‍රමාණවත් ශක්තියක් සහ පූර්ණ සහයෝගය ලබා දුණි. විද්‍යාලයීය බෞද්ධ සංගම්, සාහිත්‍ය සංගම් වල තනතුරු හෙබවමින්, විද්‍යාලයීය විවාදක කණ්ඩායම් නියෝජනය කරමින්, ශිෂ්‍ය නායකත්වයන් ද දරමින්, දීප්තිමත් ලෙස පාසැල් යුගය පසු කල අප තිදෙනා ගේ අධ්‍යාපන කටයුතු ද සාර්ථක ලෙස නිමවීම අප පියාණන්ගේ මහත් පැසසුමට ලක්විණි.

මීට වසර තිස් ගණනකට උඩදී තම දරු තිදෙනා රජයේ සේවයට අවතීර්ණ වීම අප පියාණන්ගේ ඉමහත් සතුටට හේතු වූ අතර ඔහු බලාපෙරොත්තු වූ ඉලක්කය ද එයම විය. මගේ සෙහොයුරිය රජයේ ලඝු ලේඛිකාවක් ලෙසද, එකම සෙහොයුරාණන් ගණිත ආචාරය වරයෙකු ලෙසද, මා ඉංග්‍රීසි ආචාර්ය වරියක ලෙසද රැකියා ක්ෂේත්‍රයට පිවිසීම, ඔහු විසින් දීඝ කාලයක් මුළුල්ලේ ගත්තා වූ අප්‍රතිහත උත්සාහයේ සාර්ථක ප්‍රතිඵලයක් විය. අප දෙදෙනෙකුම ගුරු වෘත්තියටම පිවිසීම අප පියාණෝ වඩාත් අගය කළහ.

පීතෘ ස්නේහයෙන් යුතුව සුභ නැකතින් අකුරු කියවා අධ්‍යාපන මාවතේ පිය නැගීමට අවශ්‍ය පසුබිම නිසි ලෙස සකස් කර දෙමින්, රටට සමාජයට සේවයක් කළ හැකි යහපත් ගුණවත් පුරවැසියන් තිදෙනෙකු බිහි කිරීම අප පියාණන්ගේ ශ්‍රේෂ්ඨතම අරමුණ විය.

විජයසේන කිරිවත්තුඩුව මහතා, තම ආදරණීය බිරිඳ සහ දරුවන් තිදෙනා සමගින් 1955 දී.. .. ..

එම අරමුණ සාක්ෂාත් වනතුරුම යෝධ ටැඹක් සේ අප පසුපස සිටි ආකාරය ද නිතැතින්ම මතකයට නැගෙයි. මා අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ ප්‍රතිඵල ලැබූ දිනය ඒ අවස්ථාවන්ගෙන් එකකි. මා විසින් ලැබුවා වූ ප්‍රතිඵල ඉතා සාර්ථක නමුත්, ඉංග්‍රීසි විෂය සඳහා බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලැබීම මට මෙන්ම මගේ පියාගේ විමතියට හේතු විය. ලැබුණා වූ සමාර්ථය පිළිබඳව අපි සෑහීමකට පත් නොවූයෙමු. ශක්තිමත් ස්ථාවරයක් මත ඉතා උසස් ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් එම විෂය සඳහා මා පෙනී සිටිය බවට හෘදය සාක්ෂියට අමතර සාක්ෂි කිසිවක් අවශ්‍ය නොවීය.

වහාම ක්‍රියාත්මක වූ මාගේ පියාණෝ ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා අවශ්‍ය කටයුතු කෙරෙහි අප්‍රමාදව මා යොමු කරවනු ලැබුවේය. සති කීපයක් ගතවිණි. මා එවකට ඉගෙනුම ලැබූ කොළඹ ස්ටැෆර්ඩ් කාන්තා විද්‍යාලය වෙත නැවත සමීක්ෂණය කරන ලද ප්‍රතිඵල වාර්තා ලැබුණ ද, ඒ කිසිවක මගේ විභාග අංකය නොවීය. එවකට එහි විදුහල්පතිනි ලෙස කටයුතු කල සුද්ද ජාතික 'කුක්' මහත්මියගෙන් ඒ පිළිබඳව මා කිහිප විටක විමසූ නමුත් සාර්ථක පිළිතුරක් නොලැබිණි. ලැබී ඇති සියළු ප්‍රතිඵල වල කිසිදු වෙනස් වීමක් නොමැති බවත් ඒ පිළිබඳව බලාපොරොත්තු නොතබා, උසස් ප්‍රතිඵල බලාපොරොත්තු වන්නේ නම් නැවත වරක් ඉංග්‍රීසි විෂය සඳහා සූදානම් වන ලෙසටත් ඇය විසින් මා දැනුවත් කරවන ලදී.

අධිෂ්ඨාන පූර්වකව අති මහත් විශ්වාසයකින් යුතුව සිදු කරනු ලැබූ කාර්යයක, ලැබිය යුතු වූ යහපත් ප්‍රථිඵල ලබා ගැනීම සඳහා නොපසුබටව නිර්භයව ඉදිරියට පා තැබිය යුතු බව අවධාරණය කල මා පියාණෝ, කොළඹ 2 මැලේ වීදියේ පිහිටි විභාග දෙපාර්තමේන්තුව වෙත මා සමඟින් ගොස්, අවශ්‍ය උපදෙස් ලබා දී, විභාග කොමසාරිස් තුමා අභියසට මා යොමු කලහ.

මා විසින් ඉදිරිපත් කරනු ලැබූ කරුණු වලට ඉතාමත් සවාධානව සවන් දුන් එතුමා, මා සමඟින්ම ප්‍රතිඵල ලේඛණාගාරය වෙත ගොස්, මගේ විභාග අංකයට අදාල ලේඛණ සියල්ල පරීක්ෂා කිරීම සඳහා නිලධාරි මහතෙකු යොදවා ටික වේලාවක් රැඳී සිටින ලෙස මට අණ කළේය.

පරිගණක තාක්ෂණ පහසුකම් නොතිබුණ එවන් යුගයක ලකුණු එකතු කිරීම, වාර්තාගත කිරීම, අවසන් ලකුණු ලැයිස්තු සකස් කිරීම ආදිය නිලධාරීන් විසින් බුද්ධිය මෙහෙයවා ශ්‍රමයෙන්ම ඉටු කලයුතුව තිබූ අතර, යම් යම් දෝෂ සිදු වීමට තිබූ ඉඩ කඩ සුළු පටු නොවිණි.

හෝරාවන් දෙකක් පමණ විභාග කොමසාරිස් තුමාගේ කාර්යාලය අසල අපි රැඳී සිටියෙමු. මාගේ කාර්යය සඳහා යොමු කරවනු ලැබූ නිලධාරි මහතා අදාල ලිපි ලේඛණ රැගෙන එහි ඇතුල් විය. අනතුරුව කාර්යාලය තුලට මා කැඳවූ විභාග කොමසාරිස් තුමා, ලකුණු ලැයිස්තු සකස් කිරීමේදී ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති බවත්, මා ඉංග්‍රීසි විෂයයෙන් විශිෂ්ඨ ලෙස සමත් වී ඇති බවත්, නිල වශයෙන් එම ප්‍රථිඵල දින දෙකක් ඇතුළත පාසල වෙත යැවෙන බවත් ප්‍රකාශ කළේය. මගේ පියාණන්ගේ එම අප්‍රතිහත ධෛර්යය සහ ස්ථානෝචිත ප්‍රඥාව නොවන්නට ලැබුණාවූ ප්‍රතිඵලය මත සැනසීමට මට සිදුවනු නොඅනුමානයි.

එක් දහස් නමසිය හැත්තෑ හය වර්ෂයේදී, එවකට රත්නපුර දිස්ත්‍රික්කයේ කරඳන ශ්‍රී ජිනරතන මහ විදුහලේ ඉංග්‍රීසි ආචාර්ය වරියක ලෙස ගුරු වෘත්තියේ යෙදී සිටි මා, වාද්දුව- තල්පිටියේ සාදිරිස් ගුණතිලක දම්පතීන්ගේ පුත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සැලසුම් ශිල්පී නිමල් ගුණතිලක මහතාණන් සමඟ යුග දිවියට පිවිසීමත්,1978 වර්ෂයේදී මහරගම බෞද්ධ කණිෂ්ඨ විද්‍යාලයේ ගණිත ආචාර්ය වරයෙකු වශයෙන් සේවය කල මා සෙහොයුරු සරත්, පන්නිපිටිය - ඇරැව්වල එදිරිසිංහ දම්පතීන්ගේ දියණියක් වු මහජන බැංකුවේ සේවයේ නියුතු චිත්‍රානි එදිරිසිංහ මෙනවිය සමඟ යුග දිවියට පිවිසීමත්,1980 වර්ෂයේදී නාරාහේන්පිට කම්කරු උසාවියේ ලඝු ලේඛිකාවක ලෙස සේවය කල මා සෙහොයුරිය රංජනී, පාදුක්ක - කුරුගල මාටින් වල්පොල දම්පතීන්ගේ කණිටු පුත් රාජ්‍ය මුද්‍රණ නීති ගත සංස්ථාවේ ගිණුම් සහකාර රත්නසේන වල්පොල මහතාණන් සමඟ යුග දිවියට එළඹීමත් අප පියාණන්ගේ ජීවිතයේ සාර්ථක ලෙස ජයග්‍රහණය කල තවත් කඩඉමක් විය.

අප කුඩා කල සිටම අප නිවසේ හැදුණු වැඩුණු තවත් දරුවකු විය. නමින් ලැනට් ද මැල් වු ඔහු, සිය දෙමාපියන් විසින්, අප දෙමාපියන් වෙත හදා වඩා ගැනීම පිණිස භාර දෙනු ලැබු දරුවෙකු වුවද, අනල්ප වු ආදර කරුණාව දක්වමින්, යහගුණ පුරුදු පුහුණු කරවමින් අප දෙමාපියන් තම රැකවරණය යටතේ හදා වඩා අවසානයේදී, ඔහු වෙනුවෙන් ද සියළු යුතුකම් ඉටු කලේය, පදිංචියට නිවසක් සමඟින් දේපල ද පවර දී චාරිත්‍රානුකූල විවාහයක් පවා කරදීමට අප පියාණෝ පුරෝගාමී වුහ. අප පියාණන්ගේ පා මග ගමන් කල ඔහු ද සුරා, සුදු, දුම් වැටි වලින් තොරව සාර්ථක විවාහ ජීවිතයක් ගතකරමින්, දරු සම්පත් ලබමින් ජීවිතාලෝකය ලබා තිබීම අප පියාණන්ගේ මහත් ප්‍රසාදයට හේතු විය.

5

ආදර්ශමත් විදුහල්පති පියතුමෙකු ලෙසින්

අපගේ පියාණන් විසින් අප තිදෙනාටම (අක්කාට, අයියාට සහ මට) ආමන්ත්‍රණය කරනු ලැබුවේ **"පුතා"** යන ආදරබර වදනින්ය. පීතෘත්වයට නියම අරුත ගෙනෙන **"තාත්තා"** යන සෙනෙහෙබර වදන අප මුවගට හුරු විය. කොළඹ ප්‍රදේශයට පැමිණි අප සැම පදිංචි වුයේ, හෝමාගම දීපංගොඩ පිහිටි අප මෑණියන්ගේ මහ ගෙදරය. මාගේ අක්කා සහ අයියා කොළඹ ප්‍රදේශයේ උසස් පාසැල් වලට ඇතුළත් කල නමුත් මට තවත් වසර කීපයක් දෙමාපියන් සමගින් ඔවුන්ගේ පාසැලට යාමට සිදුවිය. එම කාලය තුළ දී, පිය චරිතය තුළින් මා බොහෝ සේ අත්දැකීම් ලැබුවෙමි. ගෙදර සිට සැතපුම් 8 ක් පමණ දුරක පිහිටි හෝමාගම අධ්‍යාපන දිස්ත්‍රික්කයට අයත් වෙනිවැල්කෙල විදුහලට තාත්තා විදුහල්පති ලෙසටත්, අම්මා උප ගුරු තනතුරකටත් පත්වුහ. ඒ වන විට අප තාත්තා සතුව සී.එල් 4914 දරණ පුංචි ෆියට් මෝටර් රථයක් ද තිබුණි.

එක් වැසි දිනයක අපි පාසැල් යනවිට, නිවසේ සිට සැතපුම් පහක් පමණ ඔබ්බෙහි වු ගුරු පාරක මඩ සහිත ලිස්සන සුළු කන්දක් තිබුණි. එම කන්ද එවකට 'අයිඩගෝම් කන්ද' නමින් හඳුන්වනු ලැබීය. අප ගමන් කල මෝටර් රථය එහි එරීම නිසා නිති පතා වේලාවට පාසැලට යන තාත්තාට මේදින පැය 2 ක් පමණ ප්‍රමාද වීමට සිදු විය. උප විදුහල්පති තුමා පාසැලේ ඉගැන්වීම් ආරම්භ කොට තිබුණි. සිරිත් පරිදි ගුරුවරුන්, පැමිණීමේ වාර්තා පොතෙහි අත්සන් තබා තිබු අතර, අත්සන් අවසන් කරන වෙලාව දක්වන රතු ඉර එහි නොතිබිණි. මා පියාණන්ගේ පැමිණීම ඔහු බලාපොරොත්තුව සිටියා විය හැක. ඒ පිළිබඳව ඔහුට වරද පෙන්වා දුන් අප පියාණෝ නීතිය කාටත් එකසේ සාධරණ දෙයක් බව පවසමින්

උප විදුහල්පති තුමා මගින් ම රතු ඉර යොදවා, අනතුරුව තම අත්සන යොදා වේලාව සටහන් කළහ.





කාල සටහනට අනුව පන්ති කීපයක, තමා වෙත පැවරී තිබූ විවිධ විෂයයන් සඳහා විජයසේන කිරිවත්තුඩුව මහතා දෛනිකව සකස් කරනු ලැබූ පාඩම් සටහන්

ඉතාමත් අපක්ෂපාතීව මෙන්ම නීති ගරුකව සේවය කල තාත්තාගේ පාසැලේ සියළු ගුරුවරු නිරන්තරයෙන් නියමිත වේලාවට පාසැලට පැමිණීමට උත්සාහ කළහ.. තාත්තා එහි විදුහල්පති වුව ද, එහිම උපගුරුවරියක් වූ අම්මාට අන් ගුරුවරුනට වඩා කිසිදු විශේෂ වරප්‍රසාදයක් නොලැබුණි. නීති ගරුක පාලනයක් ගෙන යමින්, සියළු නීති රීති අම්මාට ද එක ලෙසම බලපැවැත්වුණි. පාසැලේ ඉතා හොඳ විනයක් පැවතුන අතර පාසැල් පරිසරය ද ඉතාමත් පිරිසිදුවත් අලංකාරවත් පවත්වාගන තිබුණි. තම සේවා ස්ථානයන්හි උන්නතිය වෙනුවෙන් අති මහත් සේවයක් කල ඔහු වාර්ෂිකව ක්‍රීඩා තරග, ත්‍යාග ප්‍රදානෝත්සව සහ ප්‍රදර්ශණ ආදිය ද පවත්වමින් එවා සුබ නැකතින් විවෘත කිරීම පිණිස අධ්‍යාපන ක්ෂේත්‍රයේ එවකට සිටි උසස් නිලධාරීන්ට මෙන්ම මැති ඇමති වරුන්ට පවා ආරාධනය කරමින් කණිෂ්ඨ පාඨශාලා ලෙස පැවති ඇතැම් පාසැල් මහා විද්‍යාල දක්වා උසස් කිරීමටද පුරෝගාමීව කටයුතු කළේය. උසස් නිලධාරීන් සහ පරීක්ෂක වරු කුමන අවස්ථාවක පාසැලට පැමිණියත්, පවත්නා වූ ආදර්ශමත් පරිපාලනය පිළිබඳව ඉතා සතුටට පත් වූහ.

එදා විදුහල්පති ධුරය පරිපාලනය සඳහා පමණක් සීමා වූවක් නොවීය.පන්ති වල විවිධ විෂයයන් ඉගැන්වීමේ කාර්යභාරයද ඔහු සතුවීය. වර්තමාන ගුරුවරයා මෙන් එක් විෂයකට පමණක් විශේෂ පුහුණුවක් ලැබීමෙන් අනතුරුව එම විෂය පමණක් ඉගැන්වීමක් එදා දක්නට නොතිබිණි. ගණිතය, ආගම, ඉතිහාසය, භූගෝල විද්‍යාව,සාහිත්‍යය, භාෂාව, ප්‍රජාචාරය, ඉංග්‍රීසි, සෞඛ්‍යය, සෞන්දර්යය ආදී සැම විෂයක්ම ඉගැන්වීමට හැකියාවක් ඔවුන් සතු විය. ඒ සඳහා විදුහල්පති වූ අප පියාණන්ගේද ක්‍රමවත් සැලැස්මක් තිබුණි. තමාට නියමිත විෂයයන් සඳහා පාඩම් සටහන් වාර සටහන් ආදිය තමා විසින්ම සකස්කොට, අනිකුත් උපගුරුවරුන්ගේ දින සටහන් අනුමත කරන ආකාරයටම දිනපතා තමාගේම වැඩ කොටස ද තමා විසින්ම අනුමත කරනු ලැබීය. එය අනිකුත් ගුරුවරුනට සුවිශේෂ ආදර්ශයක්ම විය.

සිසුනට අවවාද කරන විටත් දඬුවම් දෙන විටත් තමාගේ දරුවාය කියා කිසිදු විශේෂයක් දැක්වූයේ නැත. මාගේ ජීවිතයේ කිසිදිනක අමතක නොවන කදිම නිදසුනක් මගේ මතකයට නැගෙයි.. .. .. ..

ඒ දිනවල පාසැල් වල බාලාංශ පන්ති පෙ:ව11.30 ට අවසන් විණි. එහෙත් පාසැල අවසන් වුයේ ප:ව 1.30 ටය. ඇතැම් කුඩා ළමො සිය වැඩිමල් සොහොයුරු සොහොයුරියන් සමගින්ම ආපසු නිවෙස් බලා ගමන් කිරීම පිණිස ප.ව 1.30 වනතුරු විදුහල් භූමියේ රැඳෙති. මා මෙන්ම, අනිකුත් ගුරුවරුන්ගේ ඇතැම් දරුවෝද, සිය දෙමාපියන්ගේ කාර්ය භාරය අවසන් වන තුරු පාසැල් භූමියේ රැඳී සිටියහ. එකී කාල සීමාව තුල ක්‍රීඩා පිටියට ගොස් දුව පැන සෙල්ලම් කිරීම අප සැමගේ සිරිත විය.

දිනක් සෙල්ලම් කරමින් සිටියදී අප දෙපාර්ශවයක් අතර කුඩා රබර් බෝලයකට රණ්ඩුවක් ඇති විණි. මම ඒ දිනවල කිසිම ළමයකුට බිය නොවීමි. සෙල්ලම් කරන විට අන් ළමයින්ගෙ අණ වලට ද යටත් නොවීමි. එසේ වුයේ ස්වභාවිකවම විදුහල්පති තුමාගේ දුව කියන හැඟීම, පුංචි ඔළුවේ ටිකක් තිබී විය හැකියි. දෙපාර්ශවය අතර වූ රණ්ඩුව කෙළවර වුයේ, මා වේගවත් ලෙස පිරිමි ළමයෙකුට පහර දීමෙන් අනතුරුවයි. මොහොතකින් තාත්තා වෙතට පැමිණිල්ල යොමු විණි. අප දෙදෙනාම කාර්යාලයට ගෙන්වා, කවුරුන් විසින් කළ ද, වරද වරද ලෙස දකිමින් සාධාරණ ලෙස නඩුව විසඳීමේදී මා වරදකරු විය. ඉතා තේජවන්ත ලෙස වේවැල අතට ගත් තාත්තා අනිකුත් සිසුනට දඬුවම් කරන්නාක් මෙන්ම මගේ අල්ලට තදබල වේවැල් පහර කීපයක් දුණි. මගේ සියුමැලි අල්ල පුපුරා ගොස් බෙහෙත් කරන්නට ද සිදු වුණි. එහෙත් මම ඒදින ඉතා වටිනා පාඩමක් ඉගෙන ගත්තෙමි. අනතුරුව මම කිසිම දිනයක ළමයින් සමග අනවශ්‍ය ලෙස දබර ඇති කර නොගත්තෙමි. එහි වරද මා හොඳින් තේරුම් ගතිමි. මට පියාණන් කෙරෙහි වෛරයක් ඇති නොවුණි. අපක්ෂපාතී සහ ඉතා සාධාරණ එවන් පියතුමකු ලැබීමට මා භාග්‍යවන්ත වීමි. අප පියාණන්ගේ එම ගුණ සුවඳ අද මුළු සමාජය සිසාරා දසත විහිදී ඇත.

තවත් එක් සිදුවීමක් මගේ මතකයට නැගෙයි. එවකට ඒ ප්‍රදේශයේ පාසැල් භාරව සිටි එම්. එල්. ජිනදාස නමැති පාඨශාලා පරීක්ෂක මහත්මයෙකු, මීට වසර විසි හයකට පමණ උඩදී කළුතර අධ්‍යාපන කාර්යාලයේදී මට හමුවිණි. එහි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙසට කටයුතු කරමින් සිටි ඔහු වෙත, අනුමැතිය සඳහා මාගේ රාජකාරි ලිපියක් මම ඉදිරිපත් කලෙමි. අප ඔවුනොවුන් හඳුනා නොගත්තෙමු. ඉදිරිපත් කලා වු ලිපිය කිහිප වරක් කියවු ඔහු අනතුරුව මා දෙස බලා මෙසේ කීය.

“.. .. මේ ශෛලියෙන්ම බොහොම පිළිවෙළට ලියුම් ලියන එක්තරා විදුහල්පති වරයෙක් හිටියා .. .. මම ඉස්සර හෝමාගම පාඨශාලා පරීක්ෂක වශයෙන් වැඩ කරන කාලේ .. අකුරුත් ටිකක් මේ වගේමයි.එකයි මම මේ කීප සැරයක්ම ලියුම කියෙව්වේ ”.. ...

මම එවිට ඔහු ගේ නම කුමක් දැ යි විමසුවෙමි. කිසිදු ප්‍රමාදයකින් තොරව අප පියාණන්ගේ නම ප්‍රකාශ කළ ඔහු නැවතත් මා දෙස බැලීය. මගේ මුහුණේ ඉරියව් දුටු ඔහු .. .. “ ඇයි ? හඳුනනවාද? ” යනුවෙන් මගෙන් ප්‍රශ්ණ කළේය.

මගේ ලිපියේ ‘කිරිවත්තුඩුව’ යනුවෙන් වාසගමක් සඳහන්ව නොතිබිණි.

ඒ වන විට මා විවාහක හෙයින්, රාජකාරිමය වශයෙන් ස්වාමි පුරුෂයාගේ වාසගම වූ 'ගුණතිලක' නමැති වාසගම භාවිත කරමින් සිටි අතර ඔහු එසේ ප්‍රකාශ කළේ මා හඳුනාගෙන නොවේ.

අප පියාණෝ සිය වෘත්තීමය ක්ෂේත්‍රය තුළ ඉතා සාර්ථක වූ අවංක සේවයක් ඉටු කරමින් කොතෙක් දුරට තම නිලධාරීන්ගේ සිත් දිනාගනිමින් ඔවුන්ගේ ප්‍රශංසාවට පාත්‍ර වී ඇත් දැ' යි මට සිතුණි.

ස්වල්ප වේලාවක් කථා කිරීමෙන් අනතුරුව මා හඳුනාගත් එතුමා මෙසේ ප්‍රකාශ කරන්නට විය... .. ..

" විජයසේන මහත්මයා ඒ කාලයේ නොයෙකුත් රාජකාරි ලිපි අපි ළඟට අරන් එනවා, අනුමත කරවාගන්න. ඒ අකුරු මට තවම මතකයි. අකුරක් ලිව්වොත් ඒ අකුර සම්පූර්ණයි. ලිපියක් ලීවාම ඒ ලිපිය හරි ක්‍රමානුකූලයි.. .. ..අත්සනත් කවදාවත් අමතක නොවන සුවිශේෂ අත්සනක් .. ..දැන් ඉන්න අය ලියන්නේ.. ..අකුරු කෑලිනේ.. අනික .. .. ලියන්නෙත් අවශ්‍ය දේ නෙමෙයි නේ. අවශ්‍ය දේ කෙටියෙන්, පැහැදිලිව ලියන්නත්, ඒ වාගේම කථා කරන අවස්ථාවලදී වචනයේ අවසාන ස්වරය දක්වා පැහැදිලිව හඬ නගන්නත් ඔයගොල්ලන්ගේ තාත්තාට හොඳ දක්ෂතාවයක් තිබුණා.. .. .. "


ලොග් සටහන්
සැබෑ පිටපත.
69. 8 22. සියමස නිමිත්තෙන් පිළියෙළවූ ප්‍රදර්ශනය
විවෘත කිරීම සඳහා අද මෙහි පැමිණියෙමි.
සාමාන්‍ය විද්‍යාව, ගෘහවිද්‍යාව, අත්කම්, මැහුම්
සෞඛ්‍ය, ඉතිහාසය, භූගෝලය හා බාලාංශ
උපකරණ ද යන අංශයන්ගෙන් ප්‍රදර්ශනය
සමන්විත විය. විශේෂයෙන් ගෘහවිද්‍යාව හා
මැහුම් ගෙතුම් ප්‍රායෝගික අංශයක්ද
පිළියෙල කොට තිබුණි. ළමයාගේ අත සිත
දියුණුවන අන්දමින් සකස් කැරුණු සියලු
ප්‍රදර්ශන භාණ්ඩයක්ම සිත් ගන්නා සුලු විය.
ගම්වාසීන් හා ගුරු මණ්ඩලයේ සියලුදෙනා-
ගේම සොඳුසිත සහ සහයෝගය දිනා ගනී.
මින් මෙවැනි ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම
සම්බන්ධයෙන් විදුහල්පති මහතා ඇතුළු
ගුරු මණ්ඩලයට ස්තුති කළ යුතුයි.
Sgd / B.L. Perera
මා/ අ.නි. කෑප්බැව
සැබෑ පිටපතක් බවට
සහතික කරමි.
විදුහල්පති.
කො/ බොරලැස්ගමුව ...

විජයසේන කිරිවත්තුඩුව මහතා සිය අත් අකුරෙන් ලියා සත්‍ය බවට අත්සන් තබනු ලැබූ ලොග් සටහනක පිටපතක්

පුද්ගලයකුගේ කීර්තිය මනාව වැඩීමට ඉවහල් වන කරුණු ලෙසට ධම්ම පදයේ අප්‍රමාද වර්ගයේ විසි හතර වන ගාථා පාඨයෙන් (උට්ඨානවතො සතිමතො.. .. ..) පෙන්වා දී ඇති කරුණු නිරතුරුවම මගේ මතකයට නැගිණි.

උසස් නිලධාරීන් ගේ හදවත් තුල, අප පියාණන් පිළිබඳව මෙතරම් ප්‍රශංසාත්මක වූ ප්‍රතිරූපයක් නිර්මාණය වීම පිළිබඳව මම නිහතමානීව ආඩම්බර වුනෙමි.

ඔහුගේ ආදර්ශමත් සහ ක්‍රමානුකූල වූ ශ්‍රේෂ්ඨ ක්‍රියා කලාපය සිය දරුවන් කෙරෙහි ආරෝපණය වීමේ ප්‍රතිඵලයක් ලෙසින්, මා විසින් අනුමැතිය සඳහා ඉදිරිපත් කළා වූ ලිපියට එතුමා විසින් සුවිශේෂ වූ ධනාත්මක ප්‍රතිචාරයක් ලබා දුණි. එහි අවසාන ප්‍රතිඵලය ලෙසින්, ඒ වනවිට වසර දහතුනක සේවා කාලයක් සම්පූර්ණ කර තිබූ මා කොළඹ දිස්ත්‍රික්කයේ ජනප්‍රිය පිරිමි පාසැලකට ස්ථාන මාරුවීමක් ලදිමි. එවන් පාසැලකට සිසුන් ඇතුලත් කර ගැනීම අද මෙන්ම එදා ද අභියෝගයක්ව පැවතුණි. ඒ වන විට අප පියාණෝ සිය ජ්‍යෙෂ්ඨ මුණුපුරු ගේ අධ්‍යාපනය කෙරෙහි ඉතා සැලකිලිමත්ව සිටි යුගයක පසු වූහ. මා සේවය කල පාසැලට මගේ දරුවා ඇතුළත් කර ගැනීම ද විශාල අභියෝගයක් වුණි. එහෙත් අභියෝග හමුවේ පසු නොබසින මගේ පියාණෝ ඒ සඳහා මට නිසි උපදෙස් ලබා දුන්නේය. ඒ අනුව ක්‍රියා කල මා වෙනත් ජනප්‍රිය පාසැලකට ස්ථාන මාරුවීමක් ලබා ගතිමි. එහි විදුහල්පති තුමා මෙන්ම, ඒ වනවිට දකුණු කොළඹ අධ්‍යාපන අධ්‍යක්ෂ ධුරය හෙබවූ චන්ද්‍රසේන හෙට්ටිආරච්චි මැති තුමාද අප පියාණෝ සිය පරිපාලනමය ක්ෂේත්‍රය තුළින් හඳුනාගත් සුහද මිතුරන් වූහ. ඒ සැම දෙයකම ප්‍රතිඵලයක් ලෙසින් සිය මුණුපුරු මිණිපිරියන්ටද සාර්ථක අධ්‍යාපනයක් ලැබීම සඳහා අවශ්‍ය වාතාවරණය සැකසිණි.



විජයසේන කිරිවත්තුඩුව මහතා රාජකාරි ලිපි තැපැල් කිරීම සඳහා 1955 දී සිය අත් අකුරෙන් (ඉංග්‍රීසියෙන්) සකසා තැබූ ලියුම් කවරයක්

මීට වසර තිස් හතරකට පමණ උඩදී මා, අම්පාර දිස්ත්‍රික්කයේ රජයේ පාසැලක ඉංග්‍රීසි ආචාර්ය වරියක් ලෙසින් ගුරු පත්වීමක් ලැබූ දා, එම පාසැලට මා කැටුව ගිය අප පියාණෝ මෙසේ අවවාද කළහ.

"දිවයිනේ කොහේ වුනත් කමක් නෑ .. .. .. පුතා.. රාජකාරිය හරියට කරන්න. තමා වෙත පැවරෙන වැඩ කොටස කාල සටහනට අනුව ඉටු කරන්න. ගුරු වෘත්තියේදී විශේෂයෙන්ම ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කරන්න ඕනැ. බොහෝ ගුරුවරු බොහොම කැමතියි, පන්තියක ඉඳලා තව පන්තියකට යන විට ටිකක් අතර මඟ මුණ ගැහෙන අයත් සමඟ කථා කර කර ඉන්න.

පුතා .. ..පන්තියට වෙලාවට යන්න. පන්තියෙන් වෙලාවට එන්න. විදුහල්පති කෙනෙකුට තමුන්ගේ සේවය ගැන කිසි දවසක වචනයක්වත් කථා කරන්න ඉඩ තියන්න එපා. එහෙම කරන කෙනෙකුට, විදුහල් පති වරයෙකු සමඟ පමණක් නෙමෙයි, අධ්‍යක්ෂ වරයෙකු සමඟ වුවත් ඕනෑම රාජකාරි ප්‍රශ්ණයක් ගැන නිරභයව කථා කරන්න පුළුවන් .. .. තමා නිවැරදි නම් කවර තරමේ ප්‍රශ්ණ එළඹියත් අවසාන ජයග්‍රහණය තමා සතුයි. "

අත් දැකීම් ලත් විදුහල්පති කෙනෙකු වශයෙන් ඒ දුන්නා වූ අවවාදය මත පිහිටා මම කටයුතු කළෙමි. මාගේ විසිපස් වසරක රජයේ සේවා කාලය තුල සුළු සුළු අභියෝග පැමිණියත් මා ඒ කිසිවකින් පරාජය නොවුණි. වෘත්තීමය ගැටළු හමුවේදී ඍජුව කථා කිරීමේ ශක්තියක් මට ආවේණිකව තිබුණි. අවංකව ඍජු ප්‍රතිපත්ති මත කටයුතු කල මගේම තාත්තාගේ අවවාදය මතම ඍජුව පිහිටා කටයුතු කළෙන්, එම ශක්තිය මා වෙත ආරෝපණය වී ඇති බව නොයෙකුත් අවස්ථා වල මට හැඟිණි. ගුරු වෘත්තියේ ගෞරවයත්, ශ්‍රේෂ්ඨ විදුහල්පති වරයකුගේ චාර්යාවත් මා පළමුවෙන්ම නිවැරදි ලෙස හඳුනාගත්තේ, තාත්තාගේම චර්යාධර්මයන් තුළිණි.

මෑතකදී අපි හෝමාගම එක්තරා අවමංගල්‍ය උත්සවයකට සහභාගී වුනෙමු. තාත්තා ද අප සමඟ එක් විණි. එහිදී එක්තරා විශ්‍රාමික විදුහල්පති වරයෙක් අප අසළට පැමිණ අසුන් ගත්තේය. ඔහු අප පියාගේ සමකාලීන විදුහල්පති වරයෙක් විය. කලකට පසු අහඹු ලෙස සිදු වූ එම හමුවීම නිසා ඉතා සතුටට පත්ව ඔවුනොවුන් කථා බහට වැටුණි. තාත්තා ඉතා සතුටින් අපව හඳුන්වා දුන්නේය.

අනතුරුව ඔහු අප දෙසට හැරී මෙසේ ප්‍රකාශ කරන්නට විණි.

.. .. .. " ඔයගොල්ලන් දන්නවාද ? .. .. .. විජයසේන මහත්තයා තමයි අපේ විදුහල්පති සංගමයේ හිටපු සභාපති. අපේ ඉස්කෝල වල පැන නගින ඕනෑම ගැටළුවකට අපි ඉස්සර උපදෙස් ගන්න එන්නෙ මේ මහත්තය ළඟට තමයි. දීපු උපදෙසක් කවදාවත් වැරදිලා නැහැ. ඒ විතරක් නෙමෙයි .. .. විදුහල්පතිලා හැටියට අපි බොහෝ ඉල්ලීම් දිනාගත්තේ මේ මහත්තයා හන්දා. යමක් කථා කළොත් කථා කරන්නෙ කෙළින්ම කාරණයට අදාලව.. ..ලිව්වත් එහෙමයි. ක්‍ෂණිකව නිවැරදි තීරණ ගන්නත්, ඒ වගේම අවශ්‍ය දේ අවශ්‍ය තැන නිර්භයව කථා කරන්නත් .. .. .. මේ මහත්තයාගේ දක්‍ෂතාවයන් අපටත් ලොකු ධෛර්යයක් වුනා .. .. ..

දැන් ඉන්න අයට එහෙම කරන්නත් බෑ. කරන කෙනෙකුට කරන්න දෙන්නෙත් නෑ".

අප පියාගේ කීර්තිය පිළිබඳව අපි නිහතමානීව සතුටු වුනෙමු. එහෙත් එය හුදෙක් ආත්ම වර්ණනාවක් ලෙස හදවතට නොගත් තාත්තා, වර්තමාන පාසැල් පද්ධතිය දෙසට ප්‍රවිෂ්ඨ වෙමින් සංවේගී සුසුමක් හෙළුවේය.


The scientists who invented these terrible weapons are not wicked men who enjoy killing. They are clever people who earn their living by discovering new things. Explosives are not harmful if they are used for such purposes as helping to get coal metals and other materials out of the earth.

විජයසේන කිරිවත්තුඩුව මහතා ඉංග්‍රීසි බසින් සිය අත් අකුරෙන් ලියනු ලැබූ ලිපියක කොටසක්. .. ..

ගුරු සේවයට අවතීර්ණ වූ දා පටන් ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමයේ ප්‍රබල සාමාජිකයෙකු ලෙස කටයුතු කල ඔහු එවකට සංගමයේ ප්‍රධාන ලේකම් ධූරය හෙබවූ එල්. ආරියවංශ මහතා සමඟ වෘත්තිමය ගැටළු හමුවේ පවත්වන්නට යෙදුණු විවිධ සාකච්ඡා තුලින් වෘත්තීමය අයිතිවාසිකම් රාශියක් දිනා ගැනීමට සමත් වී ඇත. 1973 දී, අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ පවත්වන්නට යෙදුණු ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමයේ සංවත්සර මහ

සභාවට අම්පාර දිසාව නියෝජනය කරමින් මම ද සහභාගී වුනෙමි. එහිදී රැස්ව සිටි ගුරු පිරිස අමතා අම්පාර දිසාව වෙනුවෙන් කථා කිරීමට, ලද ආරාධනය මම ප්‍රතික්ෂේප නොකළෙමි.

රැස්වීම අවසානයේදී පැවති ස්තුති කථාවේදී.. ... ..

" අම්පාර දිස්ත්‍රික්කයට නම් .. ..නව හිරු පායා ඇති බව පෙනී යනවා.. වෘත්තීය සමිතියක උන්නතියට අවශ්‍ය කරන සහජ දක්ෂතාවයන්ගෙන් පරිපූර්ණ සාමාජිකත්වයකින් අපේ අම්පාර දිසා ශාඛාව ශක්තිමත් වී තිබීම අපේ සංගමයට විශාල ශක්තියක් .. .. " යනුවෙන් ලේකම් තුමා ප්‍රකාශ කරද්දී එය අසා සිටි අප පියාණෝ කෙතරම් සතුටු වන්නට ඇත්ද?

අනුරාධපුර, ගාල්ල, හම්බන්තොට, මොණරාගල, කළුතර, කොළඹ ආදී දිවයිනේ බොහෝ දිස්ත්‍රික්ක වල සේවය කිරීමෙන් ලද අත්දැකීම් රාශියකුත් විවිධාකාර වූ අභියෝග වලට මුහුණ දීමෙන් ලද ජයග්‍රහණ රාශියකුත් හමුවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මනා පරිනත භාවයක් ඔහු ලබා තිබුණි. ඒ තුළින් ආධුනික ගුරුවරුනට ලැබුණා වූ ආදර්ශය සහ උපදෙස් ඔවුන් අදත් අප හමුවේ සිහිපත් කර සිටින්නේ ඉතාමත් ගෞරව පූර්වකවයි. එවාගේම එම ගෞරවණීය ගුරුවෘත්තියට පිවිසීමට තම දරුවන්ට මෙන්ම කදාති දරුවනටද අවස්ථාව සලසා දුනි.

එක්තරා සිදුවීමක් මගේ මතකයට නැගේ. අප කුඩා කාලයේ අසල්වැසි නිවසක මාමා කෙනෙකුගේ පුංචි දියණියක් සිටියාය. කුඩා කළ සුභ නැකතින් අප පියා විසින් ඇයට අකුරු කියවන ලදී. නමුත් ඒ නැගණිය කුඩා කල පාසැල් යාමට එතරම් රුචිකත්වයක් නොදැක්විණි. පාසැල් යාමට සූදානම් කරවීම පවා අති දුෂ්කර විය. අළුයම හිසරදය, බඩේ අමාරු වැනි රෝග ඇතැයි කියමින් හඬමින් යහන මත්ට වී සිටියාය. දෙමාපියන් අති මහත් පරිශ්‍රමයක යෙදුණද, ඉන් ඵලක් නොවීය. දිනෙන් දිනම ඇය පාසැල් ගමනට වඩ වඩාත් කම්මැලි වූවාය. උදා වූ තත්වය හමුවේ කළ හැකි වූ එකම විසඳුම වූයේ ඇයව අප පියාණන්ගේ පාසලට ඇතුළු කර, පියාණන් සමගින්ම එම පාසැලට යැවීම බව ඇගේ දෙමාපියෝ තීරණය කළහ. ඔවුන්ගේ අදහසට යහපත් ලෙස ප්‍රතිචාර දක්වමින් තාත්තා මෙසේ කියා සිටියේය. " මා සමඟ පාසැල් යාමට නම් උදේ 6.15 වන විට සූදානම් වී මෙතනට එන්න ඕනෑ". කෙසේ හෝ එය කරන බවට ඇයගේ දෙමාපියන් එකඟ විය. ඒ අනුව එම පාසැලට ඇයව ඇතුළත් කල නමුත් පාසැල් යාම සඳහා සූදානම් කරවීම ඉතා අසීරු කරුණක් විය. ඇය පෙර පරිදිම අඬන්නට වූවාය. ඇය කැටුව යාම සඳහා ගතකළ හැකි වේලාවක් තාත්තාට නොතිබුණි. එදා පාසැල් ආරම්භ වූයේ පෙ.ව. 7.30 ට ය. දින දෙකක් ඇයව රැගෙන නොගිය නමුත් අවසානයේ දී ඒ සඳහා උපක්‍රමයක් යොදමින් මෙසේ කීය. .. .. ..

“ කොච්චර ඇඬුවත් හෙට අරන් යන එක අරන් යනවාමයි”...... පසුදින .. .. උදේ වෙනදා මෙන්ම ඇය, පාසැල් යන්න බෑ කියමින් අඬන්නට වුවාය. එසේ අඬද්දීම ඇයව මෝටර් රථයට නංවා ගත් තාත්තා දොර අගුළු දා ගෙන රිය පදවන්නට විය. ටිකක් දුරක් ගොස් වාහනය මඳකට නවතා, තරමක වේගවත් ස්වරයෙන් මෙසේ කීය .. .. ..

“ නවත්වනවා ඔය ඇඬිල්ල. දැන් පාරෙ මිනිස්සු හිතයි මම ළමයෙක්ව බලෙන් දාගෙන යනවයි කියලා. මටත් දැන් පොලීසි යන්නයි වෙන්නේ” .. ..

ඇය තරමක් බිය වුවාය. එහෙත් ටික දුරක් යනවිට නැවතත් සුපුරුදු ලෙස අඬන්නට විණි. මගේ මව ද නොයෙකුත් අයුරින් සැනසීමට උත්සාහ කල ද සියළු උත්සාහයන් ව්‍යාර්ථ විය. එවකට කහතුඩුව පොලිස් ස්ථානය අප ගමන් කළ මාර්ගය අසලම විය. තාත්තා පොලීසිය ඉදිරිපිට වාහනය නවතා, එයින් බැස පොලිස් කාර්යාලය දෙසට ගියේය.. ඇයගේ හැඬීම නතර විය. මඳ වේළාවකට පසු පැමිණි ඔහු වාහනයට ගොඩ වෙමින්. .. .. .. “යන්තම් ඇති අදට බේරගත්තා. ආයිම ඇඬුවොත් නම් මෙහෙ තමා ඉන්න වෙන්නෙ” .. . යනුවෙන් පැවසුවේය.

තමා පොලිස් කාර්යාලය තුලට ගියේ වෙනත් උවමනාවකට බව ඇය දැන සිටියේ නැත. කෙසේ වුවද අනතුරුව ඇය වාහනය තුළදී කිසිවිටක හැඬුවේ නැත. ඉතා කැමැත්තෙන් පාසැල් යාමට ද සූදානම් වුවාය. ඉතා හොඳින් ඉගෙන ගත් ඇය අද රජයේ පාසැලක ගෘහ විද්‍යා ආචාර්ය වරියක ලෙස සේවය කරන්නීය.

යහපත් අරමුණක් වෙනුවෙන් ,අවශ්‍ය තැනකදී අවස්ථාවට සුදුසු පරිද්දෙන්, සම්‍යක් ප්‍රයෝගයක් යෙදීමේ වරදක් නැති බවත් මම එතුළින් ඉගෙන ගත්තෙමි. අතීත සිද්ධීන් නිවැරදි ලෙස සිහිපත් කිරීමේ මනා මතක ශක්තියක් තාත්තා සතුව තිබුණි. ඔහු ගේ අභිමානවත් ගුරු ජීවිතය තුළින් ලද අත්දැකම් සජීවී ලෙසින්, ඉතා සතුටින් ඔහු ස්මරණය කළේය. එසේ නොවුණේ නම් ඇතැම් සිද්ධීන් මෙසේ වාර්තාගත කිරීමේදී මගේ මතකයෙන් ගිලිහී යන්නට ඉඩ තිබුණි.

වරක් තාත්තා කළුතර දිස්ත්‍රික්කයේ, පස්දුන් කෝරළයේ ,මතුගම අධ්‍යාපන කොට්ඨාශයට අයිති පොල්ගම්පල විදුහලට ස්ථාන මාරු වීමක් ලැබුවේය. ඒ වන විට අප මැණියන් ද විදුහල්පති ධුරයක් ලබා කොළඹ, විහාර මහා දේවී බාලිකා විද්‍යාලයේ සේවය කරමින් සිටියාය. අප මැණියන්ගේ අවසරය ලබාගත් මා දිනක් තාත්තා සමග, තාත්තා සේවය කළ පාසැල බැලීමට ගියෙමි. එය විශාල කන්දක් උඩ පිහිටා තිබුණි. තැනින් තැන කැඩී බිඳී ගොස් තිබු ගල් පඩි එකසිය තිහක් නැගීමට සිදු විය. එම පාසැලේ විශාල ඔරලෝසුවක් ද තිබුණි. ගල් පඩි එකසිය තිහ නැගීමට තාත්තාට ගත වුයේ විනාඩි දෙක

තුනකි. තාත්තා මුළු ජීවිත කාලය තුලම මානසික වශයෙන් පමණක් නොව කායික වශයෙනුත් ඉතා නිරෝගී අයෙකු වුහ.

පසු කලකදී නැවතත්, හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම පාසැලකට ඔහු ව මාරු කරනු ලැබීය. ඒ පාසැල දැකීමට යාමට මට අවස්ථාවක් නොලැබිණි. දිවයිනේ සතර දිග භාගයේම රජයේ සේවයේ යෙදෙමින් සිටි ඔහු අවසානයේදී කොළඹ දිස්ත්‍රික්කයේ පාසැල් ගණනාවකම සේවය කළේය. අනතුරුව හෝමාගම අධ්‍යාපන කොට්ඨාශයේ පිටිපන මහා විද්‍යාලයට පත් කරනු ලැබුවේය. වසර කීපයක් එහිද සේවය කිරීමෙන් පසු දෛවය විසින් තම ගම් ප්‍රදේශය වෙතම ස්ථාන මාරුවීමක් ලබා දුනි.

පිටිපන කණිටු විදුහල මහා විද්‍යාලයක් බවට උසස් කරනු ලැබු දා ...එහි විදුහල්පතිව සිටි විජයසේන කිරිවත්තුඩුව මහතා, උත්සව සභාවට සපැමිණි අධ්‍යාපන ඇමති ගාමිණී ජයසූරිය මහතාණන් මහත් හරසරින් පිළිගැනීමෙන් අනතුරුව වේදිකාව දෙසට පා නගමින්.. .. ..

සිය මැණියන්ද අවසන් වරට විදුහල්පති ධුරය දැරූ කිරිවත්තුඩුව කණිටු විදුහලටම අවසානයේදී පැමිණි ඔහු, 35 වසරක රජයේ සේවය නිමා කර 1979 වප් මස 13 දින රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවේය. විශ්‍රාම ගැනීමේදී විදුහල්පති වරයෙකු විසින් රාජකාරිමය වශයෙන් තැබිය යුතු වු ලොග සටහන යෙදීම සඳහා 'ලොග පොත' අතට ගැනීමේ දී සිය මැණියන් සිහිපත් වු බවත්, මැණියන්ගේ ගමන් මගෙහිම වසර ගණනාවක්ම පා තබමින් දහස් සංඛ්‍යාත සිසු කැලකගේ නෙත් පදා, අවසානයේදී එම පාසැලටම පැමිණ විශ්‍රාම ගැනීමට ලැබීම අහඹු සුවිශේෂ භාග්‍යයක් බව ද ඔහු සතුටින් ප්‍රකාශ කළේය.

6

ආධ්‍යාත්මික ජීවිතයකට බරව .. .. ..

එදා තමා අධ්‍යාපනය ලබා ගත් ගුරු දේවයාණන් පසු කාලීනව අමතක නොකරමින් වාර්ෂිකව ඔවුන් බැහැදැක බුලත් හුරුල්ලක් දී වැඳ නමස්කාර කොට සැප දුක් සොයා බලා ඔවුන්ගේ ආශීර්වාද ලබාගැනීම තාත්තාගේ පුරුද්දක් වී තිබුණි. සෑම සිංහල අවුරුදු සමයකදීම එම චාරිත්‍රය අමතක නොකළ අප පියාණෝ, හෝමාගම පදිංචිව සිටි, නමින් චන්ද්‍රසේන නමැති ගුරු පියෙකු ගේ නිවසට සෑම නව අවුරුදු සමයක දීම අප ද කැටු ව ගියහ. එහි යන එන සෑම වාරයකදීම ගුරුවරයෙකුගේ ආශිර්වාදයක ඇති වටිනාකම අපට උදාහරණ සමගින් පෙන්වා දුන්නේය.

"පුතා .. .. .. මම ඒ කාලේ විභාග වලට, සම්මුඛ පරීක්ෂණ වලට යනවිට හැමදාම චන්ද්‍රසේන මහත්තයාගේ ගෙදරට ඇවිත් බුලත් අතක් දීලා වැඳලා ආශීර්වාද ලබාගත්තා. මට ඒක ලොකු ශක්තියක් වුනා.මම එයින් සමත් වෙනවා කියන හැඟීම එතැන් පටන් මගේ හිතේ රැඳුණා. ඒ වාගේමයි .. .. මම ජීවිතයේ කිසිම විභාගයකින් වත් සම්මුඛ පරීක්ෂණයකින් වත් අසමත් වෙලා නෑ. දෙමාපිය ආශීර්වාදය වගේම පසු කාලයේදී මට එය නැතුවම බැරිව ගියා. ඒකයි පුතා මම තවමත් චන්ද්‍රසේන මහත්තයා බලන්න යන්නේ.. .. .."

එදා, එක් එක් විෂයට වෙනවෙනම ගුරුවරුන් නොවීය. සියළුම විෂයයන් ඉගැන්වීමේ හැකියාව ඔවුන් සතුව තිබුණි. අප මැණියන් ගේ ගුරුදේවයන් වූ සයිමන් දෙළුවීර මහතා සහ එම මැතිණිය වෙත ද කෘතගුණ සැලකීම පිණිස වාර්ෂිකව අප මැණියන්

සහ අපවද කැටුව එහි යාම තාත්තාගේ සිරිත විය. පසු කලකදී, අප අධ්‍යාපනය ලබන සියළුම ගුරු මහත්ම මහත්මීන් ද වාර්ෂිකව බැහැදැක බුලත් හුරුල්ලක් පුදා කෘතගුණ සැලකීමට, අපව යොමු කරවමින්, ඔවුන්ගේ ආශීර්වාද අප වෙත ද ලබා දුන්නේය.

අවවාදයක් ලෙස එලෙස කළ යුතු යැ' යි තාත්තා, කිසි දිනක නොපැවසුවේය. එහෙත් තාත්තාගේ යහපත් ආදර්ශයන් ජීවිතයට එක් කර ගත් අප ද එම යහගුණ වලට ප්‍රමුඛතාවයක් දුනි. අපගේ දරුවනට ද එලෙසින් වාර්ෂිකව ගුරු ආශීර්වාද ලබා දීමට අප ද පසු බට නොවිණි. එ යහගුණ වල ප්‍රතිඵල අපි මේ වන විටත් ප්‍රායෝගිකවම ලබා ඇත්තෙමු.

තමාට ශිල්ප ශාස්ත්‍රය උගන්වා, සාර ධර්ම ප්‍රගුණ කරවා, දරු සෙනෙහසින් වැඩූ ගුරුවරයාට මව් පියන්ට මෙන්ම කීකරු වීම, ගුණ ගරුක වීම සහ යටහත් පහත් කම් දැක්වීම ගුණවත් උතුමන්ගේ බෝසත් සිරිතක් වුවද , එය හීන දීන කමක්, බැගෑපත් වීමක් සේ දකිමින්, නවීකරණය වෙමින් පවතින වත්මන් සමාජයේ ඇතැම් පුද්ගලයින්, තම ගුරුවරයා අධිකරණය හමුවට පවා ගෙනයාමට තරම් අන්ධබාල වීම සමාජ ප්‍රගමණයට කොතරම් අභියෝගයක් දැ' යි මට සිතුණි.

✱ ✱ ✱

තාත්තා, දිනක් ගෙදර අල්මාරියක ඇඳුම් අස්කරද්දී කලිසම්, කබා, ටයි, තොප්පි ආදිය එහි තිබෙනු අපි දුටිමු. අප නිවසේ එ ඇඳුම් පරිහරණය කරන්නෙකු එවකට නොවීය. එබැවින් අපි එ පිළිබඳව තාත්තාගෙන් විමසුවෙමු. එවිට ඔහු, එම ඇඳුම් තමා විසින් පරිහරණය කරන ලද එ'වා බවද, එසේ තබා ඇත්තේ කවරෙකුට හෝ දීමට බව ද කීවේය. එ වන විට තාත්තාගේ ඇඳුම වී තිබුණේ ශ්‍රී ලංකාවේ ජාතික ඇඳුම ලෙස සැලකෙන, සුදු වේට්ටියකින් සහ අත් දිග කමිසයකින් සමන්විත වු ආරිය සිංහල ඇඳුමයි. තාත්තා සුපුරුදු ඇඳුම වෙනස් කළේ ඇයි දැ'යි අපි තව දුරටත් විමසූ විට තාත්තා එ' පිළිබඳව මෙසේ විස්තර කළේය.

" එ කාලේ ඉංග්‍රීසි උගත් සැම දෙනා යුරෝපීය ඇඳුම ඉතා අගය කළා. එක ඇන්දෙත් දිග කලිසම, කබාය (කෝට් එක) සහ ටයි පටියෙන් සමන්විතව සම්පූර්ණ ඇඳුමක් ලෙසින්. අතට බස්තමත් මුවගට පයිප්පයත් හිසට තොප්පියත් දා ගෙන තමයි සමාජයේ ගැවසුණේ. ඉංග්‍රිසි උගත් අය බොහෝ විට ඉංග්‍රිසි බසින්ම කථා කළා. එ අය උත්සාහ කළේ සමාජයේ සාමාන්‍ය ජනතාවට වඩා ටිකක් ඉහළින් කැපී පෙනීමට.. .. ..

.. ..මම ඉංග්‍රීසි ඉගෙන ගත්තේ ඒ අරමුණෙන් නෙමෙයි. සිංහල භාෂාව මෙන්ම ඉංග්‍රිසි භාෂාවේ ද හසල දැනුමක් මම ලබා තිබෙනවා. රාජකාරි වශයෙන් ඉංග්‍රිසි භාෂාව අවශ්‍ය වෙලාවට භාවිතා කරන්නයි මම ඉගෙන ගත්තෙ.

.. .. ඉතින් ඉගෙන ගත්තයි කියල ඕක කරගහගන ඉන්න ඕනෑ ? .. ...ඊටත් මෙච්චර ලස්සන සරල ඇඳුමක් අපේ ජාතික ඇඳුම හැටියට සම්මත වෙලා තියෙද්දී, සීතල රටවල මිනිස්සු වගේ බෙල්ල හිර කරගෙන, කෝට් ඇඳගෙන, දාඩිය දාගෙන අපහසුවෙන් ඉන්නෙ මොන එකකටද?

පුතා ! .. .. අපි පාරුවක් පාවිච්චි කරන්නෙ ගඟෙන් එගොඩ වන්න මිසක් එගොඩ වුනාට පස්සේ කරගහගන යන්න නෙමෙයිනේ.. .. .. "

මාගේ සිතට තාත්තාගේ අදහස් ප්‍රබල ලෙස ආරෝපණය විණි. තාත්තා කොපමණ නිහතමානී දැ යි මම කල්පනා කළෙමි. සිංහල ලිවීමට, කියවීමට, කථා කිරීමට හෝ නොහැකි බව පෙන්වීම උගත් කමේ සුවිශේෂ ලක්ෂණයක් සේ දකින පුද්ගලයන් සිටින සමාජයක් තුල මෙවන් ශ්‍රේෂ්ඨ පුද්ගලයන් අතලොස්සක් හෝ සිටීම ජාතියේ භාග්‍යයක් යැයි මට සිතුණි. මම ද ඒ ආභාෂය සියයට සියයක්ම මගේ ජීවිතයට ළඟා කර ගතිමි. තම ආතා ගෙන් එම ආභාෂය උරුම වී ඇති, සිය ජ්‍යෙෂ්ඨ මුණුපුරාද තම ජීවිතයට ද එය ආදර්ශයක් හා ආශීර්වාදයක් කර ගෙන තිබීම තාත්තාට විශාල සතුටක් විය. සිය අදහස් වලට ගරු කර මින්, යහගුණ ප්‍රායෝගිකව තම ජීවිත වලට ළං කරගනිමින්, දිනෙන් දින ආලෝකය කරා යන ජීවිත වලට තාත්තා නිතරම ත්‍රිවිධ රත්නයේ ආශීර්වාද ප්‍රාර්ථනා කළේය.

✸ ✸ ✸

අප රැකියා කරන ස්ථාන වලටත් තාත්තා වසරකට වරක් දෙකක් පැමිණීම සිරිතක් විය. එසේ පැමිණියේ කිසිම අවස්ථාවක මොහොතක් හෝ රාජකාරියට බාධා කිරීමේ අදහසින් නම් නොවේ. බොහෝවිට ඔහු පැමිණියේ පාසැලේ අධ්‍යයන කටයුතු වලින් පරිබාහිර ශ්‍රමදාන, සීල් පිංකම් ආදී විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වන දින වලදීය.

දිනක් මා අවසන් වරට සේවය කල කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ සිල් පිංකමක් පැවැත් වු දිනයක තාත්තා පාසැලට ආවේය. සෑම විටම පළමුව විදුහල්පති මුණගැසෙන ඔහු මා හමුවට පැමිණියේ ඉන් අනතුරුවයි. මගේ පන්තියේ දිවා දානමය කටයුතු සූදනම් වෙමින් තිබුණි. මම ඉතා ගෞරවයෙන් තාත්තාව පිළිගත්තෙමි. මගේ පන්තියේ සිසු දරුවන්ගේ දෙමාපියන්ද සමඟින් ඉතාමත් සුහද ශීලී බවකින් යුතුව පන්තියේ සියළුම කාර්යයන්ට ඔහුගේ පූර්ණ සහයෝගය ලබා දුණි. පාසැලේ අනිකුත් ගුරු මහත්ම මහත්මීන් සමඟ ද ඉතා මිත්‍රශීලීව කථා බහ කරමින් සිට අපි සැවොම ධර්ම ශ්‍රවණය සඳහා ප්‍රධාන ශාලාවටද පිවිසියෙමු.

ධර්මශ්‍රවණයෙන් පසු තාත්තා අබියසට පැමිණි එක් ගුරු මහතෙකු ඉතා කුළුපගව සතුටුසාමීචියේ යෙදී සිටිනවා මම දුටිමි. කෙසේ ඔවුනොවුන් අඳුණන්නේදැයි දැනගැනීමේ අටියෙන් මම ද එතනට පිය නැගුවෙමි. එවිට ඒ ගුරුමහතා මා අමතා මෙසේ ප්‍රකාශ කරන්නට විය.

" විජයසේන මහත්මයා ඔයාගේ තාත්තා බව මම දැන සිටියේ නෑ .. .. .. මේ මහත්මයා තමයි.. .. .. .. මම පළමුවෙන්ම විභාග නිරීක්ෂණ කටයුතු වලට යන විට මට හමු වූ විභාග ශාලාධිපති තුමා. .. .. මම ආධුනිකයෙකු නිසා ඒ රාජකාරිය ගැන කිසිවක් දැන සිටියේ නැහැ. මේ ශාලාධිපති තුමාත් විටින් විට අප නිරීක්ෂණය කරමින් සිටි විභාග ශාලා වල ඇවිද්දා. දිනක් ශිෂ්‍යයෙක් සටහනක් බලාගෙන පිළිතුරු ලියනවා දැකලා ඒ ශිෂ්‍යයා ළගට ගියා. ඒ සටහන අප ඉදිරියේදීම අතට ගත්තා. විභාගය අවසානයේදී ඒ ශිෂ්‍යයා ද සමග කාර්යාලයට එන ලෙස මට අණ කළා.ඒ අනුව ශිෂ්‍යයා ද සමගින් මම කාර්යාලයට ගියේ මට සෑහෙන දෝෂාරෝපණයක් කරාවි කියා බලාපොරොත්තුවෙන්, එතනට ගිය විට මා අතට කඩදාසියක් දීලා කීව්වා. ඒ ළමයාගෙන් ලිඛිත ප්‍රකාශණයක් ගන්න කියලා .. .. .. තමා වංචනික ලෙස පිළිතුරු සැපයීම සඳහා සටහන් බැලූ බවට. එක අරගන ළමයාව යවලා .. .. මට එන්න කිව්වා .. ..

.. .. .. සැම දෙනාම පිටව ගිය පසු මට හොඳින් තේරුම් කර දුන්නා.. .. නිරීක්ෂක සතු කාර්ය භාරය. නිරීක්ෂක නිසි පරිදි නිරීක්ෂණය කරනවානම්; සටහනක්, කෙසේ හෝ ළමයා ශාලාව ඇතුළට සගවාගෙන අවා වුවත්, එය ළමයාගේ ඩෙස්ක් එක මතට එන්න බෑ .. .. ළමයාගේ අත කොහාටද යන්නේ ? ඊළගට එළියට ගන්නේ මොනවද? කිය ලා බලාසිටින එක තමයි නිරීක්ෂකට තියෙන්නේ. වට පිට බල බලා ඒ රාජකාරිය කරන්න බෑ. සැම ළමයෙක් ගැනම විමසිලිමත්ව ඉන්න ඕනෑ... ..කියමින් මින් ඉදිරියට සුපරීක්ෂාකාරී විය යුතු බව මට පහදා දුන්නා. මම දැන් වසර අටක් පමණ ශාලාධිපති කෙනෙක් ලෙසට කටයුතු කරනවා. අනිකුත් නිරීක්ෂකයන්ට අවවාද දෙන සෑම වේලාවකම මට මේ මහත්මයා කරුණු පෙන්වා දුන් ආකරයත්, එහි නිවැරදි හා නීත්‍යානුකූල භාවයත් සිහිපත් වෙනව " .. .. යනුවෙන් පවසමින් ඔවුනොවුන්ගේ අහඹු හමුවීම ගැන ඉතා සතුටට පත් වූහ.

මා සේවය කළ සියළුම පාසැල් වල ගුරුවරු සහ විදුහල්පති වරුන් තාත්තා ඉතා හොඳින් දැන හැඳින ගත්හ. අදත් ඔවුන් හමුවූ විට කථාකරන්නේ තාත්තා පිළිබඳව ප්‍රශංසා මුඛයෙනි. උගත් යැයි පිළිගැනෙන, උසස් නිලතල හොබවන, අද සමාජයේ ඇතැම් දරුවන්, සිය දෙමාපියන් තම සේවා ස්ථානයකට පැමිණීම ප්‍රතික්ෂේප කරන අවස්ථා බොහෝය. එහෙත් අප පියාණන් ගේ පැමිණීම අප ඉතා අගය කළ අතර, ඔහුගේ යහපත් නිහතමානී පැවැත්ම නිබඳවම අපහට ගෞරවණීය ආශීර්වාදයක්ම විය.



දිවුරුම් සහතිකය.

කොළඹ දිස්ත්‍රික්කේ සල්පිටි කෝරළේ උඩුගහ පත්තුවේ කිරිවත්තුඩුව, අංක 239 පදිංචි සෝමපාල ජයකොඩි යන මම, බෞද්ධාගම්කාරයෙක් වශයෙන් සහතික කොට, මෙම දිවුරුම් සහතිකයට අයත් සියලුම කරුණු, සත්‍ය වූත්, නිවැරදිවූත්, හෘදය සාක්ෂියට එකඟවූත්, අවංක තොරතුරු බැව්, ගම්භීරතා පූර්වකව, දිවුරා ප්‍රකාශ කරමි.

1. අංක 403181064 V දරණ පුද්ගලික හැඳුනුම් පතේ මගේ නම සඳහන් වනුයේ, ඉදින් සෝමපාල ජයකොඩි යනුවෙන්ය.
2. රාජකාරි ලිපිලේඛන ඇතුළු අනිකුත් ලියකියවිලි වල සඳහන් වනුයේ, සෝමපාල ජයකොඩි යනුවෙන්ය.
3. මගේ පුරුදු අත්සන, එස්. ජයකොඩි යනුවෙන් ඉංග්‍රීසියෙන්ය.
4. ඉදින් සෝමපාල ජයකොඩි යනුවෙන්ද, සෝමපාල ජයකොඩි යනුවෙන්ද එස්. ජයකොඩි යනුවෙන්ද තුන් ආකාරයකින් සඳහන් වනුයේ, තිදෙනෙක් නොව, තනිපුද්ගලයෙක්වූ සෝමපාල ජයකොඩි යන මා පමණක් බව.

අත්සන් කලේ

මෙම දිවුරුම් සහතිකය කියවා බලා තේරුම්ගෙන මෙහි 1991 ක්වූ ජූනි මස 28 වැනි දින ... දී මෙයට අත්සන් තබන ලදී

මා ඉදිරිපිටදීය.

91.06.28

එස්. විජසේන
සාම විනිසුරු

සමාදාන විනිශ්චය කරුවකු ලෙසින් මහජනතාවට සේවය කරමින්.. .. .. ..
සිය අත් අකුරෙන් සකස් කර දෙනු ලැබූ දිවුරුම් සහතිකයක පිටපතක්

පුහු අහංකාරත්වයෙන් හෝ කුහකත්වයෙන් හෝ කිසි දිනක තම සිත කෙලෙසා නොගත් ඔහු ධනවත් මෙන්ම, උසස් යයි හුවා දක්වන සමාජයේ ඇසුරට වඩා, වත් පොහොසත්කම් වලින් අඩු වුව ද, ගුණවත් කමින් වැඩි යහපත් අයගේ ඇසුර වඩාත් ප්‍රිය කළේය. ඥාති හිතමිත්‍රාදීන් ගේ සැපතෙහිදී සිත අභ්‍යන්තරයෙන්ම සතුටු වූ ඔහු විපතේ දී උණු වූ හදකින් යුතුව තම සියළු යුතුකම් නිහඬව ඉටු කළේය.

අප කුඩා කාළයේ සිටම තාත්තා දහමට බරව, සදාචාර සම්පන්නව සමාජසේවා කටයුතු වල ද නිරත වුණි. තමා වෙත ප්‍රදානය කර තිබූ සමාදාන විනිශ්චයකාර තනතුරේ ද, ගෞරවය උපරිම ලෙසින් ආරක්‍ෂා කරගනිමින්, ප්‍රදේශවාසීනට සෙත සැලසුවේය. ප්‍රදේශයේ කුමන ගෙදරක වුවද, අවමංගල්‍යක් සිදු වූ අවස්ථා වකදී තම යුතුකම් කිසි දිනක පැහැර හැරියේ නැත. ඥාතීන්ගේ යහළු මිත්‍රදීන්ගේ නොයෙකුත් ආකාරයේ ප්‍රිය සම්භාෂණ වලට ද එසේම සහභාගී විය. තාත්තා එවන් අවස්ථාවනට සහභාගි වුයේ තම යුතුකම් ඉෂ්ඨ කිරීමේ පරම චේතනාවෙන් විනා කිසිවිටෙකවත් එහි සංග්‍රහ බලාපොරොත්තුවෙන් හෝ එවා විවේචනය කිරීමට හෝ නපුරක් කිරීමට හෝ නොවේ.

අවශ්‍ය වූ අවස්ථා වලදී අප පියාණෝ ඉතා හරවත් ලෙස එම රැස්වීම් අමතා කථා කළහ. ඕනෑම ස්ථානයකදී, ඕනෑම අවස්ථාවකට උචිත පරිදි, කිසිම පෙර සූදානමක් නොමැතිව ඉතා දීර්ඝ ලෙස, පැහැදිලිව කථා කිරීමේ චතුර කථිකත්වයක් ඔහු සතු විය. ගම් ප්‍රදේශයේ වුවද, ඥාති නිවසක වුවද, උදා වූ අවස්ථාවට අප පියාණන් සහභාගී වුයේ නම්, එම සභාව අමතා කථා කිරීමට ඔහු ආරාධනයක් නොලද අවස්ථාවක් නොවීය. ඔහුගේ කථාව අවසන් වනතුරුම සභා ගර්භය තුල මා හැඟි නිහැඩියාවක් පැවතිණි. කුමන ආකාරයේ උත්සවයක් වුවද කිසිම දිනක කිසිම ස්ථානයකදී තම ප්‍රතිපත්තීන් ට එරෙහිව කටයුතු නොකළේය. සිය ජීවිත කාලය තුළ කිසිම දිනයක, තාත්තා ගේ මුවගට මත් වතුර බිඳක් හෝ දුම් වැටියක් ළං කරවීමට සමත් කිසිම ඥාතියෙකු හෝ කිසිම හිතවතෙකු හෝ නොවීය.

විටෙක උත්සව වලදී.. .. ..ඇතැම් අය තාත්තා අමතා මඳ ස්වරයෙන් මෙසේ ප්‍රකාශ කර ඇත... .. ..

" විජයසේන මහත්තයා යමු ද ? පොඩි ඩ්‍රින්ක් එකක් ගන්න " .. .. එවිට තාත්තා ඉතා හොඳ සිනහවක් පාමින්, කථාකරපු අයගේ පිටට ද තට්ටු කරමින් සුහද ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය අපගේ දර්ශන පථයට බොහෝ විට හසු වී ඇත.

" බොහෝම ස්තුතියි කථා කලාට .. .. ..නමුත් මම... .. දුම් වැටි මත් පැන් පාවිච්චියක් නෑ " යනුවෙන් පවසා ඔහු නැවතත් මඳ සිනහවක් පායි.

" මොකද ? මහත්තයා එ - අද පොඩ්ඩක් අරන් බලමු"

යනුවෙන් ඇතැමුන් ඔවුන් ඇබ්බැහි වී ඇති එම චර්යාවන් පුරුදු පුහුණු කරවීමට නැවතත් උත්සාහ කරන අවස්ථා වලදී තාත්තා ගේ පිළිතුර තරමක් දීර්ඝ විය.

. .. .. " මහත්තයෝ .. .. මිනිස්සු .. ඔය ජීවිත කාලය ඇතුළතම කරන්නේ ඉතින් තමුන්ට අවශ්‍ය දේවල් නේ. මම ඒ දේවල් පාවිච්චියක් නැත්තේ මට අවශ්‍ය නැති හින්දා .. .. මහත්තයාට අවශ්‍ය නම් ගිහින් පාවිච්චි කරන්න. මගේ අමනාපයක් නෑ .. .. .."

යනුවෙන් ප්‍රකාශ කරමින් නැවතත් සුහද සිනහවක් පායි.

ඒ පිළිතුරට සවන් දුන් අයෙකු නැවත ඒ සඳහා තාත්තා ව යොමු කර ගැනීමට උත්සාහ නොකළේය.

කෙසේ හෝ කල්යාමේදී ,.. ..

" විජයසේන මහත්තයාට නම් ඔය වැඩිට කථා කරලා වැඩක් නෑ.. .. .. .." යනුවෙන් ඇතැමුන් පවසනු අපි අසා ඇත්තෙමු.

✹ ✹ ✹

කළුතර දිස්ත්‍රික්කයේ වාද්දුව, තල්පිටියේ එවකට පදිංචිව සිටි, නිමල් ගුණතිලක මහතා සමඟ මා විවාහ වීමෙන් අනතුරුව අපි පදිංචිය සඳහා එම ප්‍රදේශයට ගියෙමු. තැඹිලි පොල් ආදිය සශ්‍රීකව වැවෙන එම ප්‍රදේශයේ රා, විනාකිරි, තැඹිලි වයින් ආදිය බොහෝ සේ නිෂ්පාදනය කරනු ලැබීය. එවකට මා කළුතර දිස්ත්‍රික්කයේ පොතුපිටිය මහා විද්‍යාලයේ ඉංග්‍රිසි ආචාරිණියක් ලෙසින් කටයුතු කළෙමි. අප ආචාර්ය මණ්ඩලයේ ගෘහ විද්‍යාව ඉගැන්වූ ගුරු මහත්මිය දිනක්, තැඹිලි වයින් හදන කරන ආකාරය අපට පහදා දුණි. එය, අගුණයක් නැති බීමක් හැටියට මෙන්ම වැඩිහිටි උදවියගේ කෑම රුචිය වැඩි කරවන පානයක් ලෙසට ඒ ප්‍රදේශ වාසීහු විශ්වාස කලහ. එය අළුත් නිශ්පාදනයක් නිසා මටද අත්හදා බැලීමට සිතුණි. අවශ්‍ය දේවල් අවශ්‍ය ප්‍රමාණයට යොදා නියම ප්‍රමිතියෙන් මම එය නිශ්පාදනය කලෙමි. පානය කල සැවොම එය අගය කරන්නට විණි. වැඩිහිට අයගේ කෑම රුචිය ඇති කරවීමට හොඳ බව පැවසෙන නිසාත් කල්තියාගත හැකි බීමක් නිසාත්, ටික ටික පානය සඳහා තාත්තාට බෝතලයක් පමණ ගෙන ගොස් දීම වරදක් නොවන බව මට සිතුණි. මගේම නිෂ්පාදනයක් නිසා තාත්තා එය වඩාත් අගය කරාවි යැ යි සිතමින් මා එක් බෝතලයක් ඉතා සතුටින් ඔහු වෙත ගෙන ගියෙමි.

මා අදහස් කල පරිදිම, තාත්තා බෝතලයේ මුඩිය විවෘත කර නාසයට ළඟා කරමින් " බොහෝම හොඳ නිෂ්පාදනයක්නෙ ; පුතාම ද හැදුවේ ? " කියා අසමින් සතුටින් භාර ගත්තේය. එම අවස්ථාව කෑම ගන්න වේලාවක් නොවුණි. "කෑමට පෙර නේද මේක බොන්න හොඳ ?" යනුවෙන් පැවසූ තාත්තා එය ගෙට රැගෙන ගොස් වඩාත් සුරක්ෂිත සේ තම අල්මාරියේ තබා ගත්තේය. මම විශ්වාස කළ අයුරින්ම තාත්තා එය ටික ටික එය පාවිච්චි කරාවි යැ යි සිතා මම සතුටු වීමි.

එක් දිනක් මම තාත්තාගේ සුව දුක් බැලීමට ගොස්, තාත්තාගේ ඇඳුම් ටිකක් සෝද, වේලා අල්මාරියේ දැමීමට සූදානම් වුනෙමි. ඒ සඳහා තාත්තාගේ අල්මාරිය විවෘත කර, රෙදි තබන ස්ථානය තරමක් අස් කළෙමි. ඊට වසර හයකට පමණ ප්‍රථම දුන්නා වූ වයින් බෝතලයක් පිළිබඳව කිසිවක් මගේ මතකයේ නොතිබිණි. අල්මාරි තට්ටුවේ යටින් වූ රෙදි වලට පසෙකින් මා එදා දුන් වයින් බෝතලය එසේම තිබෙනු මම දුටුවෙමි. තාත්තා එයින් බිඳක් වත් පානය කර නොමැති බව දුටු මට තරමක වේදනාවක් ඇති වුණි. එහෙත් මම තාත්තාගෙන් ඒ ගැන කිසිවක් නො ඇසුවෙමි. ඒ පිළිබඳව ප්‍රශ්ණ කළේ නම් ඇතැම් විට, තාත්තා මාගේ හිත රිදවීමට අකැමැති හෙයින් තරමක අපහසුතාවයකට පත්වන්නට ඉඩ තිබුණි.

එදා මගේ සිතට තරමක වේදනාවක් දැණුන නමුත්, අද මම තාත්තා ගැන සිතමින් සන්තෝෂ වෙමි. කුමන ව්‍යවස්ථාවික තත්වයක් හමුවේ වුවද, තම ප්‍රතිපත්තීන් පාවා නොදුන් තාත්තා කෙනෙක් මට ලැබීම ගැන මම නිහතමානීව ආඩම්බර වෙමි. තාත්තාගේ මුළු ජීවිතයම ආදර්ශමත් බව අපට දිනෙන් දිනම අවබෝධ වුණි. තාත්තා ජීවිතයේ කිසිම දවසක කිසිම කෙනෙකුට දුම් වැටි, මත් වතුර වලින් සංග්‍රහ නොකළේය. කුමන සමාජ මට්ටමක අයෙකු ඉදිරියේ වුවද එවන් සංග්‍රහ ප්‍රතික්ෂේප කිරීමට ද පසුබට නොවූයේය.

තාත්තා අප සමග විවේකීව සිටින බොහෝ අවස්ථාවලදී රටේ සමාජ තත්වය පිළිබඳව හොඳින් කරුණු වටහා දුණි.

" බලන්න පුතා, අද සමාජයේ ඇතැම් උදවිය මංගල උත්සවයකට යන්නේ තමන්ගේ නෑ කම, හිතවත් කම, සහෝදර කම ගැන හිතලා යුතුකම් ඉෂ්ඨ කරලා එන්න නෙමෙයිනේ. එතන ගිහින් සති ගානක් බඩ ගින්නෙ හිටපු කෙනෙක් වගේ තමුන්ට කන්න බැරි තරමට බෙදාගෙන, හොඳට වෙරි වෙන කම් බීලා මග යන්න බැරි වෙන කොට කොතනහරි කොනක වැටිලා ඉන්නවා.

තවත් කොටසක් ඉන්නවා; අනුන්ගේ යහපතක් දියුණුවක් දකින්න බැරිව, ඊර්ෂ්‍යා සහගතව:, ඒ අයත් ඕවගේ තැන් වලට ගියාම කරන්නේ උඩින් හොඳ හිත

පෙන්නාගෙන සංග්‍රහ එහෙමත් බුක්ති විඳලා පුළුවන් නම් ඔය අණ විණයක්, කොඩිවිණයක් කරල ඉක්මනින්ම එතනින් පිටතට පැනගන්න එක.. ..

ඔය දෙගොල්ලන්ටම පුතා.. .. .. තමුන්ගෙ යුතුකම් ගැන සිහි වෙන්නේ පස්සෙනේ .. .. ..

එත් ඉතින් යුතුකමක් කියන්නේ මොකක්ද කියල දන්නේ නැති, රැක ගන්න කියල - ආත්ම ගෞරවයක් නැති එවැනි උදවිය, ඒ තැන්වලට ගියාම සිද්ධ වෙන්නේ තම තමන්ගේ දුෂ්චරිත සේරම එළි දක්වන එන එක විතරයි නේ."

යුතුකමක් ලෙසට ආරාධනයක් ලැබුවාම, එය සතුටින් පිළිගෙන පියවි සිහියෙන් ඔවුන්ට ශුභ පතා, තමා යුතුකමක් ඉටුකලා කියන හැඟීමෙන් ආධ්‍යාත්මික සතුටකින් යුතුව එතනින් පිටත් වෙන්න බැරි එවැනි උදවිය අද මේ සමාජයේ කොපමණ සිටිනවාදැ'යි මට සිතුණි. ඇතැම් අය තමා හැසිරී ඇති ආකාරය සිහිවන විට පසුතැවෙන නමුත්, සුපුරුදු ජීවන රටාවට එරෙහිව යහමග යැමට ආත්ම ශක්තියක් නැති බැවින් අඳුරේම සිටින ආකාරයද මට සිහිපත් විණි.

තමා ලැබුවා වු මිනිසත් බව කෙලෙසාගන්නා එවැනි ඇතැම් දුර්ජනයින් ගැවසෙන මේ සමාජය, තාත්තා ගේ දර්ශණ පථයට කොතරම් තාත්වික ලෙස හසු වී ඇති දැයි අපට අද මනාව පැහැදිලිය. ඔහුගේ මුවඟින් පිට වු සෑම වචනයකම අර්ථාන්විත භාවයක් ගැබ්ව තිබුණි.

✵ ✵ ✵

තාත්තා කිසිම දිනක අන් අයගේ අඩු පාඩු ගැන කථා කළේ නැත. ඕපා දූප සෙව්වේ ද නැත. එවැනි දේ කථා කරන ඇතැමුන් ඉතා උපක්‍රමශීලී ලෙසින් යහ මඟට ද ගත්තේය. ඒ කාලයේ ඇතැම් අසල්වැසියන් විවේක ඇති අවස්ථාවලදී පත්තර බැලීමට අප නිවසට පැමිණීම සිරිතක්ව පැවතුණි. පුවත් පතේ තියෙන කාලීන මතෘකා පිළිබඳවත් රටේ සමාජයේ පවත්නා දේවල් පිළිබඳවත් ඒ අය සමඟ තාත්තා ඇතැම් අවස්ථා වල බොහොම සතුටෙන් කථා බහට එක් වුයේය.

එහෙත් ඇතැම් අවස්ථා වලදී, පත්තර බැලීමට එන ඇතැමුන්, කාලීන තොරතුරු පසෙක තිබියදී, අහළ පහළ අයගේ තොරතුරු වලටත් එළඹෙන්නට විණි.

දිනක් එවන් අවස්ථාවක ඉතා රසවත් සංවාදයක් මගේ සවනට ද යොමු විය.

පත්තරය බැලීමට පැමිණි, ගම් වැසියෙක් බුලත් විටක් ද හපමින් මෙසේ කීය..

"හැබෑ ද ?.. .. .. මහත්තයෝ .. .. අර අසවල් මහත්තයාගේ පුතාට ගෙනා නෝනා බිහිරියි .. .. කියන්නෙ ;, කන් ඇහෙන්නේ නැහැළු."

එම ප්‍රකාශය ගැන අනවබෝධයෙන් මෙන් තාත්තා මෙසේ කීය... .. ..

"මොකක් ? .. .. ඕයි ! .. .. හැබැට දැන් පත්තරවල තිබෙන එවා..." එවිට ඔහු .. .. ..

" නෑ.. ..නෑ...මහත්තයා ! පත්තරයේ දෙයක් නෙමෙයි .. .. .. මම මේ කිව්වේ අර උඩහ ගෙදරට ගෙනා මනමාලි ගැන.. .. .."

තාත්තා ඉතාමත් අකැමැති මාර්තෘකාවකට සංවාදය ප්‍රවිෂ්ඨ වූ බව අපට වැටහිණි.... ..

එවිට තාත්තා .. ... .

" ආ.. .. .. මම මේ හිතුවෙ පත්තරේ තියෙන දෙයක් කියලා.. ඔය මනමාලි ගැන නම් මම කිසිම දෙයක් කියන්න දන්නෙ නෑ.. .. මඟුල් ගෙදරට ගියා .. යුතුකම් ඉෂ්ඨ කලා .. .. ආවා. එච්චරයි, ඉතින් .. .. ඉන් එහාට ඔය පෞද්ගලික තොරතුරු මම හොයන්නේ නෑ... මට එවා අවශ්‍ය නෑ .. .. ..නේ.

.. .. .. .දැනගන්න ... අවශ්‍යම නම් .. .. ..ඉතින්.. .. , මම ඔය හමු වුන වෙළාවක.. .. .. බාස් උන්නැහැ , ඇහුව කියල අහල බලන්නම්.. .. .. .."

ඒ පුද්ගලයාගේ මුහුණ තරමක් රතු විය. ඉන් පසු කිසි දිනක ඔහු තාත්තා සමඟ ඕපා දූප කථා නොකළේය. නිසි ලෙස පත්තරය බැලීමෙන් අනතුරුව "ගිහින් එන්නම් මහත්තයා"........ කියාගෙන ආපසු යනවා අපි දුටුවෙමු.

7

ධර්මානුකූල දිවි පෙවෙතක්

සෑම දිනම උදෑසන අවදි වී, ගුවන් විදුලි යන්ත්‍රයෙන් විකාශය වන පිරිත් දේශණයට සහ ධම්ම චින්තාවට සවන් දීම අප පියාගේ දෛනික පුරුද්දක් විය. රාත්‍රි නින්දට පෙර ද හඬ නගා සෙත් පිරිත් සජ්ඣායනය කළේය. සන්ධ්‍යා කාලය එළඹෙනවාත් සමගම, නිවසට මදක් ඔබ්බෙහි වූ බුදුකුටියට සහ නිවස තුළට සුවඳ දුම් (සාම්බ්‍රානි) අල්ලා අනතුරුව සුදෝ සුදු මල් වට්ටියක් සකස් කර, පොල් තෙල් පහන්, හඳුන් කූරු ආදියද දල්වා අප සමගින්ම මල් පහන් පූජා කර බුදුන් වැන්දේය. කුඩා කාලයේ සිටම රාත්‍රි නින්දට පෙර මව් පිය වන්දනාව සඳහා අපව යොමු කළේය. ගාථාවන්හි නිවැරදි උච්චාරණය පිළිබඳව දැක්වූයේ විශේෂ අවධානයකි.

සෑම දිනම නින්දට යාමට පෙර අපි මව් පියන් නැමදීමට පුරුදුව සිටියෙමු., වුද්දිකාරෝ අලිංගිත්වා .. .. .. ගථා පාඨය කියමින් පසඟ පිහිටුවා තාත්තාට වැඳීමේදී, අම්මාට වැන්දේ දැ'යි අසන ඔහු පළමුව ඒ සඳහා අපව යොමු කරවන්නේය.

දිනක් ඔහු කරුණු පැහැදිලි කරමින් .. ..

" පුතා දන්නවාද? .. .. .. බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ -මව් පිය වන්දනාව- මාතා පිතු උපට්ඨානං ආදී වශයෙන් මිසක් කිසිම තැනක පීතු මාතා කියලා දේශනා කරලා නෑනේ.. .. .. .. ඊටත් පුතා ගෙදර බුදුන් අම්මා.. .. අපි අම්මාට ගෞරව කරන්න ඕනැ. අම්මා ගෙදර ඉන්න හැම වෙලාවකම අම්මාට කලින් වඳින්න පුරුදු වෙන්න.

ඉස්සර කාලේ හිටිය අට වන අග්බෝ කියල ශ්‍රේෂ්ඨ රජ කෙනෙක්. ඒ රජ සිය මෑණියන් නෑවූ ජලයෙන්, රාජසභාවට යාමට පෙර මුව දෝවනය කරගත් බවත්; චෛත්‍යකට හා සමානව සිය මෑණියන්ට වැඳුම් පිදුම් කළ බවත් ඉතිහාසයේ කියවෙනවා. ඒ කියන්නේ .. .. .. අපි වන්දනා මනා සඳහා පන්සලකට ගියාම පළමු කොට වඳින්නේ චෛත්‍යයට නේ. " යනුවෙන් කරුණු පෙන්වා දෙමින් මව් පිය වන්දනාවේ නිවැරදිස්වභාවය අපට පෙන්වා දුන්නේය.

යමක් කණට ඇසුණු පමණින්, නෙතට ගැටුණු පමණින්, සිතට දැනුණු පමණින් අනුකරණය නොකළ අප පියාණෝ සෑම දෙයක් පිළිබඳවම නිවැරදිව දැකීමක් ඇතිව පැහැදිලි ස්ථාවරයක සිට කටයුතු කළහ. වරදක් දුටු තැන නිවැරදි දේ කුමක් දැයි පෙන්වා දීමට තරම් පුළුල් අවබෝධයක් ඔහු සතු විය. එදා, සියළුම දේ අර්ථවත්ව ක්‍රමානුකූලව අපට පුරුදු පුහුණු කරවමින් පංචශීලයෙහි පිහිටා තම දෛනික කටයුතු සියල්ල සැලසුම් කළේය. මුළු ජීවිතකාලය තුළම අඛණ්ඩව පස් වන ශික්ෂාපදය ආරක්ෂා කිරීමට තරම් ආත්ම ශක්තියක් ඔහු සතු විය. ඒ පිළිබඳව විශාල ආත්ම තෘප්තියකින් යුතුව තාත්තා සෑම විටම කථා කළේය.

කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නා හිමිපාණන්, හෝමාගම ඉන්ද්‍රරතන හිමිපාණන් වැනි සංඝ පීතෘවරු, අප පියාණන් නිබඳවම ඇසුරු කරමින් අවවාද අනුශාසනා ලබා ගත් පැවිදි උතුමන් වූහ. රත්නපුර, වටාපොත විහාරස්ථානාධිපතිව වැඩ විසූ අපවත් වී වදාළ ශ්‍රී සුභූති ස්ථවිර පාදයන් වහන්සේ අප පියාගේ ආදරණීය මවගේ සහෝදරයෙකු විය. "අපේ සාධු " යනුවෙන් පුංචි අප හඳුන්වන උන් වහන්සේ, කුමන අවශ්‍යතාවයක් සඳහා හෝ කොළඹට වැඩම කරවන අවස්ථා වලදී අප නිවසට ද වැඩම කිරීම සිරිතක් විය. දන්, ගිලන් පස ආදිය පිළිගැන්වීමෙන් පසු, අප පියාණන් අප සමගින්ම පැදුරක් එළා උන්වහන්සේ ඉදිරිපසින් වාඩි වී කථා කරමින් සිටින අතර තුරදී, අපට ද ඔවදන් දෙන උන් වහන්සේ විහාරස්ථානයේ වවා තිබු සැපතිල්ලා වැනි පළතුරු ද ගෙනවිත් අපට දුන් අයුරු අප මතකයෙන් තවමත් ඈත් වී නැත. පසු කාලයක ස්වාමීන් වහන්සේගේ ආදාහන උත්සවයටද අප පියාණෝ සහභාගී වූහ. අප ද ක්‍රමයෙන් හැදී වැඩී ලොකු මහත් වූයේ මෙවැනි දැහැමි වට පිටාවක් තුලය.

එදා දරුවන් දඟ කාර කම් කරන විට බොහෝ දෙමාපියන් කියන්නේ ගෝනිබිල්ලා හෝ සන්නාසියා අල්ලා ගෙන යන බවයි. එමනිසා ළමයින්ගේ සිත් තුළ ගෝනිබිල්ලා ගැන ඇත්තේ අසීමිත බියකි. අප පියාණේ කිසි දිනක ගෝනි බිල්ලන්, සන්නාසින් ගැන අපට පවසා නැත. කුඩා කළ අප වරදක් කළ විට අපට තාත්තා කීවේ.. .. "සාධු තරහ වෙයි" . . . . .යන වචන තුන පමණි. සාධු තරහ වීම ගැන අපි මහත් සේ බිය වීමු. සාධු මිත්‍රත්වයෙන්

තබා ගැනීම සඳහා අපි ඉන්පසු එම වරද නොකළෙමු. ස්වාමීන් වහන්සේලා අතර සම්බන්ධය, බොදු හැදියාව, ආගමානුකූල යහපත් ජීවිතය අප සිත් තුළට අප පියාණන් කා වැද්දුවේ එලෙසටයි. අප සිත් තුළ ස්වාමීන් වහන්සේලා පිළිබඳ පහන් හැඟීමක් ඇති කරලීමට එම ආගමික වතාවරණය මහත්සේ ඉවහල් වුණි.

බෞද්ධ ඉතිහාසයේ දැක්වෙන පරිදි අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලක් දිවට වැඩම කළ විවිධ අවස්ථාවන් සිහිපත් කරමින්, අටමස්ථාන, සොළොස්මස්ථාන වැඳපුදා ගැනීම සඳහා පාසැල් නිවාඩු කාල වලදී ඔහු වන්දනා ගමන් සැලසුම් කළේය. එවායේ ආගමික හා ඓතිහාසික වැදගත් කම් පිළිබඳව අපව දැනුවත් කරමින් බෞද්ධ සාසනයේ චිර ජීවනය පිණිස එවා රැක ගත යුතු බවත් එවායේ සංස්කෘතික හා ආගමික උරුමයන් පිළිබඳව ඉදිරි පරම්පරාව දැනුවත් කිරීම වැඩිහිටි සැමගේ යුතුකම බවත් අපට පෙන්වා දුණි. දහනම වන ශත වර්ෂයේ මැද භාගයේදී, තම ආචාර්ය මණ්ඩළයේ ගුරු මහත්ම මහත්මීන් සහ හිතවත් සීමිත පිරිසක් සමගින් නාගදීපය වන්දනා කරගැනීම සඳහා වන්දනා ගමනක් සංවිධානය කළේය. එ අනුව රත්මලාන ගුවන් තොටුපලේ සිට පළාලි ගුවන් තොටුපල කරා ගුවන් මඟින් ගමන් කළ අප සැමට, තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ, මණිඅක්ඛික නා රජුගේ ආරාධනයක් පරිදි, බුද්ධත්වයෙන් වසර පහකට පසු දෙවන වරට ශ්‍රී ලංකාද්වීපයට වැඩම කල වූ ස්ථානය, එනම් නාගදීපය වැඳ පුදා ගැනීමට අවස්ථාව ලැබිණි. ආපසු පැමිණීම දුම්රිය මඟින් සැලසුම් කර තිබුණි.

අවසානයේදී ඉතා සාර්ථක ලෙස නිමා කළ එම වන්දනා ගමන පිළිබඳව සියළු විස්තර ඇතුළත් කරමින් " මා ගිය වන්දනා ගමනක් " යන මැය ඔස්සේ රචනාවක් ලිවීමට මට අණ කළේය. එවකට පැවති අන්තර් පාඨශාලීය රචනා තරඟයකදී එම රචනය ඉදිරිපත් කෙරිණි. ඉන් මා ලද ජයග්‍රහණය, එදා මගේ ජයග්‍රහණයක් ලෙස මට පෙනී ගියද, ජීවිතකාලය තුලම මා ලද සියළු ජයග්‍රහණ පිටුපස, අයෝමය හස්තයක් සේ මාගේ පියාණන් දෘෂ්‍යමාන වනු ඇත.

කුඩා කාළයේ සිටම අපට දහම් පාසැල් අධ්‍යාපනය ක්‍රමානුකූලව ලබා දීමට කටයුතු කල අප පියාණෝ එහි පැවති දැනුම මිනුම, භක්ති ගීත හා කථික තරඟ සියල්ලකටම ඉදිරිපත් වීම සඳහා අපව යොමු කළේය. දහම් පාසැලේ වාර්ෂිකව පවත්වනු ලැබූ කථික තරඟ වලදී කණිෂ්ඨ තරඟයෙන් මම ද ජ්‍යෙෂ්ඨ තරඟයෙන් මාගේ අක්කාද ජයග්‍රහණය කිරීම ඔහු ඉතා අගය කළේය. තම හැකියවන් සහ කුසලතාවයන් තම දරුවන් තුළින් ද දැකීම පිළිබඳව ඔහු සතුටට පත් වුවා විය හැකියි.

* * *

පෝය දින වල පාසැලේ සිල් පිංකම් මනා සංවිධානයකින් යුතුව පැවැත්විණි. තමා පුරෝගාමී වන සියළු ආගමික, සමාජයීක හා අධ්‍යාපනික කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි ලා ඉතා පැහැදිලි ස්ථාවරයක් ඔහු සතුව තිබුණි. කුමන කටයුත්තක් වුවද ආරම්භයට පෙර ඉතා හොඳ සැලැස්මක් තිබු අතර ආරම්භ කලා වු කටයුත්තක් කුමන අභියෝග හමුවේ වුවද අවසානය දක්වා ගෙනයාමේ ඍජු පෞරුෂක්ද ඔහුට තිබුණි. ඇතැම් අවස්ථාවල ඔහුගේ මුවග ඉංග්‍රීසි ප්‍රස්ථා පිරුළු ද විය. එවා අතරින් ..'Well plan is half done' .. යන්න නිතරම ප්‍රකාශ විය.

තම පාසැලේ පැවති ශ්‍රමදාන, සිල් පිංකම් ආදියේදී දී තාත්තා ගේ ක්‍රියා කාරී සහභාගීත්වය අපි දුටුවෙමු. පාසැල් සිසුන් සමගින් මාගේ තාත්තා ද පෝය දිනයේදී සිල් සමාදන් විය. පාසැල් භූමිය සිල් සුවඳින් පිරී ඉතිරී තිබුණි. පාසැලේ ධර්ම දේශනා හඬ මුළු ගමටම සෙතක් විය. පොත පත පමණක් ඉගැන්වීම ඔහුගේ අරමුණ නොවීය. සංවරශීලීව හැසිරීමට, ගුණ දහම් අවබෝධ කරවීමට පොහොය දින යොදා ගත්තේය. මම ද ඇතැම් දිනවල එම පාසැලේදී පියාණන් සමඟ අටසිල් සමාදන් වීමි.

අප පියාණන් මාගම්මන- දීපංගොඩ, හත්ලහගොඩ ශ්‍රී පර්වතාරාමයේ ප්‍රධාන දායකත්වය හොබවමින් එහි චිරස්තිථිය පිණිස බොහෝ වෙහෙස මහන්සි වී කටයුතු කරනු ලැබුවේය. වෙහෙර විහාර ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු වලදී මුල්‍යමය දායකත්වයද හැකි උපරිම අන්දමින් ලබා දුණි. තම ප්‍රදේශයට විදුලි බලය ලබා ගැනීමේදීද පුරෝගාමීව කටයුතු කරමින්, අප්‍රමාදව සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට සමත් විය.

ප්‍රදේශයේ දහම් පාසැල් උන්නතිය වෙනුවෙන් ඔහු විශාල සේවාවක් කර ගෙන ගියේය. කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් වාර්ෂිකව පවත්වනු ලැබු දහම් පාසැල් විභාග වල ප්‍රධාන පරීක්ෂකයෙකු ලෙසින් වසර ගණනාවක්ම දියගම ශ්‍රී බේමානන්ද දහම් පාසැලේ පරීක්ෂණ කටයුතු දැඩි කැපවීමකින් යුතුව ඉටු කරනු ලැබුවේය. දහම් පාසැල්හි පවත්වනු ලැබු කථික, පද්‍යගායන සහ දැනුම මිනුම වැනි තරඟ වලදී විනිශ්චය මණ්ඩලය නියෝජනය කරමින් ඉතා සාධාරණ වු ප්‍රතිඵල ලබා දුන්නේය.

තම අසල් වැසි විහාරස්ථානයක් වු දීපංගඩ , බ්‍රාහ්මණගම ශ්‍රී වර්ධනාරමය අනුබද්ධ කටයුතු වලදීද ඉතා සමීප සම්බන්දතාවයක් පවත්වා ගනිමින් එවායේ සංවිධානය කරනු ලැබු සියළුම කටයුතු සඳහා ද තම දායකත්වය ලබා දෙමින් ඔහු කැපවීමෙන් යුතුව කටයුතු කළේය. වෙසක් පොහොය දින වල මා 'බුදුසරණ' පත්‍රය නොමිළයේ බෙදා දීමේදී, එම අසල්වැසි විහාරස්ථාන වලට ද එම පුවත් පත බෙදා හැරීම සඳහා මා උනන්දු කරවමින් මා සමඟම එම කාර්යය සඳහා කැප වුණි. සියළුම ආගමික හා සමාජයීය කටයුතු වලදී

නිරන්තරයෙන්ම ප්‍රදේශවාසීන්ගේ ප්‍රසාදයට හා ගෞරවයට පාත්‍ර විය. අප දන්නා පරිදි අප පියාණන්ට කිසිම ස්ථනායක හතුරෝ නොවුහ. සදාචාර ලෝකයාගේ අභිනන්දනයට පාත්‍ර වූ ඉතාමත් දුර්ලභ ගණයේ මෙවැනි සත් පුරුෂ චරිතයක් අප පියා සතු නොවන්නට මෙබඳු වූ කෘතියක් අද ඔබ අතට පත් නොවනු ඇත.

ජීවිතයේ ලබන්නා වූ අත් දැකීම් අන් අයගේ යහපත වෙනුවෙන් යොමු කිරීමටද තාත්තා අමතක නොකළේය. 1981 දුරුතු මස 15 වන බ්‍රහස්පතින්දා ඉඳුරුව, යාලේගම පදිංචිව සිටි චන්ද්‍රසේන රණසිංහ මහතාගේ මාර්ගෝපදේශකත්වයෙන් සංවිධානය කරන්නට යෙදුණු, දඹදිව දීර්ඝ වන්දනා ගමනට ද ඔහු සහභාගී වුණි. ගුවන් යානයකින් කටුනායක සිට මදුරාසියට ගොස් වන්දනා ගමන ආරම්භ කළ ඔවුන් පුරා දින 41 ක් ගත කර ඉතා සාර්ථක ලෙස වන්දනා ගමන අවසන් කර,1981 නවම් මස 24 වන දින, .. රාමේෂ්වරම් සිට තලෙයි මන්නාරම දක්වා.. .. නැවෙන් ගමන් කර, ආපසු ශ්‍රී ලංකාව බලා පැමිණ ඇත.

මෙම දීර්ඝ වන්දනා ගමන පිළිබඳව සියළු කරුණු ඉතා පැහැදිලිව සංක්ෂිප්තව විස්තර කරමින් “ දඹදිව දීර්ඝ වන්දනාව” නමැති කුඩා ග්‍රන්ථයක් ඔහු විසින් මුද්‍රණය කර නොමිලයේ බෙදා හරින ලදී. අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය ලද ලුම්බිනියත්, බුද්ධත්වයට පත් බුද්ධගයාවත් පිරිනිවන් පෑ කුසිනාරාවත් ඇතුළු පූජණීය ස්ථාන දෙපයින් ගොස්, දෙනෙතින් දැක බලා, දෝතින් පසඟ පිහිටුවා නමස්කාර කලා මෙන්, පාඨකයාගේ හැඟීම් උද්දීපනය වන සේ සිංහල භාෂාව හසුරවමින්, කා හටත් අවබෝධ කරගත හැකි වන ආකාරයට ඉතා සරල බසින් එම පොත සකස්කර තිබුණි. එතුළින් ලබා ගත්තා වූ මහා පුණ්‍ය සමභාරය, ජීවතුන් අතර ඇති නැති මව් පිය, ගුරුවරු, නෑදෑ, හිතවත්, අහිතවත් සැම දෙනා වෙත අනුමෝදන් කරවීමට ද ඔහු අමතක නොකළේය.

"චත්තාරිමානි ආනන්ද, සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවේජනීයානි ඨානානි"

1981 ජනවාරි 15 සිට පෙබරවාරි 24 දක්වා
පුරාදින 41 ක් ගතවූ

දඹදිව දීර්ඝ වන්දනාව පිළිබඳ සංක්ෂිප්ත විස්තරයකි.

සකස් කිරීම:-
කෝට්ටෙගම-දිවුලපිටියේ
විජයසේන කිරිවත්තුඩුවගේ විශ්‍රාමලත් විදුහල්පතිතුමා

ප්‍රකාශනය හා බෙදාහැරීම:-
වන්දනා ගමනට සහභාගිවූ සැදැහැවත් පිරිසේ
සාමූහික සහයෝගයෙනි.

විජයසේන කිරිවත්තුඩුව මහතා අතින් 1981 දී ලියැවුණ
'දඹදිව දීඝ වන්දනා' නමැති ග්‍රන්ථය

1982 දී , තම සම කාලීන විදුහල්පතිවරයෙකු වූ ශාස්ත්‍ර විශාරද සාහිත්‍යාචාර්ය සාම විනිසුරු සුගතදාස කරුණානායකයන් විසින් සම්පාදනය කරන ලද ' හෙළ ගී දහම් පදය' නමැති ග්‍රන්ථය තෙවන වරට පිටපත් දහසක් මුද්‍රණය කිරීමට ද අප පියාණෝ මාහැඟි මුල්‍යමය දායකත්වයක් සහ අනුග්‍රහයක් ලබා දුන්හ.

✸ ✸ ✸

රෝගීනට උපස්ථාන කරන ආකාරය තාත්තා අපට ආදර්ශයෙන්ම පෙන්වා දුණි. ජීවිතයේ කුමන ගැටළුවක් ඉදිරියේ වුවද ඔහු නොසැළුණේය. අට ලෝ දහමට කම්පා නොවන පෞරුෂයක් ඔහුට ආවේනිකව තිබුණි. අප ආදරණීය මෑණියන්ගේ ජීවිතයේ අවසාන කාලය තාත්තාට තරමක අභියෝගාත්මක කාලයක් වුණි. එනම්, අප තිදෙනාම විවාහ වී පදිංචිය සඳහා නිවසින් බැහැර වී සිටි අවධියයි. අප තිදෙනාටම ඉතා කුඩා සහ පාසැල් යන වයසේ දරුවන් සිටි කලා පරිච්ඡේදයක් වූ නිසාම පූර්ණ කාලීනව මෑණියන්ට උපස්ථාන කිරීමට අපට තිබූ අවකාශය ප්‍රමාණවත් නොවන බව තාත්තා තේරුම් ගත්තේය. එහෙත් අප ඉඩ ලද සෑම විටම මෑණියන් බැලීමට ගියෙමු. එහි ගිය සෑම අවස්ථාවකම අපට තාත්තාගේ ප්‍රශ්ණ මාලාවකට පිළිතුරු දීමට සිදුවුණි.

" අද පුතා පාසැල් ගියේ කා එක්ක ද? (තාත්තා සිය මුණුපුරු ,මිණිපිරියන් ඇමතුවේද "පුතා" කියන ආදරබර වදනින්මය.)

"දැන් ගෙදර ආවාම ඉන්නෙ කා එක්කද?"

"ඉතින් පුතාට දවල්ට කෑම ?"

"පුතාට ඉස්කෝලෙන් දෙන ගෙදර වැඩ ටික කරවන්නේ කොහොමද?"

.. .. .. අපි කුමන ආකාරයේ පිළිතුරු සැපයුවද තාත්තා එවයින් සෑහීමකට පත් වූයේ නැත.

"අනේ පුතා !.. ..(එ ඇමතුවේ අපටය.) පොඩි අය තනිකර සේවකයින්ට දාලා එන්න එපා. . .

අම්මගේ වැඩ කටයුතු ටික මට කරගන්න පුළුවන්. පුතාල ඉක්මන් කරලා ප්‍රවේශමෙන් ආපසු යන්න.- මෙහෙ උයන පිහන වැඩ වලටත් ගැටළුවක් නැහේ -ලොකු අම්මා එහෙමත් ඉන්නවනේ .. .. .. (එසේ ඇමතුවේ අප මෑණියන්ගේ අවිවාහක සෙහොයුරියටයි.).. ..

.. .. අම්මාට කවන පොවන එකයි, අම්මාගේ රෙදි ටික සෝදල දාන එකයි කරලා - අම්මාව 'ක්ලීන්' කරලා තියන එක විතර නෙ මට තියෙන්නෙ.. ...මට ඉතින් වෙන රාජකාරියක් නෑ..නේ.. .. පුතාලා.. .. දරුවො ටික බලාගෙන ඒ කටයුතු ටික කල්පනාවෙන් කරගන්න- නිතර කරදර වෙවී දුවගෙන එන්න ඕනෑ නැහැ.".

තාත්තා ඒ වගකීම් සම්භාරය ඉතා සැහැල්ලු සිතින් දරාගෙන ක්‍රමානුකූලව කරගෙන ගියේය. එහෙත් අපි හැකි සෑම අවස්ථාවකම අම්මා බැලීමට ගියෙමු. එසේ වුවද, කුමන අවස්ථාවකදී වත් අප විසින් ඉටු කිරීමට සුළු හෝ වැඩ කොටසක් ඉතිරිව නොතිබුණි. සියල්ල තාත්තා විසින් ඉතා ක්‍රමානුකූලව කලට වේලාවට ඉටු කරනු ලැබුවේය. වසර හයක් යහන් ගතව සිටි අම්මාගේ අවසන් මොහොතේ වුවද, සුළු හෝ තුවාලයක් ශරීරයේ කිසිම ස්ථානයක නොතිබිණි. ඉතා පිරිසිදුව හා ක්‍රමානුකූළ ලෙසින් අප පියාණන් විසින් සිදුකරනු ලැබුවා වූ එම සත්කාරයේ ශ්‍රේෂ්ඨත්වය අපි අද පවා දස දහස් වාරයක් අගය කරන්නෙමු.

අප විසින් මෑණියන් වෙනුවෙන් ඉටුවිය යුතු වූ එම යුතුකම් සියල්ලටම, තාත්තා එදා පුදුමාකාර ආත්ම ශක්තියකින් යුතුව උරදුන්නේය. අප තිදෙනාටම දරුවන්ගේ කටයුතු කරගැනීම පිණිස විශාල සහනයක් ලබා දුන්නේ හදවත් සසල කරවන ළබැඳියාවකිනි. අංශ භාග රෝගයට ගොදුරුව එකතැන්ව සිටි අප මෑණියන් නිරන්තරයෙන්ම රැක බලා ගනු ලැබුවේ අප ආදරණීය පියාණන් විසින්මය. තාත්තාගේ මුවගින් ගිළිහුණු සෑම වචනයක්ම, ක්‍රියාවෙන් පෙන් වූ සෑම කටයුත්තක්ම මුළු මහත් සමාජයටම මහත් ආදර්ශයක් ගෙන දුන්නේය.

1987 දී එනම් අප මෑණියන් තරමක රෝගාතුර තත්වයෙන් පසු වූ අවධියේදී, මගේ ස්වාමි පුරුෂයා වෘත්තීමය වශයෙන් ලැබුවා වූ වරප්‍රසාදයක් මත වසරක කාලයක් සඳහා නෙදර්ලන්තය බලා පිටත්වුණි. ඒ වනවිට අප වැඩිමහල් පුතු පහ වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා සූදානම් වෙමින් සිටියේය. කෙසේ හෝ වසර අවසානයේදී මාස කීපයකට නෙදර්ලන්තය බලා යාමට මට ද අවස්ථාවක් ලැබුණි. මව ගේ අසමතුලිත වූ සෞඛ්‍ය තත්වය මතත්, පුතුගේ අධ්‍යාපන තත්වය මතත් ලැබුණා වූ අවස්ථාව ඉවත දැමීමට මම තීරණය කිරීමෙන් අනතුරුව සියළු විස්තර මා තාත්තා සමග පැවසුවෙමි.

මාගේ තීරණය තාත්තා විසින් වෙනස් කරවනු ලැබීය. පුතා ගේ ශිෂ්‍යත්ව විභාගය සඳහා ඔහු පුහුණු කරවීමේ කාර්ය භාරයත්, එම නිවසේ සිට පුතු ව පාසැල් යැවීමේ වගකීමත්, මෑණියන් රැක බලා ගැනීමේ කටයුතු ද සමඟින් තාත්තා දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව භාර ගත්තේය.

විදෙස් රටකට යාමටත්, එවායේ අත් දැකීම් ලැබීමටත් දෙවය විසින් මා වෙත දෙනු ලැබූ එම අවස්ථාව මග නොහැරිය යුතුයි, යන දැඩි ස්ථාවරයේ සිටි තාත්තා, මගේ සියළු ගැටළු නිරාකරණය කර දීමට අවශ්‍ය සෑම පියවරක්ම ඉතා බුද්ධිමත් ලෙස ක්ෂණිකව ගත්තේය. එපමණකින් නොනැවතුණ ඔහු, ජීවිතයේ පළමුවරට දිවයිනෙන් පිට ව යාමට සූදානම් වූ මට සියළු ශක්තිය හා ධෛර්යය ලබාදීම පිණිස ආගමානුකූල චාරිත්‍රයන් ද ඉටු කළේය. අනතුරුව ඔහු මාගේ සොහොයුරාද සමගින් එක්ව කටුනායක ගුවන් තොටුපල කරා මා රැගෙන ගියේය. එහිදී, දරුවන් දෙදෙනාගෙන් තාවකාලිකව හෝ වෙන්වීම මට වේදනා සහගත බව අවබෝධ කර ගත් ඔහු, පුතාල දෙදෙනා ගැන කිසිම භයක් ඇතිකරගතයුතු නැතැ'යි කියමින් මගේ ගුවන් ගමන සඳහා රත්නත්‍රයේ පිහිට ආරක්ෂාව පතමින් අශිර්වාද කළහ.

මාස කීපයකට පසු අප ශ්‍රී ලංකාව බලා ආපසු පැමිණියේ පස් වන වසර ශිෂ්‍යත්ව විභාගයට පෙර දිනයි. එහෙත් විභාගයට සූදානම්ව සිටි පුතු පසු දින ශිෂ්‍යත්ව විභාගයට රැගෙන යාම ද තාත්තා විසින් ම භාර ගනු ලැබුවේය. අප විසින් ගෙන එනු ලැබූ සෙල්ලම් බඩු ආදිය වාද්දුවේ ගෙදර ගෙන ගොස් තබන ලෙසත්, පසු දින විභාගය අවසන් වූ සැණින් පුතා සමගින් එහි එන බවත් පැවසූ ඔහු පුතාගේ සිත, ඒ අවස්ථාවේදී කලබල නොවන ආකාරයට කටයුතු කළේය. පුතණුවන් සුපුරුදු ලෙසම ආතා සමඟ එහි රඳවා අපි වාද්දුවේ නිවස බලා පිටත් වීමු.

පසු දින විභාගය සඳහා පුතු රැගෙන ගිය ඔහු විභාගශාලවේ නියම අසුනෙහි පුතු හිඳවා අවශ්‍ය උපදෙස් දී, විභාග ශාලවේ දොරටුව පෙනෙන ස්ථානයකට වී විභාගය අවසන් වනතුරුම රැඳී සිටියේය. මොහොතකටවත් එතනින් ඉවතට නොගිය ඔහු විභාගය අවසන් වීමෙන් පසු පුතා ද සමගින් යුහුසුළුව අප නිවස බලා පැමිණියේ ගෙන එනු ලැබූ සෙල්ලම් බඩු ආදිය පුතු වෙත ඉක්මනින් ලබා දී පුතු සැනසීමේ අදහසිනි. සියල්ල සැලසුම් සහගතව ඉටු වී තිබූ නමුත් එදින පස් වරු 3.00 වන තුරු ම අප පියාණෝ උදේ ආහාරය වත් ගෙන නොතිබිණි. ක්ෂණිකව ආහාර පාන පිළිගැන්වූ මා එසේ නිරාහාරව සිටීමට හේතු විමසූ විට ඔහු මෙසේ ප්‍රකාශ කළේය.

"... .. පුතා.. ..දරුවන්ව විභාගයකට අරන් යනවිට කල් වේලා ඇතිව යන්න ඕනැ.ඉතින් පුතාගේ උදේ කෑම ටික කවලා, පොවලා වාහන තදබදය ඇතිවෙන්න කලින් අපි පිටත් වුනා. පුතාව විභාගයට වාඩි කරලා, ඒ අසලම තිබූ භෝජනාගාරයෙන් තේ බොන්නයි මම හිතා හිටියේ. එක වහලා තිබුණා.. .. .. ඇතින් පිහිටි අනිත් භෝජනාගාරය නම් ඇරලා තිබුණා. එත් .. ..ඉතින් පුතා සිටින විභාග ශාලාව පෙනෙන තෙක් මානයෙන් එහාට මම ගියේ නෑ.. .. ..

පොඩි ළමයි නේ .. .. පුතා..,(ඒ ඇමතීම මා වෙතය..) මොකක් හෝ උවමනාවක් වෙලා මාව හෙව්වා නම් .. .. .. මම පේන්න නැති කොට පුතා කලබල වෙනවනේ. .. .. උදේට කෑම ගත්තේ නෑ කියල , මට ඒ හැටි අපහසුතාවයක් නෑ.. .. ..“

භාර ගත්තා වූ වගකීමක් නිසි අයුරෙන් ඉටු කිරීම සඳහා තිබුණා වූ අවශ්‍යතාවයත්, සිය මුණුපුරා කෙරෙහි ද පැවතුණා වූ සෙනෙහසත් සිය කුස ගින්න පවා යටපත් කර ඇති බව මට පැහැදිලි විය. අධ්‍යාපනය ආරම්භයේදී සුභ නැකතින් තාත්තා විසින්ම අකුරු කියවූ සිය පළමුවන මුණුපුරු ගේ පස් වන වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල ලැබුණ දා තාත්තා අප්‍රමාණ සතුටක් ලැබුවේය.

දරුවන් වූ අප තිදෙනා වෙනුවෙන් පමණක් නොව සිය මුණුපුරු මිණිපිරියන්ගේද අධ්‍යාපනය වෙනුවෙන් ඉත සිතින් සුභ පතමින්, යහ ගුණයෙහි පිහිටුවමින්, නිසි මඟ පෙන්වා දෙමින් නිරතුරුවම අප පියාණෝ ඔවුන් පසු පස ද සිටියේය . කුඩා කළ සිටම පංචශීල ප්‍රතිපත්ති ජීවිතයට ළඟා කර ගත් සිය වැඩිමහල් මුණුපුරු වෙත,1999 දී විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා විදේශීය ශිෂ්‍යත්වයක් පිරි නමා ඇති බව සවන් ගැටුණු මොහොතේ, අති මහත් ආත්ම තෘප්තියක් ලබමින් මෙසේ ප්‍රකාශ කළේය.

විජයසේන කිරිවත්තුඩුව මහතා තම ජ්‍යෙෂ්ඨ මුණුපුරු ශිෂ්‍යත්වයක් ලබා විදෙස් ගත වීමට පෙර ඔහු වෙත ශුභ පැතීමට පැමිණි දා .. .. 1999 දී

"මදුරුවෙක් වත් නොමරන, බොරුවක් නොකියන, උම්බලකඩ කැබැල්ලක් වත් තම ආහාරයට නොගන්න, මත්පැන් දුම් වැටි අසලකටවත් නොගන්න .. .. පුතාට, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළටම ඉගෙන ගන්න ශක්තිය ධෛර්යය ලැබෙන්න ඕනැ; ශ්‍රේෂ්ඨ මිනිසකු බිහි වන්නේ ගුණ ධර්මත් සමඟින් මිස පොත පත දැනුමෙන් පමණක් නොවෙයි - මගේ රත්තරන් පුතාට රත්නත්‍රයේම පිහිටයි. .. ..."

විශේෂයෙන්ම, දරු මුණුපුරන්ගේ අධ්‍යාපනය කෙරෙහි නොපසුබට උත්සාහයකින් යුතුව මහත් කැප වීමකින් කටයුතු කල, ආදරණීය ආතා කෙනෙකුගේ සංවේදී හදවතින්, උතුම් සෙනෙහසේ නාමයෙන් ඒ මුවගට ගලා ආ අව්‍යාජ වදන් පෙළ සවන් ගැටුණු මොහොතේ මගේ දෙනෙත් පවා කඳුලට බර වූයේ හැඟුම් බර දාරක සෙනෙහසේ උත්තරීතර භාවය සනිටුහන් කරමිනි.

උණුසුම් සුභාශිංසන ලබා ගත් තම මුණුපුරාණන් තමාට පසඟ පිහිටුවා වැඳීමේදි සිය දෙනෙතට හදවතින් ගලා ආ සතුටු කඳුළු තුලින් එදා අප පියාණෝ කොතරම් සැනසෙන්නට ඇත් ද?

8

පවුලේ ඥාතීන් මෙලොවින් සමුගනී .. ..

සිය දෙමාපියන් වයෝ වෘද්ධව සිටියදී, ඉඩ ලැබුණ සෑම අවස්ථාවකම ඔවුන්ගේ සැප දුක් බැලීමට යාම අප පියාගේ සිරිත විය. ඒ සඳහා සැතපුම් පහක පමණ දුරක් වුයෙන්, පා පැදියෙන් ගමන් කිරීමට වැඩි කැමැත්තක් දැක් වුයේ, තම ශාරීරික නිරෝගීතාවයට ද එයම හේතුවන බැවිනි. දිනෙන් දින ම සිය මෑණියන්ගේ රෝගී තත්තවය අසාධ්‍ය බවට පත්ව ඇත. පුරා වසර හැට අටක් ආයු වළඳා 1966 ඇසළ මස 29 වන දින සිය ආදරණීය මෑණියන් මෙලොවින් සමුගැනීමෙන් අනතුරුව සිය පියාණන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමටද සිදු වී ඇත.විටෙක තම නිවසට කැටුව විත් දිගු කලක් එහි රඳවා ගනිමින් සිය ආදරණීය පියාණන් වෙනුවෙන් දැඩි කැපවීමකින් යුතුව කටයුතු කළ නමුත් 1982 වප් මස විසිදෙවන දින, පුරා වසර අනුවක් ආයු වළඳා සිය පියාණෝද මෙලොවින් සමුගත්හ.

අනතුරුව අප පියාණෝ සිය පවුලේ නැගණියන් දෙදෙනා හා එකම සොහොයුරු වෙනුවෙන්ද, පවුලේ වැඩිමහල් සහෝදරයා ලෙසින් සිය යුතුකම් ඉටු කළේය. ඔවුන් දිවයිනේ කුමන ප්‍රදේශයක පදිංචිව සිටියද, සිංහල අළුත් අවුරුදු චාරිත්‍ර ජීවිත කාලය පුරාම ඉටුකරමින් වාර්ෂිකව අප පවුලේ සියළු සාමාජිකයින් සමඟ ඔවුන් බැහැ දැකීමට අමතක නොකළේය. එම පවුල් ඒකක තුල උදා වු සියළුම මංගල්‍ය උත්සව වලදීත්, අනෙකුත් ආගමානුකූල කටයුතු වලදීත් සිය අව්‍යාජ හා අකලංක සහෝදරත්වයේ නාමයෙන් තමාට හැකි උපරිම ආකාරයෙන් සිය යුතුකම් නොපිරිහෙලා ඉටු කළේය.

වසර පනහකට ආසන්න කාලයක් සිය ජීවිතයේ දුක සැප බෙදාගනිමින්, සෙනෙහෙබර ළබැඳියාවකින් එක්ව, එකම කැදැල්ලක් තුල සෙනෙහසේ අමරණීයත්වය ගොඩනගමින් දූ වරුන් දෙදෙනෙකු හා පුත්‍ර රත්නයක් ලොවට ජනිත කළ අප සදාදරණීය මව්තෙමෝ මෙළොවින් සමුගත් දා, එනම් වර්ෂ 1994 ක් වූ දුරුතු මස 27 වන දින අප පියාණන්ගේ ජීවිතයේ අතිශය ශෝක ජනක දිනයක් විය. එහෙත් ජීවිතයේ යථාර්ථය අවබෝධ කරගනිමින්, උදා වූ තත්වය හමුවේ සියළු යුතුකම් ඉටු කල ඔහු, තුන් සිත පහදා ගෙන, අප තිදෙනා ගේ ද සහභාගීත්වයෙන් යුතුව ධර්ම දේශනා සහ දානමය පින් කම්ද නිසි පරිදි වාර්ෂිකව සංවිධානය කරමින්, අභාවප්‍රාප්ත සිය ආදරණීය බිරිඳ වෙනුවෙන් පිං අනුමෝදන් කරවා ඇයට නිර්වාණ සුවය ප්‍රාර්ථනා කළේය.



1994 දී මෙලොවින් සමුගත් දයාබර බිරිඳ ලෝර පෙරේරා හෙට්ටිආරච්චි මැතිනිය

විජයසේන කිරිවත්තුඩුව මහතා දරු මුණුපුරන් සමඟින් සිය දයාබර බිරිඳට අවසන් ගෞරවය දැක් වූ දා.

වර්ෂ 1998 ක් වූ පොසොන් මස 5 වන දිනය දා ඔහුගේ ජීවිතයේ තවත් සිහිවටනයක් තැබීය. බදුල්ල, මහනුවර, කොළඹ, ගාල්ල ආදී දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි හෙද විදුහල්හි, විදුහල්පති ධුරය දරමින් සමාජයට විශාල මෙහෙවරක් කළ, අමරා ගුණසේන නම් වූ තම පවුලේ කණිටු නැගණිය ගේ එම හදිසි වියෝව ඔහුගේ සිතට වේදනා ගෙන දෙන්නක් විය. අනතුරුව මාස 3 කට පමණ පසුව අභාවප්‍රාප්තවූ, මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයකු වශයෙන් සේවය කළ, බී.ඒ.ගුණසේන නම් වූ ඇයගේ ස්වාමිපුරුෂයාගේ අවමංගල්‍ය උත්සවයටද සහභාගී වූ අප පියාණෝ, ගම්පහදී එම අවමංගල්‍ය උත්සවය අමතා ගුණ කථනයක් කිරීමට තමා වෙත ලැබුණා වූ ආරාධනය ද පිළිගත්හ.

අනිත්‍ය වූ ජීවිතය තුළ කිසිවෙකුට සදාකල්හි ජීවිතය පවත්වා ගතනොහැකි බවද, උපන් සෑම සත්වයෙකුටම මරණය පොදු වූ ධර්මතාවයක් බවද, ජීවත්වන කෙටි කාලය තුළදී සමාජයට ආදර්ශමත් දෙයක් ඉතිරිකිරීමට හැකිනම්; එය මනුෂ්‍යත්වයේ නිසිඵල ලැබීම බවද ඔහු සිය ගුණ කථනය තුලින් අනාවරණය කළේය.

වර්ෂ 2002 ක් වූ නිකිණි මස 20 වන දින අප පියාණන්ගේ ජීවිතයේ තවත් ශෝකාකුල දිනයක් විය. දෙස් විදෙස්හි සෞඛ්‍යමය ක්ෂෙත්‍රයේ රැකියාවන්හි නියැලෙමින්, කළුතර ජාතික සෞඛ්‍ය අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ හෙද ආචාරිණියක් සහ උපදේශිකාවක් මෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ක්‍රියාකාරී සාමාජිකාවක් ලෙසින් සමාජයට ඉතා අගනා සේවයක් කළ, දයා සපරමාදු නම් වූ සිය ආදරණීය වැඩිමහල් නැගණියගේ වියෝවද අප

පියාණෝ හදවතින් දරා ගත්හ. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සහකාර කොමසාරිස් ලෙසින් කටයුතු කල මිල්ටන් සපරමාදු සමඟ 1951 දී විවාහ වී දරුවන් සිව් දෙනෙකු විසින් මාතෘත්වයෙන් පිදුම්ලත් ඇය කුරුණෑගල පදිංචිව සිටි අතර, එහිදී සිදුකරනු ලැබූ ඇය ගේ අවසාන කටයුතු සඳහා ද අප පියාණෝ සහභාගී විය.

තම ආදරණීය මව් පියන් ද, සදාදරණීය බිරිඳ ද, එක් කුස උපන් සෙහොයුරියන්ද මෙලොවින් සමුගන්නා ආකාරය සියැසින් දකිමින් අප පියාණෝ දිනෙන් දින වඩ වඩාත් අස්ථිර ජීවිතයේ යථාර්ථය අවබෝධ කර ගත්හ.

වර්ෂ 2003 ක් වූ මැදින් මස 23 දින, සිය පවුලේ ඉතිරි වී සිටි, තම එකම සොහොයුරාගේ අභාවයද කොතරම් සංවේග ජනක වුවද, අප පියාණෝ ධර්මානුකූලව සිත පහන් කර ගත්හ. 1958 දී, ඉංග්‍රීසි ආචාර්ය වරියක වූ ලීලා සපරමාදු සමඟින් විවාහ වූ ජයතිස්ස කිරිවත්තුඩුවගේ නම් වූ තම එකම සොහොයුරු, ගුණවත් දරුවන් පස් දෙනෙකු ලොවට දායාද කරමින්, දිවයිනේ විවිධ දිස්ත්‍රික්ක වල පරිපාලන ක්ෂේත්‍රයේ නියැලෙමින්, පස්සර, ආනමඩුව ආදී ප්‍රදේශයන්හි ආදායම් පාලන නිලධාරි ලෙසින් කටයුතු කර, විශ්‍රාම ලැබීමෙන් අනතුරුව ද සමස්ථ ලංකා බෞද්ධ මහ සම්මේලනයේ කාරක සභික ධුරයක් ද හොබවමින් ආගමික හා සමාජයික වශයෙන් අගනා මෙහෙවරක යෙදී සිටි ආකාරය ද සිහිපත් කරමින්, තම ආදරණීය එකම සොහොයුරාට ද, කිරිවත්තුඩුවේ පිහිටි සිය පවුලේ මුල් නිවසේදීම අප පියාණෝ අවසන් ගෞරව දැක්වූහ.

තමාට දෛවය විසින් උරුම වී තිබූ දීර්ඝ කාලීන වූ ආයු බල මහිමය මත, තම පවුලේ සියළුම ඥාතීන් වෙනුවෙන් අවසන් ගෞරව දැක්වීමට අවස්ථාව ලද අප පියාණෝ, ඒ ශෝකාකුල අවස්ථාවන් තුළින් ද මා හැඟි පන්නරයක් ලබමින්, ජීවිතය පිළිබඳව යථාවබෝධයකින් යුතුව සිය ජීවිතයේ සැඳ සමයට අවතීර්ණ වූහ. පරිනත බුද්ධියෙන් තමා ලැබුවා වූ සියළු අත් දැකීම් හමුවේ සිය ජීවිතයේ සැඳෑ සමයේදී පවා අපව දැනුවත් කිරීම සඳහා ඔහු නිරතුරුවම පෙළඹිණි.

* * *

1998 දී මෙලොවින් සමුගත් සිය නැගණිය
අමරා ගුණසේන මහත්මිය

2002 දී මෙලොවින් සමුගත් සිය වැඩිමහල් නැගණිය
දයා සපරමාදු මහත්මිය

2003 දී මෙලොවින් සමුගත් සිය සොහොයුරු
ජයතිස්ස කිරිවත්තුඩුවගේ මහතා

දිනක්, තාත්තා අප සමග සුහදව කථා කරමින් සිටිය දී මෙසේ ද ප්‍රකාශ කළේය.

"දැන් .. .. .. බලන්නකො .., අපේ අම්මලා තාත්තලා සහෝදර සහෝදරියන් සිටියා. කෝ ? අද ඒ කවුරුවත් නැනේ. කුමන පසුබිමක, කුමන ආර්ථිකයක් මත, කුමන ආකාරයේ තනතුරු වල නිරත වුනත්, පුතා .. .. .. උපන්නා වු සෑම සත්වයෙකුටම, මේ අවසාන ගමන උරුමයි. ඒ බව නුවණින් දැකලා, ජීවත්වන කෙටි කාලය තුල, මේ ලැබුවා වු ශ්‍රේෂ්ඨ මනුෂ්‍යත්වයට නිගා නොවන ආකාරයට ජීවිත පවත්වාගත් අයට, අවසානයේදී තමා කල කී යහපත් දේවල් සිහිපත් වන විට ලොකු සැනසීමක් තිබෙනවා.. .. .. තම තමන් වපුරා ගන්නා දේ තමයි, අවසානයේදී අස්වැන්න හැටියට නෙළා ගෙන යන්නේ"

උපමාවකින් හෝ ප්‍රස්ථා පිරුලකින් තමා අදහස් කරන දේ අන් අයගේ සිත තුල ශක්තිමත් ලෙස පතිත කරවීම ඔහුගේ වාග් ශෛලියේ සුවිශේෂත්වයක් විය.

9

දෛනික ගෘහමය ජීවිතය

එදා.. .. සිංහල අවුරුද්දට අප නිවසේ හිසතෙල් ගෑම චාරිත්‍රානුකූලව පැවතිණි. ඒ සඳහා අවශ්‍ය සියළු දෑ කලට වේලාවට සූදානම් කර තැබීම තාත්තා ගේ සිරිත විය..ගමේ බොහෝ දෙනෙක් එම අවුරුදු චාරිත්‍රය සඳහා අප නිවසට පැමිණියෝය. උත්සවයෙන් අනතුරුව චාරිත්‍රානුකූල ස්නානයෙන් පසු අප පියාණෝ අප සමග එක්ව විනෝදයෙන් අවුරුදු ක්‍රීඩා වල යෙදුණාහ. පංච දැමීම, කැට ගැසීම වැනි සම්ප්‍රදායානුකූල අවුරුදු ක්‍රීඩා ද ඔහු අපට හඳුන්වා දුන්නේය.

අප පියාණෝ පවුලේ සැම දෙනා සමග එකම මේසයකට වාඩි වී ශුභ නැකතින් නව වසරේ පළමුවන දිවා ආහාරය හද පිරි සතුටින් බුක්ති වින්දේය. කිරිබත් කටක් අප මුවග තැබීමෙන් අනතුරුව පොතක් සහ පෑනක් ඔහුගේ අතට ගැනීම සිරිතක් විය. ආදර්ශමත් එක් පාඨයක් කියවීමටත් ලිවීමටත් අපව යොමු කළේය. දිවා ආහාරයෙන් පසු අප, බුලත් හුරුළු සහ තෑගි දී පසග පිහිටුවා වැඳීමේදී, ලැබුවා වූ නව වසර වෙනුවෙන් හද පත්ලෙන්ම නැග එන ආශීර්වාද, රත්නත්‍රයේ පිහිට පතමින් අප කරා යොමු කළේය. අනතුරුව අප දරුවන් ද අපව අනුගමනය කරමින් බුලත් හුරුළු පුදා නමස්කාර කළහ. ඒ අවස්ථාවේදී අප පියාණෝ සැම මුණුපුරු, මිණිපිරියකටම ත්‍රිවිධ රත්නයේ ආශීර්වාද පතමින්, තෑගි වශයෙන් මුදල් කවරය බැගින් සතුටින් පිරි නැමූහ.

අප පියාණෝ කිසි දිනක අර්ථිකමය වශයෙන් විශාල පොහොසතෙකු නොවීය. එහෙත් තමා සාධාරණව, ධාර්මිකව උපයන මුදල දෛනික ජීවිතයට ගැලපෙන අයුරින්

කළමනාකරණය කළේය. අපගේ අධ්‍යාපනය වෙනුවෙන් නොපැකිලිව මුදල් වියදම් කළේය. ඉඩ කඩම් දේපොල, සුඛෝපභෝගී වාහන පසු පස හඹා යාමේ අවශ්‍යතාවයක් ඔහුට නොවීය. තමා පදිංචි නිවහන නොයෙකුත් අවස්ථාවල අපගේ සුව පහසුව තකා නවීකරණය කළේය. ජීවිතයේ කිසිම දවසක කිසිවෙකුට ඔහු ණය වුයේ නැත. අවංක සේවයක් ඉටු කරමින් සාධාරණව ලැබුවා වු වේතනයට ගැලපෙන පරිද්දෙන්ම තම ජීවිතය සකස් කර ගත්තේය.

එදා.. .. අප පදිංචිව සිටි නිවසට යාර තුන්සියයක් පමණ ඈතින් නාන පොකුණක් තිබුණි. ඒ අසල වුයේ විශාල කුඹුක් ගසකි. දවසේ කුමන වේලාවක වුවද එහි ජලය ඉතා සිසිල්ව පැවතුණි. සෑම දිනම අළුයම පාසැල් යාමට පෙර තාත්තා එහි ගොස් ස්නානය කළේය. ඇතැම් දින වල ස්නානය සඳහා අප තිදෙනාවම රැගෙන ගියේය. තරමක් සීතල දිනයක අප මෑණියන් " මේ උදේ පන්දර සීතල නැද්දැයි විමසූ විට .. .. ..

"සීතල තියෙන්නෙ කම්මැලියන්ටයි, ලෙඩුන්ටයි නේ .. .. අපිට මොන හීතලක් වත් නෑ.. .. ආරෝග්‍ය පරමා ලාභා" .. .. ..

යනුවෙන් සිනාසෙමින් ප්‍රකාශ කල ඔහු අළුයම පිනිපොද මත විකසිත වී ඇති පුෂ්පයක නැවුම් සුවඳ විහිදී යන්නාක් මෙන් ප්‍රබෝධයකින් යුතුව ස්නානය සඳහා දිව ගියේය. තාත්තා ඉතාම නිරෝගී ලෙසින් හා කඩිසර බවින් යුතුව සියළුම දෛනික කටයුතු වල නියැළුණේය. අප තිදෙනාද කැටුව නාන පොකුණ වෙත යන දිනයන්හිදී, අප එකිනෙකාගේ දත් මද්දවා පිරිසිදු කොට නාවා තුවායක ඔතා පොකුණ පසෙකින් තබා ඔහු ස්නානය කලේය.

අප තිදෙනාගේ දෛනික සෞඛ්‍ය පුරුදු ගැන සැලකිලිමත් වුවා සේම, තම පාසැලේ සිසුන්ගේ සෞඛ්‍යය තත්තවය පිළිබඳව ද ඉතා සැලකිලිමත් විය. පාසැලේ උදය රැස්වීමට පෙර පන්තිභාර ගුරුවරුන් මෙහෙය වීමෙන් පේළි ගැසී සිටගෙන සිටින සිසු දරුවන්ගේ පිරිසිදු කම දිනපතා නිරීක්ෂණයට භාජනය කල අප පියාණෝ විශේෂයෙන්ම සිසුන්ගේ මුඛ සෞඛ්‍ය පිළිබඳව සැලකිළිමත් වු ආකාරය මට තවමත් මතකය. වේවැල ද අතැතිව එම කාර්යයෙහි නිරත වු ඔහු නිසි ලෙස දත් පිරිසිදු කර නොගෙන පාසැලට පැමිණ ඇති දරුවන්ට දඬුවම් කර ඒ මොහොතේම ඔවුන්ව එම කාර්යය සඳහා යොමු කළහ. දෙමාපියන් විසින් දත් මැද්දවීම, හිස පීරීම, නිය පිරිසිදු කිරීම ආදිය ප්‍රතික්ෂේප කරමින් එය බලහත්කාර කමක් සේ දකිමින් දෙමාපියන් සමඟ උරණ වී පාසැලට පැමිණි සිසුනට එදා අප පියාණන්ගෙන් කිසිදු සමාවක් නොලැබීය. ඒ පිළිබඳව දෙමාපියන් ප්‍රසාදය එල කළ අවස්ථා බොහෝ වීය.

කිසිම දිනක දිවාකාලයේ මොහොතක් වත් නිදා ගැනීමේ සිරිතක් අප පියාණන් ළඟ නොතිබිණි. රාත්‍රියක් නිදි වර්ජිතව සිටිය ද පසුදින රාත්‍රියේ විනා දිවා කාලයේ මොහොතක් හෝ නිදා ගැනීමේ පුරුද්දක් ඔහු සතු නොවීය. සුළු රෝගී තත්වයක් හමුවේ, වෛද්‍ය උපදෙස් මත වුවද ඔහු යහන මත සිටියේ අවදියෙනි. මනා කාල කළමනාකරණයකින් යුතු ව සියළු කටයුතු සැලසුම් කල ඔහු, එමගින් දුන්නා වූ ආදර්ශය අද කාර්ය බහුල සමාජයක සමාජගත වී සිටින අපට ඉතා අගනේය.

සංගීත සංදර්ශණ, චිත්‍ර පට, නාට්‍ය වාදන ආදිය කිසිම දිනක තාත්තා ජීවිතයට ළඟා කර නොගත්තේය. එවැනි දේ සඳහා කාලය හෝ මුදල් වැය නොකළහ. අපට ද එවැනි දේ සඳහා අවසර නොලැබිණි. එවකට සිටි අග්‍රාමාත්‍යවරයෙකු වූ එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා දිවංගත වීමෙන් අනතුරුව, ඒ ශ්‍රීමතාණන් වෙනුවෙන් “ගමනක අවසානය” නමැති චිත්‍ර පටයක් නිශ්පාදනය කරනු ලැබීය. එය නැරඹිය යුතු චිත්‍රපටයක් ලෙසින් දුටු අප පියාණෝ ඒ සඳහා පමණක් පාසැලේ සියළුම සිසුන්ද අප තිදෙනාද රැගෙන ගියහ.

කිසිවිටෙකත් සමාජ රැල්ල දිවෙන දෙසට නිරන්තරයෙන් දිවීමට ඔහු සූදානම් නොවීය. කාලයේ ඇති වටිනාකම අපට විටින් විට ඉතා හොඳින් පහදා දුණි. “අප්පමාදෝ අමතපදං” ගාථා පාඨයද නිතර ඔහුගේ මුවග රැඳී තිබුණි. නුවණින් සිතා බලා අත්‍යාවශ්‍ය කටයුතු වලට මූලිකත්වය දෙමින්, කාලයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට ඔහු පුරුදු වී සිටියේය.

පාසැල් යන කාලයේ දී, උදෑසන තේ සූදානම් කිරීමෙන් අනතුරුව අප අවදි කල ඔහු අපගේ පාසැල් ඇඳුම් පිළිබඳවද සැලකිලිමත් වුණි. තමාගේ ඇඳුම් මෙන්ම අපගේ ඇඳුම් වලද පිරිසිදු බවත් ක්‍රමානුකූල බවත් ඔහු අපේක්‍ෂා කළේය. පොත් පත් ආදිය ද නිසි ලෙස සූදානම් කරගෙන ඇත් දැ’ යි ඔහු සුපරීක්‍ෂාකාරී විය. පිට කවරයක් නොදා පොත් පාවිච්චි කිරීමට අපට අවසර නොලැබීය. බස් රථයේ යාම සඳහා ලබා දී තිබූ වාර ප්‍රවේශ පත්‍රය දිනපතාම අපට සිහිපත් කළේය. අමතක වීමකින් හෝ එය නොමැතිව ගමන් කිරීම වරදක් බව අපට පෙන්වා දුනි. විභාග, සම්මුඛ පරීක්‍ෂණ ආදියට ඉදිරිපත් වන දින වලදී අප රැගෙන යන, නොයන දේවල් පිළිබඳව ඔහු වඩාත් සැළකිලි මත් විය.

මා සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටි දිනයක් මගේ මතකයට නැගේ. අවශ්‍ය සියළුම සහතික ගත්තේ දැ’ යි ඔහු මාගෙන් ප්‍රශ්ණ කළේය. මම නැවතත් ලිපි ගොනුව පරීක්‍ෂා කොට තාත්වික ලෙස ප්‍රතිචාර දැක්වීමි. එයින් සෑහීමකට පත් නොවූ ඔහු ලිපි ගොනුව අතට ගෙන එකින් එක පරීක්‍ෂා කළේය. අවශ්‍යම වී තිබුණ කැඳවීම් ලිපිය එහි

නොවීය. මගේ නොසැලකිලිමත්භාවය පිළිබඳව මට ඉතා තදින් දෝෂාරෝපණය කළේය. කරන කියන සෑම කටයුත්තකදීම ඉතා හොඳ අවධානයකින් යුතුව සූදානමක් තිබිය යුතු බව මම එදින අවධාරණය කර ගතිමි.

සෑම කටයුත්තක්ම පිලිවෙළකට, නිවැරදිව සහ කාර්යක්ෂමව කිරීමට අප පුරුදු පුහුණු කරවීම අප පියාණන්ගේ අරමුණ වුයේය. අද වාණිජකරණයට හසු වී හිස් ලූ ලූ අත දුවමින් දෛනික කාර්යයන්හි යෙදෙන සමාජගත මිනිසා විසින් අතපසු වන කාර්ය භාරයන් බොහෝය. කාර්යාලයකට පිවිසියද බොහෝවිට දක්නට ඇත්තේ අකාර්යක්ෂමතාවය නිසා ගොඩ ගැසී ඇති ලිපි ගොනුය. කුමන කාර්යක නිරත වුව ද, එය ක්‍රමානුකූලව සහ කාර්යක්ෂම ලෙස අවසන් කිරීමට පියාණන් ගෙන් ලද ආභාෂය, වේගයෙන් දිවෙන මෙම වත්මන් සමාජයේ ගැවසෙන අපට ආශීර්වාදයක්ම වී ඇත.

✵ ✵ ✵

සාම කාමී වතාවරණයක් නිවස තුල පවත්වාගැනීම, අප පියාණන් ගේ අභිප්‍රාය වුයේය. රණ්ඩු දබර, කෑ කෝ ගැසීම්, ඇණ කොට ගැනීම් අප පවුලේ කිසි විටකවත් නොවීය. සාමාන්‍ය කථා බහකදී පරස්පර විරෝධී අදහස් මතුවී ආවේ වුවද , “කල්පනා කරල බලමුකෝ.. .. .. ..” කියමින් එම මාතෘකව තාවකාලිකව ඈත් කර තැබීමට ඔහු සමත් විය.

එහෙත් අන් අයගේ අදහස් වලට ද ඔහු ගරු කළේය. විශේෂයෙන් අපගේ කටයුතු පිළිබඳව තීරණ ගැනීමේදී, අප මෑණියන්ගේ අදහස ට වඩාත් ගරුකළේය.

එක් සිද්ධියක් මගේ මතකයට නැගේ. .. ..

අප පාසැලේ අධ්‍යාපන චාරිකාවක් සඳහා මට දෙමාපිය අවසරය අවශ්‍ය විණි. නරඹන ස්ථාන හා සහභාගී වන ගුරුවරුන් පිළිබඳවත් ශිෂ්‍ය නායිකාවක් වශයෙන් මා සතු වගකීම් පිළිබඳවත් කරුණු විමසූ තාත්තා සිය කැමැත්ත ප්‍රකාශ කළේය. අවශ්‍ය මුදල් දීමටද එකඟ විය. එහෙත්, “අම්මගේ අදහසත් බලමු .” යනුවෙන් අදහසක් ද ඉදිරිපත් කළේය.

මම එවකට, මිශ්‍ර පාසැලක් වූ පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයේ ඉගෙන ගනිමින් සිටියෙමි. යෝජිත අධ්‍යාපන චාරිකාව දින දෙකක ට සැලසුම් කර තිබුණි. එම ව්‍යවස්ථික තත්වයන් හමුවේ අම්මාගේ කැමැත්ත මට නොලැබිණි. මසිතට විශාල වේදනාවක් දැණිනි.

මාගේ තත්තා මා සනසමින් "අම්මා කියන කථාවෙත් ඇත්තක් තියෙනවා, පුතා .. .. අපි බලමුකො කල්පනා කරල. තව සති දෙක තුනක් තියෙනවනෙ.. .. .. ..". කියමින් උදා වූ තත්වය අනාගතයට භාර කළේය.

තම බිරිඳගේ අදහසකට ගරුකිරීම මදි පුංචි කමක් සේ දකින අද සමාජයේ ඇතැම් පියවරුන්, තම මතයේම දැඩි ලෙස එල්බ සිටිමින් මව්වරුන්ගේ අදහසට එරෙහිව ඒකමතිකව තීරණ ක්‍රියාත්මක කිරීමට යාම නිසා පවුල් අවුල් වී ගිය අවස්ථා බොහෝය. මත් වතුරට තම බුද්ධිය බිලි දී, බිරිඳට ගුටි බැට වලින් සංග්‍රහ කරමින් පුරුෂාධිපත්‍ය පහත් ලෙස එළි දක්වන පියවරු බොහෝය.

අප පියාණෝ කිසි දිනක අප ඉදිරියේ මෑණියන්ගේ අදහස් හෙළා දැක්කේ නැත. එවා වෙනස් කල අවස්ථා ඇතත් ඒ ඉතා මත් කල්පනාකාරීව ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුතුවමය. ජීවිතයේ කිසිම දිනක අප මෑණියන්හට සුළු වශයෙන්වත් මානසික හෝ ශාරීරික වධ හිංසා පමුණුවා නැත. අඩු තරමින් රළු වචනයකින් හෝ ඇය අමතා නැත. එවන් වචන කිසිවක් ඔහුගේ සුචරිතවත් වාග් මාලාවේ නොවීය. මෑණියන් පිළිබඳව කථා කල සෑම ස්ථානයකදීම "අපේ ඉස්කෝලහාමිනේ" යනුවෙන්ම ඇය හඳුන්වනු ලැබීය.. මෑණියන් කෙරෙහි පැවතිය යුතු ගෞරවය නිතරම ආරක්ෂා කළේය. අප පියාණන් සෑම අවස්ථාවේදීම ඉතා බුද්ධිමත් ලෙස පවුලේ මානසික සෞඛ්‍ය රැක ගත් තේය. එය ඉතා ශ්‍රේෂ්ඨ මෙන්ම සෙනෙහෙබර පියෙකුගේ යුතුකම ද වන්නේමය.

* * *

ජීවිතයේ සෑම අවස්ථාවකටම තාත්තා ඉතා සැහැල්ලුවෙන් මුහුණ දුන්නේය. කොතරම් හිත් වේදනාවකින් සිටින අයෙක් වුවද විනාඩි කීපයකින් සනසා, ඒ මුවගට සිනහ රැල්ලක් නගාලිය හැකි අන්දමේ එක්තරා සුවිශේෂ වූ ක්‍රමවේදයක් ද තාත්තා සතුව තිබුණි. සදාචාරාත්මක ලෙස විහිළු තහළු කිරීමේ එම හැකියාව කුඩා කාළයේ සිටම ආවේනිකව තිබු දෙයක් යැයි පැවසේ.

විජයසේන කිරිවත්තුඩුව මහතා සුපුරුදු නිවහනේදී .. ..

අප නිවසේ කිසිවකුට ද්වේශයෙන්, කෝපයෙන්, වෛරයෙන් හෝ නුරුස්න ස්වභාවයෙන් යුතුව මොහොතක් හෝ සිටිය නොහැකි විය. එය ගෘහ මූලිකයා වූ අප පියාණන්ගේ දක්ෂතාවයම විය. නිවස තුල ඔහු අපේක්ෂා කලේ විනෝදකාමී පරිසරයකි. වගකීම්, යුතුකම් හමුවේ බුද්ධිමත්ව සහ ඉතා දුර දර්ශීව තීරණ ගන්නා නමුත්, ඔහු තම මනස නිරන්තරයෙන්ම ඉතා සැහැල්ලුවෙන් තබා ගත්තේය. දෛනික ජීවන ගැටළු මත, මහ මෙර පච්ච හිස මත දරාගෙන සිටින්නාක් මෙන් අයෙක් අප නිවසට පැමිණියද, ඔහු තාත්තා සමඟ කථා බහ කිරීමෙන් අනතුරුව, තේ කෝප්පයකින්ද සංග්‍රහ ලබා පිටව යන්නේ මුවගට සිනහා රැල්ලක් නගා ගෙන මහත් සැනසීමකිනි. තාත්තාගේ ඇතැම් ප්‍රකාශන සිහිපත් වන වාරයක් පාසා අප කාගේත් මුවග ඉරියව් වෙනස් වන්නේ එවා ප්‍රමාණවත් සංවේදී භාවයක් හදවතට ලබාදුන් බැවින්මය..

එක සිද්ධියක් මගේ මතකයට නැගෙයි.

දිනක් අප මැණියන්, පවුලේ සාමාන්‍ය ගැටළුවක් හමුවේ තාත්තා ඉදිරියේ මෙසේ කීය.. .. ..

"විහිළු කර කර ඉන්නවා මිසක් කිසි දේක බරක් පතලක් නෑ .. .. .."'

අප මැණියන්ට අවශ්‍ය වුයේ උදා වූ ගැටළුව හමුවේ කිසියම් විසඳුමක් විය හැකියි.

බොහෝ දේවල් ඉතා සරලව හදවතට ගන්නා තාත්තා .. .. .. ක්ෂණිකවම විශ්මය ජනක ස්වරූපයක් මුහුණේ මවාගනිමින් .. ..

"... .. පතල් ?... .. පතලක් .. නම් .. .. ඉතින් මේ හරියේ නැනේ .. .. එවා බලන්න නම් ඉතින් රත්නපුර පැත්තේ යන්න ඕනැ . අපොයි ! දැන් බෑ .. .. මේ වෙලාවේ රත්නපුරයේ යන්නෙ කොහොමද ? බරක් නම් .. .. නෑ කියන්න බෑනේ ඉතින් ඕන දේක බරක් තියෙනවා"......... කියමින් ගේ තුලට ගියේය.

මොහොතකින් පත්තර කිරන තරාදිය ගෙනවිත් අම්මා ඉදිරියේ තබමින් .. ..

"..හා.. .. .. හොඳයි දාන්න බලන්න ඕකට."

"-මොනවද ?"- .. .. (අම්මා, මොහොතකට කලින් කීදෙය ඇයට අමතක වී තිබිණි.)

"... .. ඕන දෙයක් දාන්න. මම බර පෙන්නනන්නම්. ඇයි ? දැන් කිව්වේ කිසිම දේක බරක් නෑ... කියලා."

අප පියාණෝ සියළු යුතුකම් ඉටු කරමින් විටෙක කුඩා ළමයෙකු මෙන් විනෝද වෙමින් නිවසේ සැමදෙනා විනෝදයෙන් හා සතුටින්ම තැබීමට සමත් වූහ. අප නිවසට එන යන අසල්වාසීන් සහ ඥාති මිත්‍රාදීන්ද නිවසින් නික්ම ගියේ හද පිරි සතුටකිනි.

10

ජීවිතයේ සැඳෑ සමය

මුළු ජීවිත කාලයම අර්ථවත් ලෙස ගත කරමින්, ගිහියෙකුට තම චිත්ත සන්තානයේ පහළ කර ගත හැකි උතුම් ප්‍රීතිමත් සැප හතරම (අත්ථි සුඛය, භෝග සුඛය, අනන සුඛය, අනවජ්ජ සුඛය) බුක්ති විඳිමින්, අප පියාණෝ වයස අවුරුදු හැත්තෑ නමයේදී පමණ සැඳෑ සමයට පා තැබුවේය. ඒ වන විට ද සාමාන්‍ය ප්‍රමාණයේ පැහැපත් නිරෝගී සිරුරකට හිමිකම් කියන්නට ලැබීම විශාල භාග්‍යයක් විය. ඔහු ගේ වේගවත් ගමන් විලාශය දකින්නන්ගේ සිත් සතන් අවදි කළේය. ඔහුගේ ක්‍රියාශීලී භාවය ගෙවත්ත දකින සැමදෙනට එතුළින් විනිවිද පෙනුණි. ගමන් බිමන් යෑමටද විශාල කැමැත්තක් දැක් වූ ඔහු ජීවිතයේ තමා ලද යහපත් අත්දැකීම් පිළිබඳව බාල- තරුණ-මහළු කා සමග වුවත් කථා බහ කරමින් වටිනා ආදර්ශ ඔවුන් වෙත තිළිණ කරන්නට විය. අතීතය පිළිබඳව ඉතා පැහැදිලි වූ නිවැරදි මතකයක් තිබූ ඔහු ඉතා සතුටින් තම අතීතය ආවර්ජනය කළහ.සිදු කලා වූ සියළුම යහපත් ක්‍රියාවන් නුවණින් දැක, සැනසුම් සුවයෙන් කල් ගත කළේය. එය එලොව මෙලොව දෙකටම සැපත ළගා කරන බවද ,ඔහු විසින්ම ඇතැම් අවස්ථාවල ප්‍රකාශ කළේ ධම්ම පදයේ එන .. .. ..

"ඉධ මෝදති පෙච්ච මොදති - කතපුඤ්ඤෙදා් උභයත්ත මෝදති
සෝ මොදති සො පමොදති - දිස්වා කම්ම විසුද්ධ මත්තනො"

යන ගථා පාඨයද කට පාඩමින්ම උදාහරණ ලෙස ගෙන හැර පාමිනි. ඔහු සමාජ සදාචාර ධර්මයන් ගැන මෙන්ම බෞද්ධ ධර්මය ගැනද හසළ දැනුමක් ලබා තිබුණේය.

සෑම අවස්ථාවක දීම අවස්ථාවට ගැලපෙන ගාථා පාඨයක්, ප්‍රස්ථා පිරුළක් හෝ [illegible] වදනක් ඔහුගේ මුවගට නිතැතින්ම ගලා ආවේය.

අධ්‍යාපනික සමාජයීක ආගමික උත්සවයන් සඳහා ආරාධනා ලැබීම ඔහුට විශාල සතුටක් විය. 1999 දී පූජණීය අචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් සහ කොළඹ - හුණුපිටිය ගංගාරාම පරිවෙනාධිපතිව වැඩ සිටි මාලිම්බඩ ගුණානන්ද ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල සිරි සුදස්සනාරාම විහරස්ථානයේ දී පවත්වන්නට යෙදුණු ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමේ දෙවන වාර්ෂික ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයට ඔහු ආරාධිත අමුත්තෙකු ලෙසින් සහභාගී විය.

විදේශීය ශිෂ්‍යත්වයක් මත අධ්‍යාපනය ලබන අතර තුරදීම, ශ්‍රී ලාංකික දරුවකුගේ ශිෂ්‍යත්වයක් සඳහා, ජපානයේ සිට පූර්ණ අනුග්‍රාහක දායකත්වය දරණ සිය ජ්‍යෙෂ්ඨ මුණුපුරා වෙනුවෙන් එම ශිෂ්‍යත්වය ප්‍රදානය කිරීම සඳහා ඔහු ඒදින එම ආරාධනය ලැබුවේය. පාසැල් සිසු සිසුවියන් දහස් ගණනකගේ නෙත් පැදූ තමා වෙත ජීවිතයේ සැඳෑ සමයේදීත්, එවන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා ලැබුණා වූ අවස්ථාව විටින් විට හද පිරි සතුටින් යුතුව ස්මරණය කරන්නට විය.

1999 පැවති ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ දෙවන ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී ශිෂ්‍යත්වලාභී දැරියකට විජයසේන කිරිවත්තුඩුව මහතා ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරමින්

දරුවන් තිදෙනෙක් ලොවට දායාද කොට නිසි අධ්‍යාපනයක් ලබා දී මුළු මහත් සමාජයට ඵලදායී ලෙස රජයේ ගෞරවණීය රැකියා තනතුරු වලට යොමු කරවමින් නිසි කල චාරිත්‍රානුකූලව ආවාහ විවාහ කටයුතු ද ඉටුකර දීමෙන් අනතුරුව ඔහු වඩාත් සැහැල්ලු අන්දමින් ජීවිතය දෙස බැළුවේය. ජීවිතයේ තමා බලාපොරොත්තු වූ එම ඉලක්කය කරා සාර්ථක ලෙස ළඟා වීමට හැකිවීම ඔහු ගේ මානසික සැනසීමට හේතු විය. කල යුතු කාර්යයන් පසු පස විනා, මිල මුදල් හා දේපල පසු පස හඹා යාමේ රුචිකත්වයක් තමා සතුව නොවුන බව, ඔහු නිරතුරුවම ඉතා සතුටෙන් ප්‍රකාශ කලේය.

"බලන්න පුතා , ...,. අද වන විටත් ඔය යාන වාහන, ඉඩ කඩම්, ගෙවල් දොරවල් ආදී භෞතිකමය සම්පත් මා සන්තකයේ තිබුණා නම් මට එක විශාල මානසික ගැටළුවක් නෙ. දැන් මට " මගේය" කියලා කිසිම බැඳීමක් නෑ නේ. මම ආපු පාර හරි. ඒ නිවැරදි මග සිහි වන විට මට විශාල සැනසීමක් තියෙනවා.. .. .. අපට හැමදාම ජීවත් වන්න බැනේ .. .. .. පුතා. අපි සුදානම් වෙලා ඉන්න ඕනැ කථා කරන කොට යන්න .. ..

අනිත් කාරණය පුතා .. .. .. මම ජීවිතයේ කිසිම කෙනෙකුට කිසිම දිනක කිසිම දෙයකින් ණය වෙලා නෑ.. . .. . එහෙම ණය වෙලා තිබුණ නම් මට අද සැනසීමක් නැනේ .. .. "

යනුවෙන් දිනක් ඔහු අප සමඟ ප්‍රකාශ කළේ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ..අනන සූත්‍රයේ එන අනන සුඛය යන්නෙහි හරය ද ඉතා පැහැදිලිව එළි දක්වමිනි. අඩු තරමින් බැංකුවකට හෝ ණය නොවීම දුර්වල කමක්, අඥාණ කමක් සේ දකිමින් වාණිජ රැල්ල ඔස්සේ දුවන වත්මන් සමාජගත මිනිසාට මෙවන් සැපයක් කෙලෙස කාව දා ළඟා කර ගැනීමට හැකිවේදැ යි මට සිතිණි.

ඔහු විශාල සැනසීමකින් සිය ජීවිතයේ අවසාන කාලය ගතකරන බව අපට පැහැදිලි විය. සැඳෑ සමයේ සඳ කිරණින් නැහැවෙමින් සිටි ඔහුට ඉඩ ඇති සෑම විටම අපි සමීප වුනෙමු. සුහදව විනෝදයෙන් පිළි සඳරයේ යෙදුණි. ඔහු විසින් කරනු ලැබූ ඇතැම් ප්‍රකාශයන් සිහිපත් වීම පවා අපට මහත් සතුටක් ගෙන දුණි. විනෝද කාමී බව ඔහුගේ ජීවිතයට ආශීර්වාදයක් වී තිබුණි. අප පියාණෝ මෙම අදියර, සියළු බැම් වලින් මිහිල්ව ඉතාමත් සැහැල්ලු සිතින් ගත කළේය.

මම දිනක් තාත්තාට මෙසේ කීවෙමි.

" තාත්තේ .. .. .. මම කවදාහරි තාත්තා ගැන පොතක් ලියනවා".. එවිට තාත්තා .. .. "ඔව් පුතා .. .. .. එක හොඳ අදහසක්. එකෙනුත් ඉතින් කාට හරි ප්‍රයෝජනයක් වේවි. අවශ්‍ය කරුණු ටික ලියාගන්න. නැත්නම් අමතක වෙවි "

තාත්තා හැම දේකටම හොඳ සූදානමක් තිබුණ කෙනෙකු බැවින් ඔහු ඒ සඳහා ද මාව සූදානම් කරවන්නට උත්සුක වූයේය.. මා නොදැන තිබූ බොහෝ කරුණු ඔහු පැහැදිලි කරන්නට විය. ඒ සියල්ල මම සටහන් කර ගතිමි.

අනතුරුව ඔහු මා අමතා මෙසේ ප්‍රකාශ කලේය.

"… ..පුතා .. .. .. අද සමාජයේ මොන යහපත් දෙයක් කරන්න ගියත් ,වැඩි දෙනෙක් සූදානම් වන්නේ, පුළුවන් නම් එක නොකෙරෙන තැනට වැඩ සලස්සලා දෙන්න… හොඳ දෙයක් අගය කරලා තවත් ඉදිරියට යන්න වචනයකින් හරි ශක්තිය ධෛර්යය දෙන්න තරම් ගුණ නුවණින් පිරිපුන් මිනිස්සු අද සමාජයේ බොහොම අඩුයි. ඒ නිසා පුතා .. .. .. මොන දෙයක් කලත් කල්පනාවෙන් කටයුතු කරන්න ඕනැ .. එල ඇති රුකට තමයි ගල් පහරවල් වදින්නේ. නිකම්ම නිකං ගහක් තිබුණාට මිනිස්සු ගල් ගහන්නේ නෑ ..නේ .

එත් හෘදයසාක්ෂියට එකගව යහපත් අරමුණකින් කරන කටයුතු හමුවේ පසුබසින්න අවශ්‍ය නෑ.. .. **ධර්මානුකූලව ජීවත් වන්නා ධර්මය විසින්ම ආරක්ෂා කෙරෙනවා.** එක ඕනෑම කෙනෙකුට තම බුද්ධිය මෙහෙයවා අත් දකින්න පුළුවන් සත්‍යයක්. එකනේ.. .. ඉංග්‍රීසි ප්‍රස්ථා පිරුලක් තියෙන්නේ.. ..' Truth comes to the surface'.. .. කියල. මොන විදියේ මවා පෑම් සමාජයේ තිබුණත්, මොන ආකාරයේ කඩතුරාවන්ගෙන් සත්‍ය යටපත් වී තිබුණත් කවද හරි සත්‍යය එලි දකිනව .. .."

ඔහු විසින් නිහඬව, කොතරම් යතාර්ථවාදී ලෙස සමාජය විශ්ලේෂණය කර ඇති දැයි මම සිතන්නට වීමි. සැදෑ සමයේ දී තමාට සිහිපත් කිරීමට සහ අන් අය දැනුවත් කිරීමට ගුණ ධර්ම සමගින් දැනුම් සම්භාරයක් තාත්තා සතුව තිබුණි.

✸ ✸ ✸

වසර දහයක පමණ සිට රාජගිරියේ පදිංචිව සිටින අප, සතියකට වරක් හෝ දෙකක් තාත්තා ගේ සුව දුක් බැලීමට යාම සිරිතක් විය. මෙම අදියරේදී අප සමග පැය කීපයක් සතුටු සමිචියේ යෙදීමට ලැබීම ඔහු ඉතා අගය කලේය. මා එහි ගිය සෑම අවස්ථාවකම, ඔහුගේ ජීවිතයේ මූලික විස්තර මම ටික ටික අසා ලියාගත්තෙමි. අප ඉපදීමටත් පෙර ජීවිතයේ තොරතුරු සහ රාජකාරිමය තොරතුරු තාත්තා ඉතා පැහැදිලිව ඉතා හොඳ මතකයකින් යුතුව ප්‍රකාශ කලේය. එසේ නොවූ යේ නම් සවිස්තරව මෙම කරුණු එළි දැක්වීම මට තරමක ගැටළුවක් වන්නට ඉඩ තිබුණි.

බොහෝ විට මම, තාත්තා බැලීමට ගියේ මගේ ස්වාමිපුරුෂයා සමගිනි. ඇතැම් අවස්ථාවලදී මගේ කණිටු පුතු කැටුවද ගියෙමි. පවුලේ කාර්ය බහුලත්වය නිසා මම විටෙක තනියම ද ගියෙමි.

එවන් දින වල තාත්තා සතුටින් තබා ආපසු පැමිණීම මට ඉතා අපහසු කාර්යයක් විය.

" පුතා .. ..තනියමද ? ආවෙ.. .. ..ඇයි මහත්තයා පොඩි පුතාලා එහෙම අද වැඩද? . . . .. **ආපහු යන විට මම පුතත් එක්ක එන්නම්**. මට පුතා ගෙදරට ගියාට පස්සේ, ආපසු බස් එකේ එන්න පුළුවන්. තනියම ,පාරවල් වල - හොඳ නැහේ පුතා .. .. මේ කාලයේ කාර් එකේ යන්න එන්න " .. .. ..

යනුවෙන් පවසමින් . .. තාත්තා මගේ ආරක්ෂාව පතා ආපසු ගමනේදී මා සමඟ එක් වීමට දැඩි උත්සාහයක් ගත්තේය.

මෙම අදියර වන විට එම නිවසේ පදිංචිව සිටියේ, අප මෑණියන්ගේ එක් සොහොයුරියක් පමණි. ඇය අවිවාහක අයෙකු වූවය. අප මෑණියන්ගේ පවුලේ අනිකුත් සියළුම සදාතීන් ද ජීවිතයෙන් සමුගෙන තිබුණි. නමින් ඇලිස්නෝනා පෙරේරා හෙට්ටිආරච්චි වූ ඇයගේ ජීවිතයටද අප පියාණෝ මහත් ශක්තියක් වූහ. ආර්ථික මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් ඇයගේ ජීවිතයට ද මහත් ආලෝකයක් ලබා දුන් අප පියාණෝ ඉතා යහපත් වූ වාතාවරණයක් නිරන්තරයෙන්ම නිවස තුල පවත්වා ගැනීමට සමත් වූහ.

විජයසේන කිරිවත්තුඩුව මහතා
සිය නැණන්දිය සමග

කාලයාගේ ඇවෑමෙන් සිය කෑම රුචිය අඩු වීමේ හේතුවෙන් තරමක රෝගී භාවයකට පත් විය. නොයෙකුත් අවස්ථා වල වෛද්‍ය වරුන් ළඟට ගෙන යමින් වෛද්‍ය උපදෙස් අනුව සියළු වෛද්‍ය පරීක්ෂණ වලට භාජනය කෙරිණි. පෞද්ගලික සත්කාර නිවාසයන්හි දී නේවාසිකව තබමින් විවිධ වෛද්‍ය පරීක්ෂණ සඳහා යොමු කළෙමු. එහෙත් සියළුම වෛද්‍ය වාර්තා, වෛද්‍ය වරුන් පවා මවිතා කරවීමට හේතු විය. එම වයසේ බොහෝ රෝගීනට පොදු වේ ඇති කිසිදු ආබාධයක් එම වාර්ථා වල නොවීම එයට හේතු විය. දියවැඩියාව, සීනි ප්‍රමාණය අධික වීම, අධි රුධිර පීඩනය වැනි කිසිම රෝගයක සංඥාවක් වත් එ වෛද්‍ය වාර්තා වල පෙන්නුම් කර නොතිබුණේය.

" සීයා.. .. .. සිගරැට් එහෙම බිව්වෙ නැද්ද ?" කියලා ඇතැම් වෛද්‍ය වරු අසද්දී "මම ජීවිතේට සිගරැට්, මත් පැන් තොලගාලාවත් නෑ" යනුවෙන් ඉතාමත් ශ්‍රේෂ්ඨ ලීලාවෙන් පිළිතුරු දුන්නේය. ඔහු තම ආත්මාභිමානය ජීවිතයේ අවසන් මොහොත දක්වාම රැක ගත්හ.

මෙම අදියරේදී, පියාණන් අප නිවසේ රඳවා ගැනීමට මා උත්සාහ කළ ද ඔහුගේ වැඩි කැමැත්ත වුයේ ජීවිතයේ වැඩි කලක් ගතකල සුපුරුදු නිවසේම කල් ගත කිරීමටයි.

වරක් මගේ සොහොයුරු සරත්, කෙසේ හෝ ඔහු ගේ කැමැත්ත ලබාගෙන ටික දිනකට අප නිවසට රැගෙන ආවේය. මා ඉතා සතුටින් මාගේ පියාගේ තරමක් වැවී තිබු කෙස්ද, නිය පොතු ආදියද කපා නාවා පිරිසිදු කොට සති කීපයක් හෝ අප නිවසේ රඳවා ගැනීමට බොහෝ සේ උත්සාහ කළෙමි. වරකට ගන්නා වු ආහාර ප්‍රමාණය සීමිත වුයෙන්, හෝරවන් දෙකින් දෙකට, කිසියම් රසවත් ආහාරයක් කුස තුලට ලබාදෙමින් මම අති මහත් තෘප්තියක් ලැබුවෙමි. සියළු සැප පහසුකම් ලබා දුන්නේ වුවද ,ඔහු දවසේ වැඩි කාලයක් ගතකලේ මග බලා හිඳිමිනි. මෝටර් රථයක නලා ශබ්දයක් ඇසෙන සෑම වාරයකම ඔහු මෙසේ ප්‍රකාශ කලහ.

" මම මේ බැළුවේ බේබි මහත්තයා ද කියලා - (විටෙක එසේ අමතනු ලැබුවේ සිය එකම පුත්‍ර රත්නයටයි). මාව ගෙදර එක්ක යන්න "ගිහින් එන්නං" කියලයි ගියේ.. .. .. ..තවම නෑනේ" කියන ඔහු අවසානයේදී මෙසේ ද කියයි. .

" පාරවල් වලත් හරියට වාහන තදබද නේ .. ..අනික.. .. එයාටත් ඉතින් සෑහෙන රාජකාරි තියෙන වානේ .ගිහිං .. ..එපා යැ ..එන්න , තවම ගිහින් නැතුව ඇති. නැත්නම් පුතා නැවිත් ඉන්නේ නෑ..දැන් රෑත් වුනා . මම හිතන්නේ හෙට උදේම එවි. උදෙන්ම ලෑස්ති වෙලා ඉන්න ඕනෑ .. .."

අපි අප්‍රමාදව එම අදහස එසේම අනුමත කොට තාත්තා ද සමග නින්දට පිවිසියෙමු. නමුත් පසු දිනද එසේම ප්‍රකාශ කරමින්, සුදානම් වී පාර බලාගෙන සිටීම සිරිතක් විය. තමාට හුරු පුරුදු එම නිවසේ ම ජීවත්වන අප මෑණියන්ගේ සොහොයුරියගේ තනි වීම පිළිබඳව ද නිතර සිහිපත් කල ඔහු කොතෙක් සැප පහසු කම් ලැබුණ ද දීර්ඝ කාලීනව අප නිවෙස් වල රැඳී සිටීමට වැඩි කැමැත්තක් දැක්වුයේ නැත. අවසානයේදී ඔහුගේ මානසික තෘප්තිය ගැන සිතා සුපුරුදු නිවසට රැගෙන ගියෙමු.



විජයසේන කිරිවත්තුඩුව මහතා ජීවිතයේ වැඩි කොටසක් දිවි ගෙවූ, හෝමාගම දීපංගොඩ පිහිටි සුපුරුදු නිවස

දිනක් මගේ මිතුරියක් තාත්තා බැලීමට ගියාය. තාත්තාගේ රැවුල තරමක් වැවී තිබෙනු දුටු ඇය .. .. " අද තාත්තා රැවුල කපලා නෑ .. නේ" යනුවෙන් පවසා ඇත. එයට ප්‍රතිචාර දැක් වූ තාත්තා මෙසේ ප්‍රකාශ කර ඇත.

" නෑ.. .. . ඒ තරම්ම වැවී නෑ .. .. නේද ? ඕවා කපන්නේ 'බේබි හාමිනේ පුතා' ආවහම තමයි. (මිතුරන් ඉදිරියේ, විටෙක මා ගැන පවසද්දී එසේ ද හඳුන්වනු ලැබීය.) එයා වෙලාවට එනවා. වැවිලා වැඩි නම් .. .. ..ඕ..න්න බලමු .. ..එයා හෙට උදේම එනවා.. . .. ..හා.. ..බලමු නැද්ද කියලා" යනුවෙන්, නිරතුරුවම විහිළු කිරීමට කැමති තාත්තා සිනහ මුසු මුවගින් පවසා ඇත.

එවිට මගේ මිතුරිය .. .. "සීතා ට ත් හරියට වැඩ, නේද ? තාත්තේ" යනුවෙන් පවසමින්, තාත්තා සමඟ තවදුරටත් සුහදශීලීව කථා බහට එළඹ ඇත.. ..

" ඒ කොච්චර වැඩ තිබුණත් එයා වෙලාවට එනවා. ආවහම රැවුල විතරක් නෙමෙයි.. .. .. ..කොණ්ඩයත් කපනවා. ඒ විතරක් නෙමෙයි නාන්නත් එපා යෑ..... ඒ.. තියා.. .. .. මගේ ඇඳ ඇතිරිලි, ඇඳපු ඇඳුම් සේරම මාරු කරලා වෙන එවා දාලා, කිලුටු රෙදි සේරම අරන් යනවා සෝදලා ගේන්න. දවසක් ඇඳපු ඇඳුමක් වත් පේන්න තිබුණොත් එකත් ගෙනියනවා..එවා වෙන කාටවත් සෝදන්න ඉඩ තියන්නේ නැහැ.. .. . වෙළාවට එනවා මාව 'ක්ලීන්' කරලා යන්න .. .. .. .එයාට හැමදේම පිළිවෙළට ඕනැ ..නේ." යනුවෙන් තාත්තා සුහද ශීලීව ඇය සමඟ පවසා ඇත.

සිය සෞඛ්‍ය තත්වය පිළිබඳව මා එම අදියරේදී ඉතා සැලකිලිමත් බව තාත්තා අවබෝධ කරගෙන තිබුණි. ඔහු මා පැමිණෙන තුරු, දැඩි විශ්වාසයකින් යුතුව, අපේක්‍ෂා සහගතව සිටියේය. මා ඉමහත් සතුටකින් යුතුව නිසි ලෙස එම කාර්යයන් සඳහා මූලිකත්වයක් දෙන බවට ඔහු තුල පැහැදිලි විශ්වාසයක් තිබුණි. අප ඉදිරියේ මෙන්ම අප මිතුරු මිතුරියන් ඉදිරියේද ඔහු ඒ සියල්ලක් අගය කළේය.

ශාරීරික වශයෙන් ඉතා දුර්වල තත්වයක සිටියදී ද , සිය පුත්‍ර රත්නය සමඟ එක්ව, මාසික විශ්‍රාම වැටුප ලබා ගැනීම පිණිස ඔහු හෝමාගම තැපැල් කාර්යලයට ගියේය. සුපුරුදු ලෙසින්, 2005 ඇසළ මස 11 වන දින ද එහි කැටුව යාමෙන් අනතුරුව අප පියාණෝ, නිසි අවධානයකින් යුතුව එම කාර්යය සඳහා ද සුපුරුදු පරිදි සිය අත්සන යොදා ඇත. ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් ලැබූ ඔහු රජයේ සේවය නිතැතින්ම අගය කළේය. ආත්ම ශක්තියකින් යුතුව ජීවිතයේ අවසාන භාගයට මුහුණ දීමට එය මහත් සේ ඉවහල් වන බවත්, කිසිවකුට ණය ගැති නොවී ජීවත්වීමට එම මූල්‍යමය ස්ථාවරත්වය ජීවිතයේ සැඳෑ සමයට ආශීර්වාදයක් බවත් පැවසූ ඔහු රාජ්‍ය සේවය ප්‍රශංසාවට ලක් කළේය.

දින කීපයක් ගතවිණි. ඔහු ගේ මුවගින් ගිලිහුණු සෑම වචනයකම අර්ථවත් බවක් ගැබ්ව තිබුණි. එහෙත් අවසානයේදී... .. කෑම රුචිය වඩවන 'සිරප්' එකකට අමතරව කිසිදු වෛද්‍ය උපදෙසක් නොවිය. කෑම රුචිය දිනෙන් දිනම ඔහු තුළින් පලා යන්නට විය. ක්‍රමයෙන් ශාරීරික වශයෙන් දුර්වල විය. විටින් විට වෛද්‍ය උපදෙස් අනුව නිවසේදීම 'සේලයින්' ලබාදීමට කටයුතු කළෙමු. අමතරව ශාරීරික පැවැත්ම සඳහා දීමට හැකිවුයේ ද්‍රවමය ආහාර පමණි. යහනෙන් නැගිටීම පවා වෙහෙසකර දෙයක් විණි. එම අවස්ථාවේදී යහන මත සිටම තම දෙනෙතට යොමු වන සේ විශාල බුද්ධ රූපයක් බිත්තිය මත සවි කළෙමි. ඒ දෙස බලා ඔහු යහනේ සිට බුදුන් වැඳීම කල නමුත් එදින සිට යහනේ දිගාවී දෙපා හකුලාගන්නට විය. මා එයට හේතු විමසූ විට මෙසේ කීය. .. ..

"කොපමණ බැරි වුනත් පුතා. .. .. බුදු හාමුදුරුවන් දෙසට කකුල් දික් කරන්න හොඳ නැහේ.. .."

කොතරම් ශාරීරික වශයෙන් දුර්වල වුව ද, ඔහු කථා කළේ මානසික ප්‍රභාෂ්වරයකිනි. අපි තරමක් පසෙකට, ඔහුගේ යහනේ පිහිටීම වෙනස්කර දීමෙන් අනතුරුව නිසි පරිදි යහන් ගත වුණි. ශාරීරික වශයෙන් කොපමණ දුර්වල වුවත්, තමා ගේ දුක සැප බැලීම පිණිස තමා හමුවට පැමිණි සෑමදෙනෙකු සමග ම ඔහු ඉතා සුහදශීලීව කථා බහ කළේය.

උදා වීගෙන එන තත්වය අවදානම් බව අපට අවබෝධ විණි. අවස්ථා කීපයකදීම ගෞරවණීය ස්වාමීන් වහන්සේලා වැඩම කරවා සෙත් පිරිත් වල අනන්ත වු බුදු ගුණ බලයෙන් සියළු ආරක්‍ෂාව සහ මානසික ශක්තිය ලබා දුන්නෙමු. දිනක් වැඩම කරවා වදාළ ගෞරවණීය ස්වාමීන් වහන්සේ නමකට පිරිකර ලෙසින් තමා විසින් රචිත " දඹදිව දීප වන්දනා" නමැති ග්‍රන්ථයේ පිටපතක් බුද්ධාලම්භන ප්‍රීතියෙන් යුතුව පුජා කළේය.

✸ ✸ ✸

බීමට යමක් පමණක් නිතර නිතරම මුවගට ළගා කල යුතු අවධියට පිළිපන්න. අවසානයේදී පූර්ණ කාලීනව තාත්තා ළඟම සිටීම සඳහා පළපුරුදු උපස්ථායකුගේ සේවයද ලබා ගතිමි. තාත්තා වෙනුවෙන් විවිධාකාර වු ද්‍රවමය ආහාර සුදානමින් තැබුණු අතර, ඔහු ගේ රුචිකත්වය අනුව මොහොතින් මොහොත ඉතා සුළු ප්‍රමාණය බැගින් ශරීරගත කළෙමු.

අපි නිතර නිතරම තාත්තාට සමීප වුණෙමු. 2005 ඇසළ මස 18 වන දින සැඳෑ සමයේදීද ද මා සුපුරුදු පරිදි තාත්තා බැලීමට ගියෙමි. එදින සියළුම බීම වර්ග ප්‍රතික්ෂේප කළ ඔහු තේ වතුර ටිකක් පමණක් ඉල්ලා සිටියේය. අප්‍රමාදව එය සැපයු ව ද පානය කළේ තේ හැඳි දෙකක් පමණි.

ඔහු .. .. පුතා යනුවෙන් නැවත මා ඇමතුවේය. අනතුරුව මා වෙත යොමු කළේ අනපේක්ෂිත ප්‍රශ්ණයකි.

"පුතාලා .. .. .. දැන් මාව කොහාටද ? ගෙනියන්නේ."

මා තරමක් ගොළු වුනෙමි. ඔහුගේ ප්‍රඥාව තුලින්ම ඔහුට යමක් දෘෂ්‍යමාන වුවා විය හැකියි.. .. ..



විජයසේන කිරිවත්තුඩුව මහතා ගේ දේහයට සිය දරුවන් අවසන් ගෞරවය දක්වමින්

පුටා අවුරුදු අසූ පහක් ආයු වැළඳීමෙන් අනතුරුව පසු දින අළුයම් කාලයේ, එනම් වර්ෂ දෙදහස් පහක් වූ ඇසල මස දහනම වන දින, අප සදාදර පියාණන් වහන්සේ සදහටම මෙළොවින් සමු ගත්හ. එතුමාණන්ගේ අවසන් කටයුතු බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර වලට අනුව ශ්‍රාමණික චාම්ව හා මහත් වූ ගෞරවයෙන් යුතුව ඇසළ මස 20 වන දින එතුමා දිවි මගෙහි හරි අඩකටත් වඩා ගතකල, දීපංගොඩ දී සිදු කෙරිණි. අප දරුවන් තිදෙනෙකුගේ සදාදර පියාණන් ගේ රූපකාය මේ මොහොතෙහිද අප හා සමගින් දක්නට නැතිද එතුමාණන්ගේ රුව, ගුණ හා ළබැඳි සෙනෙහෙ බර වදන් අප සිත්හි සදානුස්මරණීයයි.

අප; දරුවන් තිදෙනා වූ රංජනී වල්පොල, සරත් කිරිවත්තුඩුව, හා සීතා ගුණතිලක ත්, බෑණනු පුතනුවරු වූ රත්නසේන වල්පොල හා නිමල් ගුණතිලක ත් ලේලි දියණිය වූ චිත්‍රානි එදිරිසිංහත් පළමුවන ගුණානුස්මරණ පිංකමෙහි දී පිය සෙනෙහසින් යුතුව එතුමාණන්ට, **පරම රමණීය අමෘත මහා නිර්වාණ සුවය** පතමු. මුණුබුරු මිණිබිරියන් වූ සදේව ගුණතිලක, ගයත්‍රිකා කිරිවත්තුඩුව, නිරංසා වල්පොල, ක්‍රිෂාන් ගුණතිලක, කුසලි කිරිවත්තුඩුව හා යසස් වල්පොල ත් අප පියගුණ සමරු පිං කමට එක්වෙති.

✸ ✸ ✸

ප්‍රාර්ථනා

මෙම ධර්ම දානයේ ආනිශංසයෙන් අප අතරින් වියෝ වූ .. ..

- ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි - අම්මා
- විජයසේන කිරිවත්තුඩුව - තාත්තා
- දයා සපරමාදු - ලොකු නැන්දා
- අමරා ගුණසේන - පොඩි නැන්දා
- ජයතිස්ස කිරිවත්තුඩුවගේ - බාප්පා
- බී.ඒ.ගුණසේන - මාමා
- සලමන් පෙරේරා හෙට්ටිආරච්චි - මාමා
- චලානෝනා හෙට්ටිආරච්චි - ලොකු අම්මා
- රොසලින් හෙට්ටිආරච්චි - නැන්දා

.. ..**යන සැමට නිවන් සුව පතමි.**

මෙම පොත මුද්‍රණය කිරීමේ දී ඇතැම් කරුණු පැහැදිලි කර ගැනීම සඳහාත් ඡායාරූප සොයා ගැනීම සඳහාත් මට සහාය දුන් **සැමගේ ප්‍රඥාව වැඩෙත්වා** !!!

මෙත් කරුණා මුදිතා පෙරදැරිව, පාඨක ඔබ වෙත පිරිනමනු ලැබූ මෙම "මා පිය ගුණ සමර" ඔබ සැමට අනාගතයේ **චඩාත් දැහැමි වූ ජීවිත පිණිස හේතු වේවා** !!!

ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමෝ

සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා .. ..

(සිදු කර ගනු ලැබූ මෙම පුණ්‍ය කර්මයේ හේතුවෙන්,
නිවන් දක්නා තෙක් අසත්පුරුෂ ඇසුරක් නොවී සත්පුරුෂ සේවනයක්ම වේවා!!!)

By means of all these meritorious deeds;
May I never join with the foolish,
May I always join with the wise,
Until the time I attain to Nibbana

සාධු ! සාධු !! සාධු !!!

[redacted] වන සියවසේ මැද භාගයේ දී, උතුරු පළාතේ වව්නියාව දිස්ත්‍රික්කයෙහි උපත ලද කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක, **1972** දී අම්පාර දිස්ත්‍රික්කයේ රජයේ පාසලක ඉංග්‍රීසි ආචාර්ය වරියක ලෙසින් වෘත්තීමය ක්ෂේත්‍රයට පිවිසියා ය. දිවයිනේ විවිධ දිස්ත්‍රික්කයන්හි ආදර්ශමත් ගුරු මාතාවක් ලෙසින් සේවය කරමින්, විනය ගරුක සිසු පරපුරක් ශ්‍රී ලංකාවට දායාද කල ඇය, කොල්ලුපිටිය මහානාම මහා විද්‍යාලය සහ කොළඹ, ඩී. එස්. සේනානායක විද්‍යාලය යන විදුහල්හි දීර්ඝ කාලීන සේවයකින් පසු, වසර විසි පහක සේවා කාලයක් නිම කොට **1996** දී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබුවා ය.

ඇය, කීර්තිමත් විදුහල්පති වරයෙකු වශයෙන් පුරා වසර තිස් පහක්, දැයේ දූ දරුවන් වෙනුවෙන් අමරණීය සේවයක් කල විජයසේන කිරිවත්තුඩුව මහත්මා ගේ සහ විදුහල්පතිනි ලෝරා හෙට්ටිආරච්චි මැතිණියගේ කණිටු දියණියයි.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සැලසුම් ශිල්පී නිමල් ගුණතිලක මහතා සමඟ **1976** දී විවාහ වූ ඇය, පුතුන් දෙදෙනෙකුගේ ආදරණීය මවකි.

ඇය, විශ්‍රාම ලැබීමෙන් අනතුරුව ද ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්ය වරියක ලෙසින් නිහඬ මෙහෙවරක යෙදෙමින්, **1998** දී ස්වේච්ඡා සංවිධානයක් ලෙසින් කැනඩාවේ ස්ථාපිත කරන ලද, අන්තර්ජාතික ශිෂ්‍යත්ව පදනමක් වූ ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් ධූරය ද හොබවන්නීය.

තම ශ්‍රේෂ්ඨ පියාණන්ගේ ජීවිත දත්ත, ක්‍රියාකලාපයන් සහ දර්ශනයන් සියල්ල කැටිකර, විජයසේන කිරිවත්තුඩුව චරිතාපදානය, "මා පිය ගුණ සමර තුලින් සමාජයට තිළිණ කිරීමට ඇය විසින් ගනු ලැබූ මෙම ප්‍රයත්නය අනාගත පරපුරටම ආදර්ශයක් වනු නොඅනුමානයි.

ඇයගේ මෙම ශ්‍රේෂ්ඨ වෑයම මා ඉතා අගය කරන අතර, එය වත්මන් සමාජයට ඉතාම කාලෝචිත වූ වටිනා තිළිණයක් සේ මම දකිමි.

"බ්‍රහ්මානි මාතා පිතරෝ - පුබ්බා චරියා'ති වුච්චරෙ"

(දෙමාපියෝ මහා බ්‍රහ්මයාට සමාන කොට ඇත්තෝය - ඔවුහු පූර්ව ආචාරීන් ද වන්නෝමය)

බී. එන්. ජිනසේන

ලේකම්

ආගමික කටයුතු අමාත්‍යංශය.

මුද්‍රණය: හර්ෂණ ප්‍රින්ටර්ස්